වසර 2500 පසු
මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.

# සත්‍ය ධර්මය අවදි විය

(පස්වන වෙළුම)

# අභිඥා ඥානයට හසුවන පරම සත්‍යය - 01

සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලුම ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළකිරීම් සපුරා තහනම් ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරේ.

**අභිඥා ඥානයට හසුවන පරම සත්‍යය - 01**

බුද්ධොත්පාදෝ ධර්ම දේශනා ශ්‍රවණයට
https://youtube.com/channel/ucwms400m8EsZc9foKtEajg

අන්තර්ජාල ශ්‍රවණයට - website
buddhothpado.com

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය - 2022 දෙසැම්බර්

ධර්ම ග්‍රන්ථය පිළිබඳ
විමසීම් Email: thanujafernando1975@gmail.com
Tel 0777 959235

පරිගණක මුද්‍රණ සැකසුම **වාක්‍යා රූ**
අංක 42/8, මකුළුදූව, පිළියන්දල.
දුරකථනය 011 2 708377

මුද්‍රණය **K.S.U. ග්‍රැෆික් (පුද්) සමාගම**
අංක 510, රාජගිරිය පාර, රාජගිරිය
දුරකථන 011 2884701

# පෙරවදන

මෙය ඇසෙන ඔබ මහා භාග්‍යවන්තයි. ඔබ කොහේද යන්නේ,
මුලාව රැවටීම හරි භයානකයි. සත්‍ය කුමක්ද? ඔබ සංසාර චක්‍රයක
අතරමං වෙලා. විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකෙන්, සැපේ දුකේ
දෝලනය වන මේ ජීවිතය හරි භයානකයි. ඔබ සත්‍ය දන්නේ නෑ.
ඒ සත්‍ය ඔබ අවබෝධ කළ යුතුයි. ඔබ සංසාර දුකින් මිදෙන කතාවයි මේ.

මෙම දේශන මාලාව මඟින් ඔබට සත්‍ය ධර්මය අවබෝධය සඳහා
යම්කිසි උපකාරයක් ලැබෙනවා. සියලු දුකින් මිදෙන තැන හමුවන
ඒ 'සදාතනික සුවය' මෙම දේශන මාලාව මගින් අත්දකින්නට
ඔබට ද හැකියාව ලැබේ.බාහිර ඇත්ත කරගෙන සිටින තාක් ඔබ
ඉන්නේ මිත්‍යාදෘෂ්ටියේමයි. ඒතාක් ඔබට දුක උරුමයි. සිතද මායාවක්
වන තැන සිතේ මායාවෙන් මිදුනු තැන,
බාහිර ඇත්තක් නොවන තැන
සිතද සත්‍යයක් නොවන තැන
ඒ සිතෙන් මිදෙන තැන
ඒ බාහිර ඇත්තක් නොවන තැන
'අජ්ජත්ථ භහිද්ධා' කියන තැන
අන්ත දෙකම මිදුන තැන, එනම්,

ධර්මය තුළ සඳහන් වන නාම, රූප අන්ත 2න් මිදීමයි නිවන් මග වන්නේ.
මෙලොව උපදින සියලු සත්ත්වයෝ නිවනින්මයි සැනසීම ලබන්නේ.
ධර්මය නම් ධර්මතාවයයි. ඒ පටිච්චසමුප්පාද ධර්මයයි. එනම්
ඉදප්පච්චතාවයයි. එනම් දෙයක් නැති බවයි. දෙයක් නැති බව
බුද්ධ ස්භාවයයි. දෙයක් නැති තැන චෙතෝවිමුක්තියයි. එනම්

අනිමිත්ත, ශූන්‍යත, අප්පනිත චේතොවිමුක්තියයි. ඒ බුද්ධ ස්වභාවයයි. මේ දහම අවබෝධ වේ නම් ඔබ අප සියලු දෙනාම ඒ බුද්ධ ස්වභාවටයි අවදි වෙන්නේ. ඒ බුද්ධ යනු ශූන්‍යතාවයි.

“නිස්සත්වෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ”

පහන නිවීගිය පසු ගිය තැනක් කොහින්ද? ඒ නිවීමමයි නිවන.
ඒ කෙලෙස් ගින්නේ නිවීයාමයි. ඒ සසර ඕඝයේ නිමාවයි.
ඒ විඤ්ඤාන නිරෝධයට ගිය තැන සියලු දුකෙන් මිදීමයි.

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පහං
එත්ථ ආපෝච පඨවි ච - තේජෝ වායෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජති
විඤ්ඤාස්ස නිරෝධෙන - එත්තෙ තං උපරුජ්ජන්ති

සිතෙන් මිදෙන මඟ
නිවන් දකින මඟ
දුකින් මිදෙන මඟ
එයයි නිස්සරණ මඟ

නිවැරදි නිවන් මඟ ඔබටත් හමුවේවි. ධර්මය සොයන්නාට බුදුන් හමු වේ. බුද්ධ යනු සොබාදහමයි. ප්‍රායෝගික පුහුණු විය යුතු ආකාරය හඳුනාගෙන අවබෝධ කළ යුතු ධර්මයකි.

**බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ**

# හැඳින්වීම

මේ ගෞතම බුද්ධ ශාසනය තුළ අපි හැමදෙනාටම අවශ්‍ය වන්නේ නිවීමක්, සැනසීමක්, දුකින් මිදීමක්. නිරන්තර පවත්නා රාග, ද්වේශ, මෝහ. නිවා ගැනීමයි නිවන කියන්නේ. කිසාගෝතමී, පටාචාරා, අම්බපාලි වැනි බොහෝ පිරිස් බුදුරජාණන් වහන්සේ අභියස ඒ ගිනි නිවා සදාකාලික සැනසීම ලැබුවා.

අද බෞද්ධ සමාජයට මේ නිවීම සැනසීම අහිමි වෙලා බොහෝ පිරිස් නොයෙකුත් රාමුවලට සිරවී, ග්‍රන්ථ ධූරයට පමණක් සීමාවෙලා සිටින්නෙ. ඒ තුළින් සත්‍ය දැකීම අපහසුයි. විදර්ශනා ධූරය සමාජයෙන් ඈත් වී ඇති මෙවන් යුගයක නැවතත් ඒ ගිලිහී ගිය බුද්ධ දර්ශනය, විදර්ශනා ධූරය තුළින් ම ඉස්මතු වෙනව. ඒ අති ගම්භීර, නිර්මල, පරම සත්‍යය අපට අහන්න ලැබෙනවා. මේ නිවැරදි බුද්ධ දර්ශනය පෙර නොඇසූ විරූ දහම, ධම්ම චක්ඛුෂය අපි අවබෝධ කරගත යුතු වෙනව. මේ සත්‍ය දර්ශනය බාහිරින් හමුවන දෙයක් නොවේ. බාහිර ඇත්ත වූ තැන පවතින්නෙ ආත්මීය ස්වභාවයක්.

මේ අනාත්ම ධර්මය උතුම් බුද්ධ දර්ශනය 'බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ මාලාව' තුළින් ඔබට කියවන්න ලැබෙනව. එය හොඳින් කියවන්න. ධාරණය කරගන්න. ඔබට සත්‍ය අවබෝධයට මෙය උපකාරී වේවි. මේ අප ගන්නා උත්සාහයේ එක් අවස්ථාවක් පමණි.

**අප කල්‍යාණ මිත්‍ර මෙහෙණින් වහන්සේ**

## පුණ්‍යානුමෝදනාව

මේ උතුම් ධර්ම දානයට

දායක වූ සියලු දනන් හට,

මෙතුළින් ජනිත වන්නා වූ පුණ්‍ය ශක්තිය,

බුද්ධෝත්පාදයෙන් විවර වූ උතුම්

ශ්‍රී සද්ධර්මය කන්වැකීමටත්, අවබෝධ වීමටත්

සංසාර දුකින් මිදී

නිවනින් සැනසීම ලබන්නටත් හේතු වේවා !

# පිදුම



කාලයේ වැලි තලාවෙන් සැඟව ගිය
ඒ උතුම් ශ්‍රී සද්ධර්මය
අතැඹුලක් කොට,
අවිද්‍යා ලොවම දෙදරවමින්
සත්‍යයේ දෝංකාරය තුළ
ආත්මය හැර දමා
සසර පුරුද්දට ආ ගමනේ අවසන
මරණයක් නැති ලෝකයට
මොහොතට අවදියෙන්
සිතෙන් මිදෙමින්
නිස්සරණ මග ඇවිද යන්නට
මං විවර කළ
බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේට
උපහාරයක්ම වේවා !

# පටුන


01 දැනුම අභිබවා ගිය අභිඤ්ඤා ඥානය 90 11

02 අභිඤ්ඤා ඥානයට හසුවන පරම සත්‍යය 91 37

03 මනෝ විද්‍යාව අභිබවා යන අභිඥා ඥානය 92 51

04 වෛද්‍ය විද්‍යාව අභිබවා යන අභිඥා ඥානය 93 69

01

# දැනුම අභිබවා ගිය අභිශ්‍රද්ධා ශ්‍රද්ධානය 90

**උපාසිකාව:** ආර්යයන් වහන්ස, මට භාවනා experience එකක් ගැන ඔබ වහන්සේගෙන් දැනගන්න මට කතා කරන්න පුළුවන්ද මේ වෙලාවෙ?

**ආර්යයන් වහන්ස:** ඔව්. ඔබතුමිය කොයි පළාතේද?

**උපාසිකාව:** කොළඹ 5 නාරාහේන්පිට.

**ආර්යයන් වහන්ස:** හොඳයි වයස කීයද?

**උපාසිකාව:** වයස හත්තෑ තුනයි.

**ආර්යයන් වහන්ස:** හොඳයි, බුද්ධෝත්පාද දේශනා අහන්න අරන් කොච්චර කල්ද?

**උපාසිකාව:** දැන් මාස 5ක් විතර ඇති ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්ස:** හොඳයි, ඉතිං ගොඩක් අහල නේ. ඇයි මේ භාවනා එක්ස්පීරියන්ස් එකක් ගැන අහන්නේ?

**උපාසිකාව:** නෑ. භාවනාම නෙවෙයි. ඔබ වහන්සේගෙන් මට ආපු එක්ස්පීරියන්ස් එක කියලා ඒ හරි මාර්ගයද යන්නේ කියලා දැනගන්න.

**ආර්යයන් වහන්ස:** හා කියන්න.

**උපාසිකාව:** ඉස්සර මට තේරුන් නෑ ඒවා. ඊට පස්සෙ මම හොඳට බැලුවා. දැන් මේ එළියෙ මොනවද තියෙන්නෙ කොහොමද ඒක ඇතුළෙ වෙන්නෙ කියලා. ඊට පස්සේ මෙහෙම කාලයක් කරන කොට, බල බල

ඉන්න කොට මට තේරුණා මේ දැන් හැමදේම අරමුණක් කියන්නේ සිතක් ඇති වෙන එක කියලා. ඒ කියන්නේ හැම එකම සිතුවිල්ලක් කියන එක මට තේරුණා. ඊට පස්සේ මට තේරුණා කියන්නේ ඇතුළෙන් හොඳටම පැහැදිලි වුණා. එතකොට මම ගොඩක් සන්තෝසෙන් ඊට පස්සේ මම එළියේ ඔහොම බලාගෙන ඉන්න කොට මට මේ දැන් එළියේ පේනවා, නමුත් ඇනලයිස් වෙන්නෑ මොකුත්. එතකොට මම තවදුරටත් ඒක ටිකක් බලනකොට මේ පැත්තෙ කවුරුත් නෑ. බලන පැත්තෙ කවුරුත් නැහැ. නමුත් මට බලන දේ identify වෙන්නේ නෑ. දැනීමක් පේනවා. ඉතිං ඊට පස්සේ මම දැන් එහෙම අහ අහා හිටියා. ඊට පස්සේ මට දැන් මම ඕක ගැන නිතර හිත හිත ඉන්න කොට මට කියන්නේ බලනකොට මට තේරුණා දැන් මේ හැම එකම සිතක් බවත් වස්තුවක් කියලා දෙයක් නෑ, එළියෙ දේකුත් නෑ. මේක සිතුවිල්ලක්ම පමණයි කියන එක. අනිත් එක මට පේන්න ගත්තා මේ ඕනම දෙයක් දකිනකොට සිතක් කියන එක මට හැමතිස්සෙම වැටහුණා. එතකොට මං ඒ සිත දැන් නැති වෙනවා තවත් දෙයක් දිහා බලන කොට. තව දෙයක් දිහා බලනකොට ඒකත් නැති වෙනවා. එහෙම එහෙම මට ඒක නැති වෙනවා ආයෙ තව දෙයක් ඇති වෙනවා. ඒ වගේ හැඟුණා. එතකොට මට දැන් ඉන් එහාට මං කොහොමද ඒක හරිද කොහොමද කියල ඔබ වහන්සේගෙන් දැනගන්ඩ තමයි අහන්නේ.

**ආර්යයන් වහන්සේ:** අන්තිමට කියපු ටික ටිකක් වේගෙ වැඩියි. ආයෙමත් කියන්න බලන්න. නැති වෙනවා කිව්වම ප්‍රායෝගිකව ඒක දකින විදිහ පොඩ්ඩක් කියන්න.

**උපාසිකාව:** මම අර එළියෙ බලාගෙන ඉන්න කොට පේන දේ ද ස්වාමීන් වහන්ස, එළියෙ බලාගෙන ඉන්න කොට දැන් වුණාත් එළියෙ බලාගෙන ඉන්න කොට different mode එකට යනවා. හිත නෙවෙයි, එතකොට මට එළියෙ දේවල් මෙහෙම පේනවා, නමුත් ඒවා Identify කරන්නේ නෑ. එතකොට මම බැලුවා මේ පැත්තේ කොහොමද මගේ පැත්ත කියලා. ඒ පැත්තෙ කවුරුත් රොකෝඩ් වෙන්නෙත් නෑ. ඒ කියන්නෙ නිකං පෙනීමක් තියෙනවා. අර ගොඩක් සමථය කරහම, නිකන් බැලුවම පේනවා මොකුත් නෑ වගේ එහෙම. හැබැයි මේක සමථයක් නෙමෙයි. මේක මේ මයින්ඩ් එක නෙමෙයි. මේක වෙනත් mode එකක් කියන්න පුළුවන්. වෙන තත්ත්වයක්. ඒක මේ මට ඔහේ දැන් වුණාත්

එහෙම බලාගෙන ඉන්න පුළුවන්. එතකොට බලන කෙනා මම නෑ. එළියෙ දේවලුත් ඇනලයිස් වෙන්නේ නෑ. නිකං බලපුහාම පෙනීමක් තියෙනවා එතන. එහෙම ඉන්න කොට යන්න පුළුවන් ඕන නං සමාධියකට වැඩිය හොඳට හිත නිවිලා යනවා. ඊට පස්සේ තමයි මං අර සිත යොමු කරන කොට දැන් මම හිතනවා, any object මම ඒක බලපුහාම මම හිතනවා, මේ සිතක්, මේ සිතක් කියලා මට ඒක තේරෙනවා දැන්. ඒ සිත දැන් ඒක ඊළඟ දේ බලනකොට ඒ සිත ගිහින් දැන් තව සිතක්. එහෙම එහෙම මං ඒක ටිකක් practice කරන කොට මට තේරුණා මෙහෙම සිතක් ඇති වෙනවා ඒක නැති වෙනවා. තව මොහොතකින් තව එකක් ඇති වෙනවා, නැති වෙනවා. එහෙම එහෙම ගතියක් තේරුණා මට. ඒ ඔස්සේ යන එක හරිද කියල ඔබ වහන්සේගෙන් අහන්න තමයි.

**ආර්යයන් වහන්සේ:** ඔතන දැන් පොඩි ප්‍රශ්නයක් තියෙනවා. ඔබතුමිය නිවන් මඟ හඳුනනවද කියන ප්‍රශ්නය තියෙනවා. ඒ ගැන මොකද හිතෙන්නේ?

**උපාසිකාව:** නිවන් මඟ, දැන් ඔබ වහන්සේගේ දේශනාවල හැටියට, මම  වැඩිය තියරි දන්නෙ නෑ, මම හිතන්නේ නිවන් මග කියන්නේ කෙලෙස් නැති කරමින් යන්න ඕනේ ගමනක් කියලා මට තේරෙනවා. අනිත් එක මේ සිත සිතුවිල්ලක් කියලා, ඒක දැක්කහම මම, මට ඊට පස්සේ නිකං අර ආසා දේවල් ටිකක් මොට වෙලා. ඒක නිකං "මේක ඉතිං සිතුවිල්ලක්නෙ මේක යනවා" එහෙම කියලා ඒක නිතර තේරිලා. ඒක ගැන ටිකක් ආසාවක් එච්චරම ලොකු ආසාවක් තේරෙන්නේ නෑ ඒකට අර ඉස්සර වගේ. එහෙමත් තත්වෙකුත් තේරුණා.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමිය මාස කීයක් දේශනා ඇහුවද? මාස පහක් ඇහුවා කිව්වා නේද?

**උපාසිකාව:** මාස පහයි. ඊට ඉස්සර මම වෙන වෙන ස්වාමීන් වහන්සේලාගෙන් ඒවා ගොඩක් අහල තියෙනවා. ඒ උනාට මට එහෙම පැහැදිලි දෙයක් ලැබුන් නෑ. ඒ කියන්නේ ප්‍රායෝගිකව කරන හැටි.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමිය දැන් පුබ්බේනිවාසානුස්සති ඥානය ගැන ඔබතුමියට වැටහීමක් තියෙනවද?

**උපාසිකාව:** ඒක නම් තේරෙන්නේ නෑ. එහෙම forms කියන්න මට තේරෙන්නෙ නෑ.

**ආර්යයන් වහන්සේ:** අපි මෙහෙම ගමු. හොඳයි බාහිර ඇත්තක් වගේ දැනෙනවාද?

**උපාසිකාව :** බාහිර ඇත්තක් වගේ දැනෙන්නේ නෑ. බාහිර දකින එක හිත කියලා තමයි මට දැන් හැම තිස්සෙම වැටහෙන්නේ.

**ආර්යයන් වහන්සේ:** අපි හිතන දේවල් බාහිර නෑ කියලා දැනෙනවද?

**උපාසිකාව:** දැනෙනවා බාහිර දෙයක් නෙමෙයි මේක හිතෙන් හිතන්නේ. ඒක නම් හොඳටම දැනෙනවා. දැන් දැකපු ගමන්ම ආ මේ හිතක් මේ හිතක් බඩුවක් කියලා නෙමෙයි දැන් එක තේරෙන්නේ. ඒක හිතක් කියල විතරයි තේරෙන්නෙ.

**ආර්යයන් වහන්සේ:** හොඳයි එතකොට මේක සිත බව වැටහෙනවා නේද?

**උපාසිකාව:** එහෙමයි එහෙමයි ස්වාමීන් වහන්සේ.

**ආර්යයන් වහන්සේ:** මේක තමයි ඇත්ත කතාව නේද? එතකොට සිතුවිලි අපි ඇසුරු කරන්නේ නේ? බාහිර කියන එකක් නෙමෙයි.

**උපාසිකාව:** ඔව් හිතින්ම හදාගෙන. ඇත්තටම ඊට පස්සේ මට ඒක තේරුණාම මම හිතුව මේ මුලු ජීවිතයක් සිතුවිලි පස්සේ පන්නල පන්නල පිස්සුද අපිට කියලා. මේ වගේ නිකං හරිම විකාරයක් කරලා තියෙන්නේ කියලා හිතුණා. තේරිච්ච දවසේ, නිකන් හිතුවිල්ලක් පස්සේ දුවන එකම තමා හැම තිස්සෙම කරලා තියෙන්නෙ කියලා.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමිය මාස පහට දේශනා කීයක් විතර ඇහුවද?

**උපාසිකාව:** දේශනා නම් අහලා තියෙනවා මං හිතන්නේ. සැරෙන් සැරේට අහල තියෙනවා. ඔක්කොම ගත්තොත් නං විස්සක් තිහක් වගේ අහල තියෙනවා සෑහෙන්න.

**ආර්යයන් වහන්සේ:** එක මාසෙකට කීයක් ඇහුවද?

**උපාසිකාව:** මුලදී නම් ගොඩක් ඇහුවා, මුලදී මං හිතන්නේ මාසෙකට දහයක් වගේ avarage දහයක් නෙමෙයි ඉතින්.

**ආර්යයන් වහන්සේ:** සාමාන්‍යයෙන් හැම දවසකම වගේ ඇහුවද? ටිකක් මග ඇර ඇර වගේ ද ඇහුණේ.

**උපාසිකාව:** මග ඇරුණා. එක එක ලෙඩ, මට කෝවිඩ් හැදුණා දෙසැරයක්. ඒ වගේ මග ඇරී ඇරී තමයි ඉතින් ඇහුවේ.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමිය වෘත්තියෙන් මොනාද කරන්නේ?

**උපාසිකාව:** ඔබතුමී ගාව තියෙනවා, ඒක තමයි ඒ, ඔබතුමිය කියපු දේවල් වල අපිට කියන්න ඇත්තටම ගළපලා දෙන්නයි ඕනෙකම තියෙන්නෙ. බොහොම හොඳයි ඔබතුමිය. කියපු විදිහ ටිකක් වෙනස්. කවුරුත් එහෙම, හැමෝම ඔයිට වැඩිය ටිකක් වෙනස් විදිහට කියන්නේ. ඔබතුමියටම ආවේණික විදිහකට ඔබතුමිය පැහැදිලි කරා යමක්. ඔබතුමියට දැනුණා නම් පේන දේට දැනෙන දේට එහා ගිය අවිදිමත් ස්වභාවයක් මතුවෙන බව. හැබැයි ඔබතුමියට ඒක දේශනා වලිනුත් ඇහුණා නේද?

**උපාසිකාව:** දේශනා වලින් ඇහුණා, ඒ උනාට දේශනාවලින් ඇහෙන එක අර අත්දැක්කහම තමයි මට මේක මේකමයි කියල තේරුණේ. දේශනාවලින් කියන එක.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමිය එතකොට කැම්පස් එකේ ලෙක්චර්ස් දෙනවා කිව්වා නේ? ඔබතුමියගේ විෂය මොකක්ද එතකොට?

**උපාසිකාව:** microbiology

**ආර්යයන් වහන්සේ:** microbiology, වයස කීයද ඔබතුමියගේ?

**උපාසිකාව:** මට හැත්තෑ තුනයි, මම retired උනාහම බණ අහන්න පටන් ගත්තා. බණ අහන්න පටන් අරගෙන ගොඩක් ස්වාමීන් වහන්සේලාගේ බණ අහගෙන අහගෙන ගියා. ඒ උනාට මට මුකුත් අල්ල

ගන්න බැරි උනා. පස්සේ මේ ඔබ වහන්සේගේ අර ප්‍රායෝගිකව එහෙම කියනවා නේ, එතකොට ඒක දිහා බලන්න පුළුවන්. ඒක හරිම useful වුණා.

**ආර්යයන් වහන්සේ:** ඔව් useful. ඒ කියන්නේ ඇත්තටම වෙනස්ම කතාවක් නේ? ඒ ගැන ප්‍රායෝගිකව අත්දකිනවනනේ අපි, ඔබතුමිය අත්දකින දේ හරි, අපිට ඇත්තටම අපි වෙන කෙනෙකුට නම් මේකට ගොඩක් දේවල් කියලා ඉවරයි. නමුත් ඔබතුමියට කිසි දෙයක් කියාගන්න බෑ, මේකට හේතුව, ඇත්තටම එක පැත්තකින් දන්නේ නෑ ඔබතුමියගේ අභ්‍යන්තරයෙන් මේ අවබෝධය තියෙනවද කියලා. ඒක නිසා තමයි ප්‍රශ්න ටිකක් අහන්න ගත්තෙ. ඇත්තටම ඔබතුමියගේ විෂය සම්බන්ධයෙන් පැත්තකින් තිබ්බොත් ප්‍රායෝගිකව ඔබතුමිය මේක අත්දකිනවා.

**උපාසිකාව:** මට දැන් ඒක ඇහුවට එච්චර තේරෙන්නේ.

**ආර්යයන් වහන්සේ:** එතකොට ඔබතුමිය practical Buddhism කියන එක හඳුනා ගත්තා, මේකෙ practically මේක ප්‍රායෝගිකයි, මේක ප්‍රත්‍යක්ෂ ධර්මයක්, මේක සාන්දිට්ඨික ධර්මයක්, මේක තමයි සැබෑම බුද්ධ වචනය, මේක තමයි සැබෑම බුදුන් වහන්සේ ලෝකෙට එළි කරේ කියන එක දැනෙන්න ගත්තා.

**උපාසිකාව:** එහෙමයි දැන් ඔබ වහන්සේ ඒක කියන විදිහට ඒක මටත් උනහම ඒක ඇත්තටම එතකොට තමයි මටත් පැහැදිලි උනේ. මට අද්දකින්න ඉස්සරලා ඒක එච්චර පැහැදිලි නෑ එළිය නෙමේ ඇතුළෙ කිව්වට.

**ආර්යයන් වහන්සේ:** එතකොට ඒක පොඩ්ඩක් ඒක නිකම්ම automatically systematically අභ්‍යන්තරයට බැලෙනවා නේද මේක ඇත්තද කියල මෙනෙහි වෙනවා නේද?

**උපාසිකාව:** මේක ඇත්තද කියලා බැලුවත් ඒත් ගොඩක් කල් ටිකක් ගියා. ඒක මට එහෙම එකපාරටම තේරුණේ නෑ.

**ආර්යයන් වහන්සේ:** ඔව්. එකපාරට විශ්වාස කරන්න බැහැ. විශ්වාස කරන්න බෑනේ ප්‍රත්‍යක්ෂ වෙන්න ඕන නේ.

**උපාසිකාව:** එක දවසක හදිසියේ තමයි ඒව එන්නෙ.

**ආර්යයන් වහන්සේ:** එන්ලයිට්මන්ට් එකක් ආවා නේද?

**උපාසිකාව:** අන්න එතකොට මට තේරුණා ඇත්ත මේ මේ සිතුවිල්ලක්ම තමයි හැමතිස්සෙම.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමිය කියන්නෑ අපි ඉතින් ඵල ගැන කියන්නේ නෑ නේ. ඔබතුමියට දැනුණා මේ සෝතාපාන්න පැත්තට හැරිලා තමයි enlightenment එක ආවේ කියලා දැනුණා නේ.

**උපාසිකාව:** මට හිතුණා හරි ගමන කියලා. මොකද දැන් මට අර ආසාවලුත් ටිකක් හරි ආසයි පැළ වවන්න. දැන් මට එච්චර පැළ වලට වතුර දානවා විතරයි. මම ඒකෙන් නිකම්ම ඈත්වුණා.

**ආර්යයන් වහන්සේ:** පරිවර්තනයක් ඇතුළාන්තයෙන් සිද්ධ වෙලා තියෙන බව පෙනුණ නේද දැනුණා නේ.

**උපාසිකාව:** ඔව්. ඒක තමා ඒක දැනුණා.

**ආර්යයන් වහන්සේ:** සාන්දිට්ඨිකයි. ඇත්තටම ඒක තමයි ඇත්තටම වෙන්නත් ඕනේ. අපි කියන්නේ දැනුමට ගන්න එපා. පාඩම් කරන්න යන්න එපා. අභ්‍යන්තරයට ප්‍රත්‍යක්ෂ වෙන ධර්මයක් තමන්ගේ සසර ගමනයි මේ ඕඝය සසර ඕඝයේ නිමාව. මේ අන්තිම ආත්මභවය. මේක නැවත ලෝකය ඒ කියන්නේ අපි මේ දෘෂ්ටිය තුළ ඇත්තටම ඇමරිකාවේ අපි ගත්තොත් එහෙම ඕස්ට්‍රේලියාවල අපිට කතා කරන සමහර අය කියනවා. ඒ මිනිස්සුන්ට මේ බාහිර ඇත්තක් නෙමෙයි කියන එක ඇත්තටම ඒ මිනිස්සු හිතලවත් නෑ කියලා. ඒ මිනිස්සු හිතලවත් නෑ හිතන්න තේරෙන්නෑ. ඇත්තටම මේක ඇහුණ ගමන්ම අර නිකං ෂොක් එකක් වැදුණා වගේ ඇත්තටම බාහිර නෙමේ මේ ඔක්කොම සිතුවිලි කියලා දැනෙන්නත් ගන්නවා පළවෙනි එක. ඒක ඇහෙනකොටම ඒක නිකං ෂොක් එකක් වගේ වෙනවා.

ඒ කියන්නේ දැන් ඇමරිකාවෙ ඉන්න සුදු ජාතිකයන් ගැන අපි මේ කතා කරන්නේ. දැන් ඔස්ට්‍රේලියාවෙත් ඉන්නවා කිසිම ආගමක් එහෙම නැති අය ඉන්නවා. ඒගොල්ලො කියන්නෙ වැරදි කරන්නෙ නෑ. අපි ගාව

එමෙ පව් කරන්නෙත් නෑ. අපිට ආගම ඕන්නෑ. අපි මෙහෙම ඉන්නවා. නමුත් ඒ අයට පවා ෂොක් එකක් එනවා අපි මේ ඉන්නේ ලෝකෙ ඇත්තක් නෙමෙයි කියලා දකින කොට. එතකොට එහෙම ඉඳලත් හරියන්නෙ නැති බව ඒ අයට දැනෙන්න ගන්නවා. නෑ මේකෙ සත්‍ය එහෙනම් මොකක්ද දන්නෑ කියලා අහන්න හිතෙනවා. ඔතන තමයි ෂොක් වෙන තැන. ඒක මුළු ලෝකෙටම අභියෝගයක් වෙනවා.

**උපාසිකාව:** ඒක ඒ ස්වාමීන් වහන්සේ හරියට හොඳට බලන්න තේරුම් කරනවා. මටත් ඒක කියන්න තේරෙන්නෙනෑ. මටත් ටිකක් කල් ගියා. එකක් අහල නිකං ඔය බල බල වගේ හිටියා. ඉඳලා එකපාරටම මට තේරුණා. දැන් නම් හැම බඩුවම මට සිත. හැම දෙයක්ම එන එන එක සිත ද්වාර පහෙන් එන හැම එකක්ම සිත.

**ආර්යයන් වහන්සේ:** දැන් ඔන්න බලන්න ඔබතුමී දන්නවා ළමයින්ට උගන්වන නිසාම. ඇත්තටම අපි මේ ශබ්දයක් නෙ මේ. අම්මා කිව්වත්, ශබ්දයක්, තාත්තා කිව්වත් ශබ්දයක්, පොත කිව්වත් ශබ්දයක්, අඹගහ කිව්වත් ශබ්දයක්, එහෙම නම් සුදු ජාතිකයෝ තව ශබ්ද දාන්න බෑනේ. එහෙනම් චීන ජාතිකයෝ වෙන ශබ්ද දාන්නත් බෑනෙ. එහෙමනම් ඒ ශබ්දවල තේරුමක් තියෙන්න බෑනේ. එහෙම නම් තේරුමක් නැති වෙන්න ඕන නෙ. එතකොට එක එක ශබ්ද කියන්න බෑනෙ. එහෙම නම් ඒක මොකක්හරි දෙයක් කියා ගන්න බෑ නේ. එහෙමනම් මේක ඔය කියන එක වචනයක්වත් ඇත්ත වෙන්නෑ නේ. එතකොට අපි මේ කතා කරන, උගන්වන, කියන සේරම භාෂාව බොරු වෙනවා නේ.

**උපාසිකාව:** එහෙමයි. හැබැයි අපි කොච්චර මුලාවක්ද කරගෙන තියෙන්නෙ කියන එක තමයි දැනෙන්නෙ.

**ආර්යයන් වහන්සේ:** නාසා ආයතනය තමන්ගේ විඥානයේ තියන එක එළියේ මේ දුරේක්ෂයෙන් කියලා බැලුවට එළියෙ එක නෙවෙයි තමන්ගේ විඥානය තමයි මේ දකින්නේ කියන එක. ඒ කියන්නේ නාසා ආයතනයේ කොච්චර දුරේක්ෂ හැදුවත් මේක බලන්නේ මිනිස්සු නේ. මේ මනුස්සයාට තියෙන පංචායතන ටික අර වර්ණ හරියට රතු තිබුණෙ නැත්නම් රතු නෑ තමයි. ඔය වගේ දෙයක් තමයි වෙන්නේ. ඇත්තටම මහා පුදුමාකාර සත්‍යයක් වෙනවා නේද මේ හෙළි කරන එක.

**උපාසිකාවඃ** පුදුමයක් ඒකනං. ලෝකෙ අනිත් පැත්ත කැරකිලා දැන් තියෙන්නේ. ඒ තරමටම මේක පුදුමයක්.

**ආර්යයන් වහන්සේඃ** ඔබතුමිය මොන කැම්පස් එකේ ද?

**උපාසිකාවඃ** මම කැලණිය කැම්පස් එකේ හිටියෙ.

**ආර්යයන් වහන්සේඃ** කැලණිය කැම්පස් එකේ තමා ඔය විෂය තියෙන්නෙ. හැම එකේම ඔය විෂය නෑ microbiology. අපි දැක්කා අර එංගලන්තෙ කාන්තාවක් microbiology තමයි නේද මේ කාන්තාව අර ඒක සෛලික අර පරීක්ෂණ කරන්නේ පාසිවල එහෙම පර්යේෂණ කරන්නේ microbiology නේ ඒ විෂයට අදාළව.

**උපාසිකාවඃ** ඔව් ඔව් ඒක සෛලික. අර හාමුදුරුවෝ සමන්තභද්‍ර හාමුදුරුවො එහෙම මගේ student කෙනෙක් microbiology නෙ කෙරේ.

**ආර්යයන් වහන්සේඃ** ඒ කියන්නේ ඇත්තටම අපිට විෂයයක් කියලා දෙයක් නෑ. හැමදේකම අපි බලන්නේ මොකද්ද මේ කියන්නේ කියලා. ඇත්තටම බුද්ධ විෂය වගේ තමයි බුද්ධ විෂයට ලෝක විෂය සියල්ලම එකයි. අවබෝධයක් ඇත්තටම මේ අභ්‍යන්තරයෙන් මේ සත්‍ය දකිනවා කියන්නෙ මුළු ලෝකෙම අවබෝධ වෙනවා. මේ අපි ලෝක සංඥා කියන්නේ ඔක්කොම මේ බලනකොට විඤ්ඤාණ මායාවෙන් හදා ගත්ත ශබ්ද වර්ණ දෙකක එකතුවකින් හැදුණු එකක් කොහෙවත් නැති බව ඒ අවබෝධය ඇති වෙනවා නම් මහා විශාල පෙරළියක්.

**උපාසිකාවඃ** පෙරළියක් කියන්නෙ ඒක නම් ලොකුම පෙරළියක්.

**ආර්යයන් වහන්සේඃ** හේ බුදුන් වහන්සේ දුන්න පණිවුඩය ඇත්තටම අපි ගොඩක් වෙලාවට ඔය සූත්‍ර පිටක ගොඩක් ඒව අපි දැන් සූත්‍ර නම් අතාරින්නේ නෑ තමයි. අපිත් ඒවා ඔක්කොම හොඳට අධ්‍යයනය කරනවා. ඒකට හේතුවක් තියෙනවා. ඒ කියන්නේ මේක පොතේ තියෙන එකක් නෙවෙයි. අපි බලනවා ඊට පස්සේ මේ මොකක්ද කියන්නේ කියලා. බැලුවම තමයි පේන්නේ ඔක්කොම ප්‍රායෝගික පැත්තෙන්මයි. ප්‍රායෝගික පැත්තෙන් පේන්නේ ගන්න කොට මේක පොතේ දැන් ඔය ලියල තියෙන ඒවා නෙමෙයි අපිට පේන්නේ. අපිට වෙනම සත්‍යයක් පේන්නෙ.

**උපාසිකාව:** වෙනම එකක් පෙන්නේ. ඒක අනිත් එක විස්තර කරන්නත් බෑ.

**ආර්යයන් වහන්සේ:** ආත්මයක් නැති බව කොහොමද අපි තේරුම් ගන්නේ. ඔබතුමියට ඒක හිතා ගන්න පුළුවන්ද? දැන් මේකෙ තියෙන ගැඹුරුම විග්‍රහය තමයි ඔය අභිඤ්ඤා දේශනාවල ඒක ගොඩක් අහුවෙනවා. දැන් මේ දවස්වල ඔය කැනඩාවේ මහත්වරු එහෙම ඒකෙත් ආත්මය තමයි ප්‍රශ්න කරන්නේ.

ආත්මයක් මේකෙ හම්බ වෙන්නේ නැහැනේ. මේ ශබ්ද වර්ණ දෙක එකට එකතුවෙලා එන electric shock එක. අර අහසේ විදුලි කොටනවා වගේ. මේ ෂොක් එක තමයි මෙතන මේ දැනීම. පොත වගේ දැනෙන ගතියක් තියෙනවා. දැන් පොත කියලා භාෂාවක් කිව්වට එහෙම අපට දැනෙන එකකුත් තියෙනවනෙ. දෙයක් වගේ දැනෙනවා නේ. ඒක තමයි ආත්මය. ඒතං මම කියන එක. ඒක තිබ්බොත් මාත් ඉන්නවා. **"ඒතං මම ඒසෝ හමස්මි නමේසු අත්තා"** මම මගේ ආත්මය කියන එක. ඒක එතන මෙතන මම කියලා ආයෙ බාහිරට ගිහිල්ලා අන්න ප්‍රථම පුරුෂ උත්තම පුරුෂ මධ්‍යම පුරුෂ කියලා භාෂාවකුත් හැදිලා.

**උපාසිකාව:** ඒක තමයි. දැන් ස්වාමීන් වහන්සේ දැන් මම අහල තියනවනේ, දැන් මම කියල කෙනෙක් නෑ හිතෙන් තමයි මමත් හදන්නේ අරමුණක් හදන්න කියලා. හැබැයි ඉතින් මට ඕක ඇහුවට පැහැදිලි කමක් නෑනෙ ඔහේ යනකොට අර මං අර හිස්වට බලන් ඉන්න කොට මට ඒක තේරුණා.

**ආර්යයන් වහන්සේ:** දැන් ඔබතුමී බලන්න දැන් හිත ද මැරෙන්නෙ කයද මැරෙන්නෙ. හිතනෙ මැරෙන්නෙ. හිත නැති නිසා නේ කය වළලලා දාන්නෙ. දැන් ආශ්වාස ප්‍රශ්වාස වෙනකම්ම ස්පාක් එකක් වෙනවනේ ප්‍රසාදයක් වෙනවා නේ. එතකොට ආශ්වාස ප්‍රශ්වාස වෙනකන්ම ප්‍රසාදය අර පුංචි දරුවාගේ අර ඇහැට එන්නේ වර්ණය කනට ශබ්දය අර මොන්ටිසෝරියේ පුතේ මේ කහපාට රතුපාට yellow red blue කියලා ඔතනින්නෙ පටන් ගත්තෙ ඔබතුමියත් ඉගෙන ගන්න.

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** එතකොට එතන පළවෙනි තැන නෙ අර මොන්ටිසෝරියේ පාට ටික දීපු එක. yellow red blue එතකොට අපිට ඇහැට දුන්නනේ වර්ණය දීලා කනට දුන්නනේ ශබ්දය. දුන්නහම ඒ ශබ්දයයි වර්ණයයි එකතු උනා නේ. එතකොට මේ පැත්තෙ පිච්ච මල කිව්වොත් ඔය පැත්තට පිච්ච මලක් මැවෙනවා නේ.

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** එතකොට ඔය රූපයක් මැවෙන්නෙ කොහොමද? ශබ්දයක් එනවනේ. ශබ්ද තරංගයි වර්ණ තරංගයි එකතු වෙලා චිත්ත තරංගයක් හැදෙනවා කිව්වේ ඒක දැන් හරි නේද?

**උපාසිකාව:** හරි හරි හරි.

**ආර්යයන් වහන්සේ:** එතකොට ඕක ඇවිල්ලා විද්‍යාවක් නේ. එතකොට ආත්මය කොහෙද තිබ්බේ. ආත්මය කියන්නේ එය චිත්ත තරංගය.

**උපාසිකාව:** ආත්මයක් කියල එකක් නෑ ඇත්තටම.

**ආර්යයන් වහන්සේ:** සිස්ටම් එකක් තියෙන්නේ. මේ සිස්ටම් එක තමයි අර දැන් අර ඉස්සරහට අපි කිව්වේ අර ටර්මිනේටර් වගේ හදලා සෙල හිටන් වර්ධනය වෙන්න හදන්න පුළුවන්, ඊට පස්සේ බොඩි එක ඒ විදිහටම තියෙයි, හැබැයි මේකෙ මේ සිස්ටම් එක දාන්න පුළුවන් කියලා අපි කිව්වේ. මේ සිස්ටම් එක ට්‍රිලියන ගාණක් වෙන්න පුළුවන් sim card එක වගේ, මේ ස්පාක් වෙන සිස්ටම් එක දැම්මොත් මේ සිස්ටම් එක ගන්න පුළුවන් සෙන්සස්වලින් සෙන්සස්වල සිස්ටම් එක ගන්න පුළුවන් circuit එකකට ගත්තොත් එහෙම මේ සර්කිට් එක apply කරොත් ටර්මිනේට් එකට, ඇත්තම කිව්වොත් සීයක් ගැහුවොත් කොපි සීයක් ගැහුවොත් අර එක්කෙනෙක්ගෙ තියෙන අර අර ස්නායුවල තියෙන අර දෙයක් දැක්කම එන වර්ණ, ශබ්ද, මේවා ටික ස්පාක් වෙන ඒ ටික ට්‍රිලියන ගාණක් වෙන්න පුළුවන් සංඥා, නමුත් ඒ ටික ඔක්කොම සිස්ටම් එකට ගත්තොත් එක circuit එකකට ගත්තොත් ඒක sim card එකට වගේ ගත්තොත් ඒක අර වගේ ටර්මිනේටර් ගැහුවොත් ඒ විදිහටම දෙයක් එනකොට මෙයාට එන දේ ම එයාටත් එනවා. ඇත්තටම එතන ආත්මයක් නැති වෙනවා. ඇත්තටම කිව්වොත් අර සීයක් ගැහුවොත්

copies ඒ කියන්නේ සීයම ටර්මිනේටර් වෙලා ඒකත්ත සංඥා ඒකත්ත කායා, එකම සංඥාව ඒ කියන්නේ මෙයාට එන සංඥාව ඔක්කොටම එනවා. ඒකට හේතුව ආත්මයක් පනවන්න බෑ. මේකෙ ආත්මයක් නෙමෙයි තියෙන්නෙ සිස්ටම් එක තමයි අර සර්කිට් එකේ ගහන්නේ. සිස්ටම් එක ගැහුවාම සිස්ටර් එක සමාන වෙනවා. ඒක නිසා තමයි බුදුන් වහන්සේ කිව්වේ **ඒකත්ත කායා, ඒකත්ත සංඥා** කියලා. එකම කය තියෙනවා එතකොට එක රූපය ටර්මිනේටර් සමානයි. ඒවගේම එකම සංඥාව. මොකක්ද එන සංඥාව එක සමාන ප්‍රතිචාර.

ආත්මයක් නෑ කියන එකයි තේරුම. **නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ.** සිස්ටම් එකක් විතරයි. ධර්මතාවක් විතරයි. **"ධම්මං විනා නත්ථි"** කිව්වේ කිසිම දෙයක් හම්බ වෙන්නේ නෑ. මේ ධර්මය අවබෝධ කරනවා කියන්නේ සිස්ටම් එක අවබෝධ කරනවා. ඒ සිස්ටම් එක අවබෝධය කරහම **නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ** ආත්ම කතාවක් නැති වෙනවා. හැබැයි මේක frequence වෙනවා. ඒ කියන්නේ දෘෂ්ටිය තුළ බාහිර ඇත්ත කරගත්ත තැන තුළ අර අපි කිව්වේ මේකේ ටයර් එක කැරකෙන කොට ඩයිනමෝව කැරකිලා අර කරන්ට් එක හැදෙනවා වගේ, වාහනයේ ටයර් එක කැරකෙන කොට අර battery charge වෙනව වගේ, මෙතන තණ්හාව, ඒ කියන්නේ දෙයක් තියෙනවා කියලා ගන්න කොට ආරෝපණයක් එනවා, බලයක්, ඒකට චිත්තාරෝපණ කිව්වේ ඒකයි. ගුරුත්වාකර්ෂණ බලය වගේ, ගුරුත්වාකර්ෂණය වගේ, විද්‍යුත් ආරෝපණය වගේ, චිත්තාරෝපණය. ඒ කියන්නේ මෙතන දෙයක් තියෙනවා කියලා ගන්න කොට ඒක ආරෝපණය, **උප්පිත්තති, "රුප්පන්තිකෝ ආයුසෝ රූපං"** කිව්වේ ඒකයි.

රුප්පනය වෙනවා, ස්පාක් වෙනවා, ෂෝට් වෙනවා, දෙයක් දකින කොට ස්පාක් එකක් වෙනවා. අන්න ඒක තමයි අපි විඳින එක, චූන් එක, උද්දීපනය. ඒ උද්දීපනය තමයි අපිට මේ බලගැන්විලා රාග ද්වේෂ මෝහ අපි කියන්නේ එක්කෝ ඇලෙනවා එක්කෝ ගැටෙනවා. කොයි පැත්තට හරි විඳේදනය වෙනවා. ඒව මොකද වෙන්නේ, මේකෙ ස්පාක් එක තමයි වැදගත් වෙන්නේ. ඒ කියන්නේ මෙතන තියනව වගේ දැනෙන සිස්ටම් එක, ඇත්තටම කිව්වොත් තරංග සිස්ටම් එකක්. මෙහෙත් සිරස බලනවා ටීවී එකේ, යාපනෙත් සිරස බලනවා ටීවී එකේ, ඇමරිකාවේත්

සිරස බලනවා ටීවී එකේ. හැබැයි ඇත්තටම මෙතන ටීවී එක කැඩුණොත් මොකද වෙන්නේ, ඊත් යාපනේ ටීවී එක වැඩ කරනවා වගේ, ඒ කියන්නේ මෙතන ශරීර කූඩුව පොළොවට පස් වෙනකොට මේ තියෙන frequence එක තව තැනකට ටෙලිපති වෙනවා. සකස් වෙනවා. මේ ශරීර කූඩුව පොළොවට පස් වුණා ටීවී එක කැඩුණා, හැබැයි මේ සර්කිට් එක වගේ ඒරියල් එක. ඒ කියන්නේ ආයතන ටික, සළායතන, ආයතන ටික තියෙනවා නම් අන්න චිත්‍රපටිය වගේ පේනවා. සිරස, දෙරණ, හිරු වගේ. අර මෙතන තියෙන සර්කිට් එකේ දැන් දෙරණ ද හිරු ද මොකක්ද කියන එක තියෙන්නේ ඒ අල්ලන frequence එක අනුවයි. ඒ කියන්නේ රාග, ද්වේෂ, මෝහ ස්වභාවය අනුවයි. රාග, ද්වේෂ මෝහ ස්වභාවය අනුව තමයි **මානීය මක්කටෝ අතිමානීය කුක්කුරෝ** කියන එක ගති නිමිති කම්ම නිමිති කියල කිව්වෙ. ඒ කියන්නේ අපි ගාව තියෙනවා මේ බන්ධන බලය. ඒ කියන්නේ ආරෝපණය. රාග, ද්වේෂ, මෝහ කොයිතරම් ද ඒ තරම් තමයි ගණ සංඥා කියලා පහළ ලෝක පෙන්නුවේ. ඒ රාග, ද්වේෂ, මෝහ තුනීවෙන තරමටයි සුගති පරායන කිව්වේ. එහෙනම් අපිට මේ ලෝකේ තියෙනවා කියලා ගත්ත තැන, ලෝක සංඥා තියෙන තැන, **"තණ්හා නමැති වඩුවා තා මා දිටිමි, තාට නැවත නිවසක් සෑදීමට ඉඩ නොදෙමි"** කිව්වෙ. ඒ කියන්නේ මේ රාග, ද්වේෂ, මෝහ තුනී වෙන තැන අන්න සුකුම වෙලා සුකුම වෙලා සුකුම වෙලා නොදැනෙන ස්වභාවයකට ගියා කියන්නේ නිෂ්ක්‍රීය ස්වභාවයක් වෙලා අර කරන්ට් එක දියවෙලා ගියා වගේ. ආත්මීය ආරෝපණය දියවෙලා ගියා. අන්න ක්ෂීනාශ්‍රව රහතන් වහන්සේ. එතනයි නිවන. ඔබතුමිය එතන්ට තමයි යන්න හදන්නේ.

**උපාසිකාවඃ** දැන් එහෙම ඇත්තටම අඩු වෙවී අඩු වෙවී යනවා. හැබැයි.

**ආර්යයන් වහන්සේඃ** ඕක අඩු වෙන්න, දැන් ඔබතුමී බලන්න දැන් පොත තියෙන්නේ අපි එළියෙ කියලනෙ ගන්නෙ. දැන් ඇහැට එන්නේ වර්ණයක් නේ. ඒකත් එක්කම ශබ්දෙ එනවනේ. ශබ්දෙ කොහෙන්ද ආවේ. අර පුංචි දරුවාට දීපු ශබ්ද වර්ණ එකට එකතු වුණ එක ස්පාර්ක් එකක් නේ. ඒක මේ මොහොතෙත් spark වෙනවනේ දිගටම තාම දුවනවා නේ. ගඟ ගලනවා වගේ දිගටම තාම ස්පාර්ක් වෙවී තියෙන්නේ. හුස්ම වැටෙන කම්ම තියෙනවා. හුස්ම වැටෙනවා කියන්නේ හෘදය ස්එන්දනය

වැඩ කරනවා, පෙනහලු වැඩ කරනවා, දිගටම ස්පාක් එක, ආරෝපණය, අපේ තියනවා ඕිරා එක. ඒක ස්නායු පද්ධතිය ඔස්සේ කරන්ට් එක තියෙනවා. එහෙනම් ඒක දිගටම තියනවා කියන්නේ ස්පාක් එක දිගටම සිද්ධ වෙනවා. ඒක අඩු වැඩි වෙන්නෙ අර රාග, ද්වේෂ, මෝහ ස්වභාවය අනුවයි. තාත්තට එකළොස් දාහෙන් ස්පාක් වෙනවා. දරුවට පන්දාහෙන් ස්පාක් වෙනවා කිව්වේ ඒකයි. රාග ද්වේෂ මෝහ ප්‍රමාණය අනුව තමයි ස්පාක් තියෙන්නේ. ඒක තමයි ආරෝපණය. අපි එතකොට ආත්මය කියන්නේ ඕකටයි. ආත්මෙ කියන්නේ ස්පාක් එකටයි. ආත්මීය දැනීම, ඒකයි අපට ලෝකයක් තියෙනවා අරවා තියෙනවා මේවා තියෙනවා, අපි දාපු දත්ත ටිකක් විතරයි. ඒව කොහේවත් එහෙම එකක් නෑ. ඇස් පේන්නෙ නැත්නං, අන්ධ නම්, කළු පාටයි ද ලෝකෙ කියල අහන්න හිතෙන්නේ ඒකයි. දැන් ඔබතුමිය අන්ධ වුණොත් කළුද ලෝකෙ? අන්න ඒ වගේ මේක හදා ගත්ත නිකං වර්ණ ටිකක් හදාගෙන ඒක තුළ නිකං අපි අතරමං වෙලා නිකං අපි පිස්සුවෙන් වගේ ඔබතුමිය වගේ ඉන්න එක තමයි පෘථග්ජන උන්මත්තකයෝ කියලා කිව්වේ.

**උපාසිකාව:** ඒක තමයි, ඒක ඇත්තම ඇත්ත.

**ආර්යයන් වහන්සේ:** ශබ්ද, වර්ණ, ගන්ධ, රස, පහස, උණුසුම, සීතල, තද ගතිය කියන මේ සෙන්සස් ටික සම්පූර්ණයෙන්ම ෆැන්ටසි එකක්.

**උපාසිකාව:** ෆැන්ටසි එකක් ම තමයි.

**ආර්යයන් වහන්සේ:** ඇත්ත ලෝකෙ දකින හීනේ. මේ සත්‍යයට අවදි වෙන්න පුළුවන් නුවණින්, සත්‍ය දැකලා ඔබතුමිය අවදි උනා වගේ. දැන් කණ්ණාඩියෙන් දැකපු රූපය මමය කියලා හිතාගෙන මේ කර්කජ කය මමය කියල හිතුවට ඒක සිතුවිල්ලක් විතරයි. ඒකයි අපි කිව්වේ හිතට තිබහයි කිව්වට හිතට වතුර බොන්න බෑ. කටට දානවා, බඩට යනවා, එළියට යනවා. හිත බඩගිනියි කිව්වට හිත බත් කාලා නෑ කටට දානවා, බඩට යනවා, එළියට යනවා. හිත ඇවිදිනවා කිවවට හිතට ඇවිදින්න බෑ. හිතට ආදරය කරනවා කිව්වට හිතට ආදරේ කරන්නත් බෑ. හිතට කිසි දෙයක් කරන්න බෑ. එතකොට හිත කියන්නේ දෘෂ්ටියක් විතරයි. ශක්තියක් විතරයි. අර විද්‍යුත් ආරෝපණය විතරයි.

එතකොට මේ ආශ්වාස ප්‍රශ්වාස නවතින කොට අන්න ඒ ස්පාක් එක නවතිනවා. එතකොට මොකද වෙන්නේ? අන්න හිත නෑ. එතකොට වැඩක් තියෙනවද කය. අන්න ගිනි තියලා දානවා. දැන් මම කියන්නේ කය ද හිත ද? හිතයි. ඒක පවතිනවාද? නෑ, එතන එතන ස්පාක් වෙනවාටයි හිත කිව්වේ. ගඟ ගලනවා, වැස්ස වහිනවා, හුළඟ හමනවා කියන්නේ මේ ස්පාක් වෙන වේගයටයි. අන්න තියෙන බිත්තියක් වගේ පෙනුණාට තප්පරේට කෝටි වාරයක් ස්පාක් වෙලා තමයි ඕක තියෙනවා වගේ පේන්නේ. අර කාටුන් එකක් යනකොට වේගයෙන් පින්තූර ගොඩාක් යනකොට තියෙන චිත්‍රපටියක් වගේ පේන්නේ.

අන්න ඒ වගේ ප්‍රොජෙක්ටරයක් වගේ තමයි මේ සිත වැඩ කරන සිස්ටම් එක. ඕකට කියන්නේ **සංඛාරා** කියලා. **සබ්බේ සංඛාරා** මේ වේගය තුළ මැවෙන **සංඛාර** තමයි. ඒක තමයි විඤ්ඤාණයෙ දැනගැනීම වෙලා චිත්‍රපටිය පේන එක. මේක හරියට නිකං විද්‍යුත් මෙවලමක් වගේ.

**උපාසිකාවː** ඒක නං ඇත්තම තමයි මට හිතුණෙ දැන්.

**ආර්යයන් වහන්සේː** දැන් ඔබතුමිය ආයිමත් අපි අහනවා. අවුරුදු හැත්තෑ හතරයි වයස. මහාචාර්යවරියක්. ඔබතුමිය බොහොම කෙටි දේශනා ප්‍රමාණයකින් ධර්මය අල්ලලා තියෙනවා. ඔබතුමිය කියපු විදිහට ඔබතුමිය සීයක් අහලා නෑ. නමුත් ඔබතුමිය මේක ගත්තා. හැබැයි ගත්තෙ ඔබතුමියගේ මහා ප්‍රඥාවක් තියෙන නිසා, නුවණක් තියෙන නිසා. හැබැයි ඔබතුමියගේ තියෙනවා දෝෂයක්. ඒක තමයි දීර්ඝ කාලයක් තිස්සේ ඝණ සංඥා වැදිලා තියෙනවා. ඒක නිසා ආත්මීය දැනීම තදට තියෙනවා. හැබැයි ඔබතුමියට මේක කියන කොට තේරෙනවා මෙතන ආත්මයක් නෑ කියලා. හැබැයි ඔබතුමියට ඒක තමා දැනෙන්නෑ. එහෙම නේද?

**උපාසිකාවː** ඔව් ඒක මට ඒක කියන කොට තේරෙනවා. ඒ උණාට.

**ආර්යයන් වහන්සේː** තේරුණාට දැනෙන්නෙ නැත්තෙ අවුරුදු හැත්තෑ ගාණක් ඔබතුමියට ඝනට තාම වැදිච්ච එක. අන්න බුදුන් වහන්සේ ප්‍රතිපදාව පැනවූයේ ඒකයි. මේ සංඛාර කියන්නේ සංඛත කියන්නේ වේගය තුළ සකස් වුණු අභිසංඛරණයක්. බඹරයක් වගේ කැරකීම තුළ

අර ගිනි වළල්ලක් හැදිලා තියෙන්නේ වේගෙට කැරකෙන. ඔබතුමියට දීර්ඝ කාලයක් තියෙනවා කියලා දීලා තියෙනවා බලගැන්විලා. ඒක නැති කරන්න නම් දීර්ඝ කාලයක් ඒ කියන්නේ ඔබතුමියට යම්කිසි කාලයක් සත්‍ය දකින්න වෙනවා. දෙයක් නැති බව. තියෙනවා තියෙනවා කියලා දැකපු දේ නෑ නෑ කියන පැත්තට යන්න වෙනවා. ඒක කියනවා නෙමේ වචනයෙන් අභ්‍යන්තරයෙන් මෙනෙහි වෙන්න ඕන. අන්න එතනයි **"සබ්භූපති පටිනිස්සගෝ"** කියන තැන ඔබතුමියගෙ නිවන් මග හමුවෙන්නෙ. ඔබතුමියට වෙන දෙයක් නෑ. ඔබතුමියට සත්‍ය ඥානය තුළ දැන් ගොඩක් දේවල් දන්නවා. ඔබතුමියට අවබෝධයක් තියෙනවා. දැනුම හරි. ඔබතුමියට දැන් තියෙන්නේ ප්‍රායෝගික පැත්ත. හැබැයි ඔබතුමිය කරනවා නෙවෙයි ඔබතුමිය නිවන් දකිනවා. ඔබතුමිය කරනවා නෙවෙයි ඔබතුමිය දැන් ඉන්න මට්ටම හොඳයි. ඔබතුමිය නිරායාසයෙන්ම ගඟට ඇලවුණු ගස වගේ ගඟටමයි වැටෙන්නේ. මහණෙනි කිව්ව වගේ නිවනින්ම සැනසීම ලබනවා ඔබතුමිය. **නියත සම්බෝධි පරායණයි.**

**උපාසිකාව:** ඔබ වහන්සේගේ ධර්මය නිසා තමයි. ඔබ වහන්සේ පෙන්නපු විදිහ, නැත්නම් මම බණ අහල තියෙනවා. ඒත් ඔබ වහන්සේ ඒ කියපු ටික හරිම spirit එක වගේ ඒක.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමිය ස්ප්‍රිට් එක වගේ ළමයින්ට උගන්නන්න ඇතිනේ. ඒක නිසා ඒ කරපු, සමහරවිට ඒකෙ ප්‍රතිවිපාක වෙන්න ඇති අපි ස්ප්‍රිට් එක වගේ ඔබතුමියට සත්‍ය දෙනවා. එහෙම නේද?

**උපාසිකාව:** මේ විදිහට බලාගෙන මේ විදියට දිගට කරනකොට.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමිය කරනවා නෙවෙයි ඔබතුමිය නිවනට පත් වෙනවා.

**උපාසිකාව:** වෙනවා වෙනවා ඇත්තටම. දැන් ඊයෙ තිබුණ ආසාව දැන් අරක තේරුණහම මේ හිතක් සිතුවිල්ලක් තමයි මේ සිත දකින කොට ඒක ඉබේම නැති වෙනවා. ඒක වෙන්න ඉස්සෙල්ලා දවසයි ඊට පස්සේ දවසයි බලනකොට ලොකු වෙනසක් තියෙනවා. ඒක තේරිච්ච දවසයි තේරෙන්න ඉස්සරලයි. ඉතිං එහෙම එක දිගට බල බල යන එක තමයි කරන්න තියෙන්නේ නේද ස්වාමීන් වහන්ස?

**ආර්යයන් වහන්සේ:** ඔව්. ඔව්. ඒක හරි. ඥානය කියන්නේ මේකයි. ඔබතුමියට ඒ ඥාන දැන් අවදි වෙලා තියෙන්නේ. ඔබතුමියට ඔය අභ්‍යන්තර පරිවර්තනය ඔබතුමිය සිහිය පවත්වන්න. ඔබතුමියට මේ දේශනා ඉතාම වැදගත්. මේ අන්තිමට යන සාකච්ඡාවල ගොඩක් ඔය වගේ අය දැන් කතා කරන්නේ. මාර්ගය තුළ ගොඩක් දියුණුයි. ප්‍රතිපදාව දැන් අහල තියෙන්නේ. ඒ අය ගොඩක් දැන් මේක දැනුමෙන් ඉන්නවා. ගොඩක් අය ප්‍රායෝගික දැන් වීගෙන යනවා. ඒක නිසා මගඵල ලාභීන් ළඟ ළඟ ළඟ ළඟ බිහිවෙනවා. නවත්තන්න බෑ කාටවත් සොබා දහම වගේමයි. ඒකාන්තයි. බුද්ධ ශාසනය පිබිදීම කිසි කෙනෙකුට නවත්වන්න බැහැ. කිසිම සත්ව ලෝකයේ කිසිම මනුස්ස ලෝකයේ අපිට කිසිම මනුස්ස මේකක් පේන්නෙ නෑ. මේක නවත්වන්න පුළුවන්. මේක මහා ස්වභාව ධර්මයේ න්‍යායට සිද්ධ වෙනවා. මේ ගෞතම බුද්ධ ශාසනයේ පිබිදීම ආරම්භ කරලා ඉවරයි. ඒක තුළ මේ සියල්ලම මෙතෙක් අපේ හාමුදුරුවරු ගෙනාපුවා ඔය ත්‍රිපිටකය ද ඔය කියපු ධර්මය ද සියල්ලම අවසානයේ බුද්ධෝත්පාදය තුළ ඒකාන්තයෙන්ම මල්ඵල ගන්වනවා.

**උපාසිකාව:** එහෙමයි. ඒක නම් ඇත්තම ඇත්ත. ඒකෙ ගෞරවය ඔබ වහන්සේට මොකද ඒක එච්චරටම pratical විදිහට ඒක කියන්නේ, මේ දේශනාව. එතකොට අර වෙන අය එක්ක තියන discussions වැදගත්. සමහර ඒවා ඔළුවට ගියාට ඉතින් තේරෙන්නේ නැති කොට ඒක ඔහේ අතඅරිනවා නේ. ඒ වගේ උනහම අර තමන්ට තේරෙනවා එකපාරට එන්නේ එකම පාරට.

**ආර්යයන් වහන්සේ:** ඒ lighting එක එනවා. enlightment එක එනවා. ඒක අපි දන්නවා. නමුත් අර ගොඩක් අය ව්‍යාජ enlightment එනවා. ඒක හොයන්න බෑ. ඒ කියන්නේ අර ලෞකික පැත්තෙත් තියෙනවානේ අර අර නිකං අර බය වෙනවා වගේ නිකන් අර මේ ධර්මය අවබෝධයක් නැතුවත් enlightment එන ඒව තියෙනවනේ. සාමාන්‍යයෙන් ඔය මිනිස්සු හීන දැකලා බයවෙනවා වගේ චිත්ත කම්පන තියෙනවනේ. ඒ වගේ ඒවට රැවටෙන හින්දා අපි එකපාරටම කියන්නේ නෑ.

මිනිස්සු එතකොට ඒක කියාගෙන එනවා නිවන් දැකලයි කියලා හිතාගෙන. නමුත් **රාග, ද්වේෂ, මෝහ** එහෙමමයි. එතකොට රැවටෙනවා. එතකොට මග-ඵල කියන්න යනවා. එතකොට අනිත් අය අනාවැකි

කියන්න යනවා. මහා විකාරයක් වෙනවා නේ. එතකොට ප්‍රායෝගික පැත්ත අර practically බේස් එක බිම් මට්ටමෙන් බැහැලා යන්නෑනේ කවුරුත්. අන්න ඒක නිසා තමයි අපි ගොඩක් මේ enlightment එක වැඩිය කතා කරන්නැතුව අපි කියන්නේ රාග, ද්වේෂ, මෝහ කෙලෙස් සංසිඳෙන මග යන්න. හැබැයි මාර්ගය හොඳට පිරිසිදු නම්, හොඳට දර්ශනය අවබෝධය තියෙනවා නම් ඒකාන්තයෙන්ම ඒක සිද්ධ වෙනවා. හැබැයි අපි ඒක දන්නවා. ලෝකෝත්තර භූමියේ enlightment එක අපි අඳුරනවා. ඔබතුමිය කියන කොටත් අපිට තේරෙනවා. ඒක දැන් තේරුණායි කියලා වැඩක් නෑනෙ කෙලෙස් තියෙනවා නේ.

**උපාසිකාව:** එහෙමයි. එන්න එන්න අඩුවේගෙන යන බව තේරෙනවා.

**ආර්යයන් වහන්සේ:** අපිට වැදගත් වෙන්නේ දැන් මේ කතා කරන කෙනා සතුටු කරන එක නෙවෙයි. අපිට වැදගත් වෙන්නේ නිවනටම පාර පෙන්නන එක.

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** කොතැනද ඉන්නේ කියන එක අපිට අදාළ නෑ. ඒ කෙනාට සන්දිට්ඨිකයි. ඒ කෙනා දන්නවා දියුණුයි කියලා. හැබැයි දියුණුයි කියලා සතුටු වෙවී ඉඳලා වැඩක් නැහැ. අපි අවසානයට යන්න ඕන කියන එක. මේ අන්තිම ආත්ම බවය කියන එක අපි කියන්නේ.

**උපාසිකාව:** දැන් මං ඇත්තටම ඇහුවෙත් මේක ටිකක් බලල මට මේක පැහැදිලි වෙලාද කියලා.

**ආර්යයන් වහන්සේ:** තේරුණා තේරුණා guess කර කර තමයි මුලින් කිව්වේ. හැබැයි ඒක කියන කොට අපිට තේරුණා. අපිත් එකපාරටම ඉතිං කියන්න යන්නේ නැතුව තව ටිකක් ප්‍රශ්න අහන්න කියලා හිතුවා.

**උපාසිකාව:** මට අර හොඳටම සන්තෝසෙ හිතුණේ මට මැරෙන මොහොතේ අර mode එකට යන්න පුළුවන්.

**ආර්යයන් වහන්සේ:** ඒකට අපි කියනවා නේද ගොඩක් ඒව නෙ. අපි කාල ක්‍රියාකරන හැටි එහෙමත් අපි පැහැදිලි කළා.

**උපාසිකාව:** ඒ ටික ඇහුවේ නෑ ඒ ටික මම තාම ඇහුවේ නෑ.

**ආර්යයන් වහන්සේ:** අහන්න අහන්න. අලමරියඥාන දර්ශනය, ඔව් අර උපක්ලේශ සූත්‍රයත් අහන්න. ඔබතුමියට වැදගත්. උපක්ලේශ සූත්‍රය ඔබතුමියට වැදගත්, **අලමරියඥාන දර්ශනය** ටික වැදගත්. ඔබතුමිය ඒ දර්ශනය තමයි ඔබතුමිය කතා කරන්නේ ඥාන දර්ශනය ගැන. ඒක නිසා ඔබතුමිය ඒ දේශනා අහන්න. කාලක් ක්‍රියා කරන දේශනා අහන්න. නිරෝධ සමාපත්ති දේශනාත් අහන්න. ඒ හැම එකම ඔබතුමියට වැදගත්. ඒ අරහත්ත සමාධිය කියල තියෙන දේශනා අහන්න. ඒවා වැදගත්.

ඛනික සමාධිය ඔබතුමිය දකින අත්දැකීමයි තියෙන්නේ. ඛනික සමාධිය කියලා අපි දාල තියෙන්නෙ. **විපස්සනා ඛණික සමාධිය** කියලා දාලා තියෙනවා දේශනා වගයක්. කර්මස්ථාන ටිකක්.

**උපාසිකාව:** ඒක තමයි මම ඒ නම් දන්නේ නෑ. එක්ස්පීරියන්ස් එක විතරයි මම දන්නේ.

**ආර්යයන් වහන්සේ:** ඒ විපස්සනා ඛණික සමාධිය කියන්නේ ඔබතුමියගේ එක්ස්පීරියන්ස් ම තමයි. ඔබතුමියට ඒවා අහනකොට තේරෙයි අනිත් අයටත් ඒ වගේ තියෙනවනේ ලැබිලා අත්දැකීම්. ඒ අත්දැකීම් එයාලා හෙළි කරනවා නේ. ඔබතුමියටත් ඒවා අහනකොට ඔබතුමියගේ compare වෙනවා. ඒක ගැළපෙනවා. එතකොට ඔබතුමියට මහා පුදුමාකාර හයියක් ඇති වෙනවා හිතට. මාර්ගය හොඳට පිරිසිදු වෙනවා.

**උපාසිකාව:** හා මං තව අහන්නම් ස්වාමීන් වහන්ස, ගොඩක්ම පින් දීලා වැඩක් නෑ.

**ආර්යයන් වහන්සේ:** පින කියන්නේ **රාග, ද්වේෂ, මෝහ** කෙලෙස් පිරිසිදු වෙන එකටයි පින කියන්නේ. අපි කුසලය කියලා කියන්නේ මේ සිතුවිලිවලින් මිදිලා සිහියට අවදි වෙන එකටයි. **කුසලස්ස උපසම්පදා, සබ්බ පාපස්ස අකරණං** කිව්වේ සිතුවිලි අකුසල් කියන එක. **කුසලස්ස උපසම්පදා** කිව්වේ සිහියට අවදි වෙන එක. අට මහා කුසල් කියන්නෙ අපි මේ **රාග, ද්වේෂ, මෝහ.** ඒ කියන්නේ අපි කතා කරන්නේ සෝවාන්, සකෘදාගාමි, අනාගාමි මාර්ග සිත් 4යි ඵල සිත් හතරයි. එතකොට

අට මහ කුසල් කියන්නේ මාර්ග සිත් හතරයි ඵල සිත් හතරයි. නැතුව බඩු මුට්ටු නෙවෙයි. එළියෙ තියෙන ඒවා නෙමෙයි. ඥාණ සම්ප්‍රයුක්ත කුසල සිත් කියන කොට සිත් 89 පෙන්නන කොටත් මේවා පෙන්නනවා ලෝකෝත්තර සිත්වල අට මහා කුසල්, කුසල සිත් වෙන කොහෙවත් නෑ. කුසලය කියන්න සිහියක් එක්ක යන නිවන් මඟ, ඥාණ සම්ප්‍රයුක්ත කුසල සිත් කියන්නෙත් ඒකයි. ඒවා හොඳට මේ ධර්මය තුළ තේරෙනවා. දැන් මේවා ලෞකික භූමියේ අර මිථ්‍යා දෘෂ්ටික භූමියේ මේ නම් අවභාවිත වෙනවා. තේරෙනවා නේද කියන එක. ගොඩක් අය හිතුවේ නිවන් දකින්න අටමහ කුසල් කියලා එක එක බඩු මුට්ටු ටිකක් ගැට ගහලා බඩු මුට්ටු ඇත්ත කරගෙන ලෝකය ඇත්ත කරගෙන. මේවා දීලා නිවන් දකින්න. මොකක්ද මේ කරලා තියෙන්නේ. අපිටත් හිතාගන්න බෑ. මේ මිනිස්සුන්ට මොකද්ද වෙලා තියෙන්නෙ කියලා.

**උපාසිකාව:** ඒක තමයි ඇත්තටම දැන් තමයි ඒවා තේරෙන්නේ.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමියත් ඒව පස්සෙ යන්න ඇති සමහරවිට.

**උපාසිකාව:** ගොඩක් වගේ නෑ. ටිකක් මම අනිත් අයගේ ඒවට සම්බන්ධ වෙලා තියෙනවා.

**ආර්යයන් වහන්සේ:** යද්දි තේරෙන්නෙ ගෝත්‍රිකයෝ වගේ අයියෝ. බලන්න අපේ මිනිස්සු පන්සල් යන්න ගියාම ඔන්න පොල්තෙල් හොයනවා. හඳුන්කූරු හොයනවා, ගිනිපෙට්ටි හොයනවා, මේ යන්නේ කෝවිලකට ද නැත්නම් ධර්මය, බුදුන් වහන්සේ ධර්ම දේශනා කරන්නේ බලන්න පටාචාරාව ආවත්, කිසාගෝතමිය ආවත්, අංගුලිමාල ආවත් මේ නිවන් මඟ ධර්මය පැහැදිලි කරන්නේ.

මේ කොහේවත් නෑ නේ මේ වගේ කතාවක්. දැන් හින්දු භක්තිකයෝ කෝවිල් යන විදිහට තමා අපේ අය පන්සල් යන්නේ. ගිහින් කරන්නෙ අර ටික පූජා කරලා පහන් පත්තු කරල වට ටිකක් ගිහිල්ලා.

**උපාසිකාව:** ස්වාමීන් වහන්ස ගොඩක්ම බණ තියෙන්නෙ ඒව ගැන නේ. ඉතිං මිනිස්සු මුලා වෙනවා ඒකයි.

**ආර්යයන් වහන්සේ:** දශක ගණනක් මේ අපේ රටේ ධර්මය ඉස්මතු නොවීමයි හේතුව.

**උපාසිකාව:** ඒක තමයි මේ දැන් තමයි ඔබ වහන්සේ කියල දුන්නහම තමයි ඒකෙ හරය තේරෙන්නෙ.

**ආර්යයන් වහන්සේ:** මේ විදිහට ඔබතුමිය කියන්නේ මේ ධර්මය පැහැදිලි කළොත් මේ පන්සල්වලට මිනිස්සු යන්නැතුව ඉඳියිද? ධර්මය අහන්න මෙහෙම පැහැදිලි කළොත් ඒ පන්සලේ එක හාමුදුරු නමක් හරි මෙහෙම කියනවා නම් වටේ ඉන්න ගෙවල්වල අය විවේක වෙලාවට හරි ගිහිල්ලා ධර්මය අහනවා. හාමුදුරුවන්ගෙන් අනේ හාමුදුරුවනේ පොඩ්ඩක් කියල දෙන්න කියල. අද ඒකට යන්නේ නෑනේ පන්සලට.

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** ඒකයි අද මේ ඔක්කොම මහා අවාසනාවන්ත සිද්ධියකට මුහුණ දෙනවා. භික්ෂූන් වහන්සේලා යන්නෙත් වෙනින් දේවල් කරන්න පන්සලට. ධර්මය කෝ. මේ **සබ්බ දුක්ඛ නිස්සරණ** කියලා දුකෙන් මිදෙන්න **ඉමං කාසාවත්ථගහෙත්වා** ඔය කසාවත මට දෙන්න ස්වාමීනි කියලා, පැවිද්ද ඉල්ලනවා. **සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාන සච්ච කරණත්තාය** නිවන් දැකීම සඳහා දුකින් මිදීම සඳහා **දුක්ඛ නිස්සරණ නිබ්බාන සච්ච කරණත්තාය ඉමං කාසාවත්ථගහෙත්වා** ඔය කසාවක මට දෙන්න ස්වාමීනි කියලා අනුකම්පා උපාදාය මට අනුකම්පා කරන්න ස්වාමීනි. ඕක ඉල්ලන්නේ ඇත්තටම මේ සිත දැකලා මිදෙන මගට සිව්පසය ඕන වෙනවා. අර නැත්තං ව්‍යාපාර කරන්න ගියාම ඔය සිත දැකලා නෑ මිදෙන මඟ යන්න බෑනේ, දකින්න බෑනේ, වෙලා නෑනේ. ජීවිත කාලය අඩුයි නේ. ඔන්න ඕකටයි මේ තියන්නෙ මේ පැවිද්ද. නැතුව මේ ජොබ් එකක් හොයා ගන්න ඩිග්‍රියක් ගහන්න සමාජයේ බැබලෙන්න පට්ටමක් දාගන්න ඔය ආශාවන් ඉෂ්ට කරගන්න නෙවෙයි. ලොකු වාහනයක් ඇරගෙන ඊට පස්සේ ගමට බැබළෙන්න නෙවෙයි. මේ ධර්මය අවබෝධ කරගෙන මනුස්සයා දුකින් මුදවන්න. යන්නේ කොහෙද මල්ලේ පොල් කියලා කිව්වේ ඒකයි. නේද? ඔබතුමියට තේරෙනවා.

**උපාසිකාව:** එහෙමයි දැන් නං තේරිලා හොඳටම.

**ආර්යයන් වහන්සේ:** හොඳටම තේරෙනවා. නොතේරුණොත් තමයි පුදුමේ. හැබැයි ඉතිං අවුරුදු හැත්තෑ හතරක් ගියා ඕක කලින් තේරුණා නම් ළමයින්ටත් උගන්නන්න තිබුණා.

**උපාසිකාව:** ඇත්තටම ස්වාමීන් වහන්සේ අර රස්සාවක් එහෙම කරන කොට වෙලාවක් නෑනෙ ඒක ගැන හිතන්න.

**ආර්යයන් වහන්සේ:** mashinary වෙලා නෙ.

**උපාසිකාව:** ඒක තමයි ඔක්කොටම වැඩිය ප්‍රශ්නය වුණේ. රිටයර් උනාට පස්සේ නිකම් බණ අහ අහ හිටියා. සාමාන්‍යයෙන් අර පන්සල් යන බණ තමයි. ඒ අහ අහ ඉන්න කොට මගේ යාළුවෙක් කිව්වා මට තව ඊට වැඩිය ටිකක් ගැඹුරු බණ අර දර්ශනය පැත්ත ටිකක් පෙන්නුවා. ඊට පස්සේ හදිස්සියේ තමයි මේ බුද්ධෝත්පාද දැක්කේ. ඒකෙන් අර තියරිනෙ දැනගෙන හිටියෙ. ඉතින් මොකක්ද කියලා තේරෙන්නෑ. හැබැයි මේක නිකන් ඒම් කරලා තියෙනවා යම්කිසි දේවල්වලට. එතකොට ඒ විදිහට බලලා බලලා බලලා එතකොට තේරුණා ඒක. ඒකයි තියන වෙනස මෙතන.

**ආර්යයන් වහන්සේ:** ඇත්ත. ඇත්ත හොඳයි. මහා භාග්‍යයක් ඇත්තටම.

**උපාසිකාව:** භාග්‍යයක් කියන්නේ ඔබ වහන්සේ නම් ලොකු භාග්‍යයක් මුළු හැම දෙනාටම. මොකද මං හිතනවා ගොඩක් දෙනෙක් අවබෝධ කරගෙන ඉන්නේ.

**ආර්යයන් වහන්සේ:** ඔව් විශාල මේකක්. මේ රටවල්වලින් අපට දැන් දාන්න තියෙන්නෙම රටවල්වල ඒවමයි බලනකොට. ඇත්තටම කිව්වොත් තේරුම් ගනීද දන්නෑ මොනවා තේරුම් ගනීද දන්නෑ. ඒ තරම් මේ රටවල්වලින් එනවා. ලංකාවෙ අය ගොඩක් කෝල් කරනවා. නැත්තෙ නෑ. නමුත් අපි ආයෙ රටවල් ටික දානවා ආයෙ ලංකාවේ ඒව දානවා. ඇත්තටම අපිට දැන් විශාල ප්‍රමාණයක් එනවා. ඉතින් යූටියුබ් එකේ දාලා ඉවර කරන්නත් බෑ. ඉතින් අපි බලලා අපිට වෙලාව තියෙන විදිහට තමයි දැන් කටයුතු වෙන්නේ. හැබැයි මේ ධර්මය නම් හැබැයි මාධ්‍යවල යන්න වටිනවා. මේ අපි හෙළි කරන හෙළි කිරීම මාධ්‍යවල යනව නම්, අපිට මේ මිනිස්සුන්ව නොමඟ, මේ මාධයවල යන්නෙම නොමඟ අරින ඒවනේ.

**උපාසිකාව:** නෑ යන්නෙ නෑ. මේ සෙන්ස් එක යන්නේ නෑ.

**ආර්යයන් වහන්සේ:** ඒක හැබැයි බුද්ධ කාලයේත් එහෙම තමයි මේක ලේසි නෑනේ. දරා ගන්න බෑනේ මිනිස්සුන්ට. බුදුසමයෙත් එහෙම තමයි.

**උපාසිකාව:** මිනිස්සුන්ට තේරෙන්නේ තේරෙන්නෙත් නැති වෙයි මට හිතෙනව. අපිටත් තේරුණේ නෑනේ ඉතිං මෙච්චර වයස යනකම්ම.

**ආර්යයන් වහන්සේ:** හැබැයි ඔබතුමිය මහාචාර්යවරියක් විදිහටනෙ දනන්නේ මේ කෝණයෙන්නෙ. හැබැයි ගමේ ඉන්න අර ගොවිතැන් කරන අම්මලත් මේ දහම අවබෝධ කරන්නෙ.

**උපාසිකාව:** පුළුවන් ඇත්තටම, එහෙම දැනීමක් අවශ්‍ය නැහැ, මට නම් තේරෙන විදිහට.

**ආර්යයන් වහන්සේ:** අපි ඒ දේශනා දාලා තියෙන කොට හැමෝගෙම ඇස් ඇරෙනවා. ඉස්කෝලෙ ගිහිල්ලත් නෑ, පහේ පන්තියටවත් ගිහිල්ලත් නෑ මෙන්න ධර්මය අවබෝධ කරගෙන.

**උපාසිකාව:** ඉගෙන ගත්ත එකෙන් තමයි මේ වැරදිලා තියෙන්නෙ වැඩ, මට හිතෙන්නේ. ගොඩක් දාගෙනනෙ ඔළුවට.

**ආර්යයන් වහන්සේ:** දත්ත වැඩිකම. අන්තිමට සිලබස් එක මත්තෙම මැරෙනවා බලනකොට. ඔබතුමියට හිනා ගියේ තේරුණා නේද ඔව් ඒක තමයි වෙන්නේ.

**උපාසිකාව:** අනිත් අය එක්ක ඉන්න කොට නං ටිකක් පොඩි ප්‍රශ්නයක්, මොකද ඒවා අහගන්නත් ඕනේ ඒව ඉතින් සිතුවිලි තමයි, ඇතුළෙන් කියනවා.

**ආර්යයන් වහන්සේ:** තේරෙනවා ඉතිං හිස් වචන කියල තේරෙනවා වැඩක් නෑ කියලා තේරෙනවා. හැබැයි ලොකු අවබෝධයක් එනවා. කම්පාවෙන් නෑ, කිසි දෙයකට සැලෙන්නේ නෑ, කිසිම දෙයකට දැන් ගාණක්වත් නෑ, ලොකු සැහැල්ලුවක් relax එකක් දැනෙනවා.

**උපාසිකාව:** දැන් ඇත්තටම සන්තෝසයි.

**ආර්යයන් වහන්සේ:** ඒකනෙ.

**උපාසිකාව:** වැඩක් නෑනේ මේ එකතු කරගත් ඒවා වැඩක් නෑනෙ. ඒවා ඔක්කොම දෙනකොට හිතේ සතුටක් තියෙනව.

**ආර්යයන් වහන්සේ:** ඇත්තටම ඔබතුමියට කියන්න මරණයක් හම්බ වෙන් නෑනේ. එක දිගට පොඩි කාලේ ඉඳන් තියෙන සිතක් නෑනේ, මේ දැන් සිත ඇතිවෙලා නැති වෙනවා.

**උපාසිකාව:** මරණය කියන්නේ සිතුවිල්ලක් නේ.

**ආර්යයන් වහන්සේ:** මරණය කියන්නේ සිතුවිල්ලක් විතරයි. පිස්සු හැදෙනව එතකොට. එතකොට හොඳටම පිස්සු. කවුද මැරෙන්නෙ කියලා අහනවා ඊට පස්සේ අනිත් අයගෙන්. ඇයි ඔයා මැරෙන්නෙ නැද්ද කිව්වම, මම කොයි වෙලාවෙද? ඇත්තටම අන්දුන් කුන්දුම් වෙනවා. දෙපැත්තටම හොයා ගන්න බැරිව. කවුද මැරෙන්නෙ කවුද ඉන්නේ කියලා. ආශ්චර්යයක් එතකොට නේද?

**උපාසිකාව:** ඒක තමයි.

**ආර්යයන් වහන්සේ:** ඒක තමයි, මේ ධර්මය මේ දීපය තුළ සැඟවිලා තියෙන හැටි, මාණික්‍ය වගේ. මේක අපිට සියවස් ගණනාවක්ම හම්බ වුණේ නෑ. මොකද අපිට පොඩි කාලේවත් ඇහුනෙවත් නෑ. මේ හෙළි කරන හෙළි කිරීම මහා ආශ්චර්යයක් ඇත්තටම. ඇත්තටම අපිට තේරෙනවා අපි හින්දා කියනවා නෙවෙයි අපිටත් තේරෙනවා මේක නම් මහා ආශ්චර්යයක්. මේ එළි කරන විදිහ.

**උපාසිකාව:** ආශ්චර්යයක්.

**ආර්යයන් වහන්සේ:** quantum කියනවා, තරංග කියනවා, ආත්මය හැදෙන හැටි කියනවා, ආත්මය නැති වෙන හැටි කියනවා, අම්මෝ ඇඟ හිරි වැටෙනවා සමහර වෙලාවට.

**උපාසිකාව:** මට මේක හරිම attraction එකක් ඇතිවුණා ඔබ වහන්සේ දාපු එක.

**ආර්යයන් වහන්සේ:** අපේ මාතෘකා ටික බලන්නකෝ. සිත කියලා දෙයක් නෑ, අමුතු ඒවා නේද? මට මම නැතිවෙන හැටි, සතිය කියන්නේ අපේ ගෙදර, අමුතු මාතෘකා ටිකක්නෙ වැටෙන්නෙ, ඇත්තටම අපිට දැනෙන දේ තමයි අපි දාන්නෙ. ලොවම දෙදරයි, හිත ඇතුළෙ ලෝකෙ දෙදරන්නෙ.

**උපාසිකාව:** ලොවම දෙදරණවම තමයි ඇත්තටම, ඒක නං හරිම මාතෘකාවක්.

**ආර්යයන් වහන්සේ:** ඇත්තටම ඒ අපි අර වීඩියෝ එක හදන කොටත් දෙදරණ විදිහට දානවා හදලා. අපිට පේනවා ඒක කොහොමත් දෙදරණව මොකුත් ඉතුරු වෙන්නෑ කියලා. ආයෙ මේ එකෙක්වත් ඉතුරු වෙන්නෑ කියලා දන්නවා. ඉතින් නමත් දානවා ලොවම දෙදරයි කියලා. අහන එක්කෙනාගෙ ඇත්තටම දෙදරලා වගේ තමයි. ඊට පස්සේ ටිකක් වෙලා කල්පනවා කරනව දේශනය අහල. උඩ බිම බල බල කෝමා වෙලා වගේ හිතා ගන්න බැරුව.

**උපාසිකාව:** හැබැයි තේරුම් ගන්නත් ටිකක් වෙලා යනවා. ඉබේටම තේරෙන්නෙ ඕන නිකං අහසින් වැටුණා වගේ තේරෙන්නේ.

**ආර්යයන් වහන්සේ:** සමහර අයට ඇත්තටම ලොකු කනේ පාරක් ගැහුව වගේ, ලොකු මාන්නෙන් ඔළුව ඉදිමිලා ඉන්න කොට මේ දේශනා අහපු ගමන් කනට පාරක් ගැහුවා වගේ හිරිවැටිල අපිට කෝල් එක අරන් කියනවා, ආර්යයන් වහන්සේ දේශනයක් ඇහුවා හිතා ගන්න බෑ මොනවා වුණාද කියලා, මෙහෙමයි කියලා කියනවා. එතකොට අපි කියනවා ගණන් ගන්න එපා ටික දවසක් යනකොට හරියයි කියලා. ඔව් ඇත්තටම අර මාන්නයෙන් තදින් අල්ලගෙන මැරෙන්නෑ කියල හිතන් ඉන්න කෙනාට ෂොක් එකක් එනවා. ඒක කුඩුවෙලා යනකොට ෂොක් එකක් එනවා, මෙතන කෙනෙක් නෑ සත්ත්වයෙක් නෑ පුද්ගලයෙක් නෑ. අනිත් එක අපි කියාගෙන යනවානේ වෙඩි තිබ්බ වගේ. දැන් ඔබතුමියටත් එහෙමනේ. මේක ආත්මය හැදෙන හැටි කියන කොට කටට එකක් දැම්මා වගේනේ. ඔව් ඒ එන විදිහට කියාගෙන යනව ඒකට හේතුව තමයි ඒවා නැත්නං හිත හිත කියන්නත් බෑ. ඒ අපිට දැනෙන විදිහට ඒ කියන්නේ. ඇත්තටම කියවෙනවා. ඇත්තටම ඒ එන ගැම්මට එහෙමම කියලා දානවා මිසක්

මේක හිත හිත කියනවා නෙමෙයි හැබැයි. දැන් ඔබතුමියට ඒක ආයෙත් ඇහුවොත් එහෙම තේරෙයි කියපු වේගෙ කොච්චර වැඩිද කියලා.

**උපාසිකාව:** ඒක මම ආයේ සැරයක් අහන්න ඕන.

**ආර්යයන් වහන්සේ:** ඔව්. ඒක ආපහු දාන කොට අහන්න. අපි කොහොමත් දානවා.

**උපාසිකාව:** ගොඩක්ම සන්තෝෂයි.

**ආර්යයන් වහන්සේ:** හොඳමයි එහෙනම්. තෙරුවන් සරණයි.

**උපාසිකාව:** තෙරුවන් සරණයි.

## 02

# අභිඥද්ඥදා ඥදානයක හසුවන පරම සත්‍යය 91

**උපාසක:** භාහියට කියන එක දිට්ඨ, සුත, මුත එතන ආර්යයන් වහන්ස අපි එක් ක්ෂණයක දකින තැනක් නේද පෙන්නන්නේ. ඒ කියන්නේ මේ මොහොතේ, ඒ කියන්නේ දිට්ඨ ඒ කියන්නේ නාමරූප හරි එන චිත්තය දකින තැන ඒ වර්ණයයි එන ශබ්දයයි ඒ දැනෙන ස්වභාවයට නේද එහෙමද දිට්ඨ, සුත, මුත කියල ඒකෙ අර්ථයෙන්ම එන්නේ.

**ආර්යයන් වහන්සේ:** එතන සූත්‍රයේම තියෙන්නේ දිට්ටේ දිට්ඨ මත්තං භවිස්සති කියලා.

**උපාසක:** ඔව්. එහෙම තියෙන්නේ.

**ආර්යයන් වහන්සේ:** "**විඥානේ විඥාත මත්තං භවිස්සති**" කියලා තියෙන්නේ. දුටුවා නම් දුටු දෙයක් නෑ කියලනෙ කියන්නේ. දුටු දෙයක් නෑ. දුටු දෙයක් නැත්නම් දුටු කෙනෙකුත් නෑ කියන එකයි කියන්නේ. එතකොට ඒතං මම, **ඒසෝහමස්මි, ඒසෝ මේ අත්තා** කියන්නේ, ඒ කියන්නේ ඒක තිබුණොත් මාත් ඉන්නව. ඉත්ත රූපනෙ, ඉති රූපනෙ ඉත්ත කියන එකනෙ ඔය ඒතං කියන්නේ, එතකොට **ඉත්තත්ත්වය** තමයි ඒතං ඒකම තමයි තථාගත කියන්නේ. ඒ කියන්නේ ඒකෙන් මිදීම තථාගත එතකොට ඉන් ස්වභාවයම තමයි තත් ස්වභාවය, ඒකම තමයි එතන **දිට්ටේ දිට්ඨ මත්තං භවිස්සති** කියන කොට ඒ ස්වභාවයම තමයි ඉත් ස්වභාවයම තමයි ඔය දෙයක් කියලා ගත්තොත් එතන මාත් ඉන්නවා.

**ඒතං මම, ඒසෝ හමස්මි, ඒසෝ මේ අත්තා**

**උපාසක:** දැන් ආර්යයන් වහන්ස අපි  මුලින්ම ඇත්තටම හිතුවේ දිට්ඨ කියන්නේ ඇස, ඒ පෙනුණ දේ පෙනුණා පමණයි, ඇසුණ දේ ඇසුණා පමණයි. දැනුණ දේ දැනුණා පමණයි. එහෙම නෙමෙයි මම කියන්නේ එතන තුනක් නෙමෙයි මේ එක චිත්තයක තියෙන කතාවක් නේද? එක මොහොතක, එක් ක්ෂණයක, එහෙමද වෙන්නේ.

**ආර්යයන් වහන්සේ:** දැන් ක්ෂණය කියන්නේ කොහොමද? දැන් එක අරමුණකනෙ ක්ෂණය තියෙන්නේ.

**උපාසක:** ඔව්. මං කියන්නේ එක අරමුණක නේද ඔය කාරණා තුනම.

**ආර්යයන් වහන්සේ:** එක අරමුණ කියලා ගත්තොත්, ඒ අරමුණ එක්කෝ ශබ්ද සිතක්. එක්කෝ වර්ණ සිතක්. ඒ ද්වාර හයෙන් තමයි අරමුණක් එන්නේ.

**උපාසක:** ඔව්. අරමුණ එන්නේ.

**ආර්යයන් වහන්සේ:** එතකොට ඒ අරමුණ, දිට්ඨේ දිට්ඨ මත්තං භවිස්සති කිව්වොත් ඒක දුටු දෙයක් නෑ. දුටු කෙනෙක් නෑ. එතකොට ඒක ඇසුණු තැනක් එතකොට ඇසුණු දෙයක් නෑ. ඇසුණු කෙනෙක් නෑ. එතකොට අනිත් අරමුණුත් එහෙම තමයි. ගන්ධයක් දැනුණත් ඒක දැනුණු දෙයක් නෑ. රසක් දැනුණත් රස කියලා එහෙම දෙයක් නෑ. ඒ කියන්නේ රසක් විතරයි ඒකෙ අන්නාසි රස උනොත් දෙයක් තියෙනවා.

**උපාසක:** ඒක තමයි ආර්යයන් වහන්ස. දැන් අන්නාසි ගෙඩිය අපිට මතකයට එනවා කියමුකෝ, එතකොට එතන වර්ණය තියෙනවා, ශබ්දය මේ පැත්තෙන් ශබ්දයකුත් එනවා, අන්නාසි කියන එක, ඒ කියන්නේ හිත ඇතුළෙන් එන එක, කටින් පිට කරන තැන නෙමේ මං කියන්නේ, වර්ණයක් එක්ක එන ඒ ශබ්දය ඒක දැනෙන ස්වභාවය නේද ඔය තුනෙන්ම කියන්නේ. ඒ කියන්නේ ආයතන හයේම එකතුව.

**ආර්යයන් වහන්සේ:** නෑ. නෑ. ඒක එහෙම ගන්න එපා. ඒක එතකොට වරදිනවා. ඒකට හේතුව තමයි දිට්ඨේ දිට්ඨ මත්තං, **සුතේ සුත මත්තං, මුතේ මුත මත්තං කිව්වට මේක එතන එතන එතන තමයි යං හි යං හි**

**තත්‍ර තත්‍ර විපස්සති** කියන දහමක් අපි දේශනා කරන්නේ, බුදුන් වහන්සේ දේශනා කරන්නේ.

එතකොට යං හි යං හි කියනකොට, තත්‍ර තත්‍ර කියන කොට එතන එතන දකින්නත් අරහත්ත සමාධිය පිහිටන්නේ එතන එතන. එතන එතන මිදීමක්. එතන එතන මිදීමක් නම් එතන ද්වාර හයෙන්ම ඒ කියන්නේ ප්‍රසාද වෙනවා. අරමුණු එනවා, එතකොට අරමුණු තමයි සිත කියන්නේ. එතන එතන සිතේ මිදීමක් තියෙන්නේ අරමුණේ මිදීමක්මයි. එහෙනම් එතන ආයතන හයම සිත මනෝ ද්වාරෙනුත්.

**උපාසකඃ** ඔව් ඒ කියන්නේ ආර්යයන් වහන්ස ඒක දැක්කම ආයතන හයේම නිරෝධය දකිනවනෙ නේද? එහෙමනෙ.

**ආර්යයන් වහන්සේඃ** ඔව්. ඒ කියන්නේ ආයතන හයම නිරෝධය කොහොමත් මේකෙ යටින් තියෙන්නේ, ඒ කියන්නේ මේ කතාවේ තව පැත්තක් තියෙනවානෙ. මේ කතාවේ **රාග, ද්වේෂ, මෝහ** කෙලෙස් සංසිඳෙනවනෙ. **ජානතෝ පස්සතෝ** නෙ. දකින කොට වෙන්නේ අභ්‍යන්තරයෙන් කෙලෙස් සංසිඳෙන එකනෙ. දැනෙන එක වෙනයිනෙ. දැනෙන්නේ **රාග, ද්වේෂ, මෝහ** කෙලෙස් සංසිඳෙන එකනෙ. ජානතෝ දකින එක වෙනයි දැනෙන එක වෙනයිනෙ. දකින්නේ යථාභූත ඥානය. දෙයක් නැති බවයි. නමුත් දැනෙන්නේ කෙලෙස් සංසිඳෙන බවයි. ගින්න නිවෙන බවයි.

**උපාසකඃ** කෙලෙස් සංසිඳෙන බව.

**ආර්යයන් වහන්සේඃ** එතකොට දැන් කෙලෙස් සංසිඳෙනවා කියන කොට කම්පනය වෙන් නෑනෙ. දෙයක් කියලා එන කම්පනය නෑනෙ. එතකොට සළායතන නිරෝධෝ කියලා තමයි ඇත්තටම මේකෙ එන්නේ. නමුත් ආයතන හයේම නිරෝධයක් තමයි සළායතන නිරෝධෝ කියන කොට අවසානේ උත්තරේ.

**උපාසකඃ** දැන් ඒ අරමුණ අන්නාසි ගෙඩිය හැදෙන්නෙම හයකින්නේ, හයේම එකතුවකින්නේ. එතන අර ප්‍රබල වෙන්නේ වර්ණයයි, ශබ්දයයි තමයි.

**ආර්යයන් වහන්සේ:** පටලව ගන්න එපා. පුබ්බේනිවාසානුස්සති ඥානය තමයි ඒ ආයතන හයම එකතුවෙලා දෙයක් ගන්න එකට තියෙන එතන අවබෝධය. පුබ්බේනිවාසානුස්සති ඥානය. එතකොට ඒක මේ මොහොතේ මේ මොහොතේ සිතක් මිසක් පෙර මතකයෙන් එන එකක් නෙවෙයි.

**උපාසක:** නෙවෙයි ඔව්.

**ආර්යයන් වහන්සේ:** ඒක මේ මොහොතේ වර්තමාන සිතක්. පෙර මතකය කියලා එකක් මේ ධර්මයේ අවසානයේදී අපි විග්‍රහ කරන්නෑ. ඒක අර මුලින් යෝගාවචර භූමියේදී ඒක තේරුම් ගන්න බැරිකමටයි ඒක කියන්නේ. අන්තිමටම එහෙම දෙයක් නෙවෙයි තියෙන්නේ. ඒ කියන්නේ අන්තිමට මේ ක්ෂණය මේ ක්ෂණයමයි. මේ ක්ෂණය හට ගන්න එක අර **පුබ්බේනිවාසානුස්සති** ඥානයෙන් තමයි අපට, අර ත්‍රිවිද්‍යා, නැතුව කවුරුත් නිවන් දකින්නෑ. ත්‍රිවිද්‍යා අනුව තමයි **පුබ්බේනිවාසානුස්සති ඥානය** නැතුව මේ මොහොතේ සිත දකින ක්ෂණ සම්පත්තිය එන්නේ නෑ. ඒ **චුතූපපාත ඥානය** හම්බවෙන්නේ නෑ. **පුබ්බේනිවාසානුස්සති ඥානය** නැතුව. **චුතූපපාත ඥානය** තමයි ඔය බුද්ධ ක්ෂණය තියෙන්නේ. මේ මොහොතෙ සිත දකිමින් මිදෙන තැන. එතකොට ඒක **පුබ්බේනිවාසානුස්සති ඥානය** කියන එක වෙනයි. **චුතූපපාත ඥානය** කියන එක වෙනයි. එතකොට ඒ දෙකම හේතුවෙනවා අර **ආසවඛය ඥානයට**. ක්ෂීනාශ්‍රව රහතන් වහන්සේ ගිය මග. එතකොට මේ තුන තුනක්. මේ තුන එකක් නෙවේ. එතකොට පුබ්බේනිවාසානුස්සති ඥානයෙන් තොරව අර විචිකිච්ඡාව දුරු වෙන්නේ නෑ. සැක සංකා තියෙනවා. ඒ විචිකිච්චා සැක සංකා දුරු වෙන්නේ මේ සිත හැදෙන හැටි දකින නිසා.

හැබැයි මෙතන ඔබතුමාට තියෙනව, තව තැනක් තියෙනවා. ඒක තමයි මේ ගිනි වළල්ල. එහෙම නැත්නම් බඹරෙ. ඒ කියන්නේ වේගයට මේ මේක අර අභිසංකරණය කියන එක ඒ කියන්නේ සංඥා අභිසංකරණය කියන එක. ඒ කියන්නේ මේ මොහොතේ බල්ලා පොකුණට එබෙන කොට පොකුණේ බල්ලෙක් කියලා බල්ලට පොකුණේ බල්ලෙක් පේනවා.

හැබැයි බල්ලා චබුණ නිසා පේනවා මිසක් පොකුණේ බල්ලෙක් හිටියේ නෑ. එතකොට මේක දැන් උපමාව, උපමේය තමයි අපි මේ මොහොතේ සිතක් හට ගත්තොත් අපි හිතන නිසා තමයි සිත තියෙන්නේ. අපි හිතන නිසා. ඒ කියන්නේ අපි හිතනවා මේ අඹ ගහ කියලා.

**උපාසකඃ** ඔව්. තේරුණා ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේඃ** අපි හිතන නිසා මිසක් ඇත්තටම එතන අඹ ගහක් පොල් ගහක් නෑ. අපි හිතනවා. එතකොට ලෝකේ අපි ඇස් අරින කොට ලෝකේ මේ මොහොතෙම ලෝකේ හදාගන්න එකක් මිසක් තියෙන ලෝකයක් නෙවෙයි. මේක සිතකයි සකස් වෙන්නේ. සිතක සකස් වෙනවා කියන එක චිත්ත කම්පනයක් මතයි තියෙන්නේ. මේක ටිකක් ගැඹුරු විග්‍රහයක්. ඒක ඇතුළෙ තියෙනවා. මේ මොහොතෙම මේක අර ආශ්වාස ප්‍රශ්වාස එක්ක දිගටම ගඟ වගේ එකම වේගයක් තුළ එකටම යන ගමනක් මේකෙ තියෙනවා.

ඒ කියන්නේ ඇතිවෙන නැතිවෙන ප්‍රවාහයක් වේගයක්. ඒ කියන්නේ ගඟ කියන්නේ දිගටම වතුර ගලන්න ඕන. දිගටම වතුර ගැලුවෙ නැත්නම් ගඟක් නෑ. එතකොට සිතක් නෑ දිගටම ස්පාක් වෙන වේගයක්, මේකෙ නැවතිලා නෑ. යම් තැනකට, ඒ කියන්නේ ආශ්වාස ප්‍රශ්වාස ආරම්භ වුණේ එතන ඉඳන්ම ස්පාක් එක තියෙනවා. මේ දැනුත් ඒ විදිහටම දිගටම දුවනවා.

ඒක බඹරෙ වගේ කැරකෙනවා. බඹරෙ කැරකෙන එක කොතනින් මොකක් ආවද කියන එක හිතා ගන්න බෑ. මේ මොහොතෙ සකස් වෙන එක මේ මොහොතෙ අර බඹරෙ කොතනින් ආවත් අර යට තියෙන තුඩ වගේ මේ මොහොතෙ සකස් වෙන එකක් විතරයි.

මෙතනදි අර අභිසංකරණය කියන්නේ අර ආරෝපණය. ආරෝපණය කියන්නේ අපි දිගටම ආරෝපණය වෙවී තියෙනවා. ඒ කියන්නේ අභිසංකරණය මේක වැඩි වෙවී යන එකක්. දෙවරක් චක්කරේ වගේ දෙක, හතර, හය, අට. දැන් පොඩි කාලෙ අපට තිබුණෙ ඩේටා ටිකයි. ඊට පස්සේ ඩේටා තව වැඩිවෙනවා. හට පස්සේ මේවට බැඳීමුත් ඒ වගේමයි. ඊට පස්සේ බන්ධන බලෙත් වැඩි වෙනවා. ඊට පස්සේ ලෝකයක් බැස

ගෙන තියෙනවා. දරුවො හිටියෙ නෑ ඊට පස්සේ දරුවොත් ඉන්නවා. නෝන හිටියෙ නෑ නෝනත් ඉන්නවා. ඊට පස්සේ දරුවොත් ඉන්නවා. ගෙවලුත් තියෙනවා. ඊට පස්සේ දැන් මේවා ඔක්කොම තියෙන මාත් ඉන්නවා. ඊට පස්සේ ඔක්කොම තදට තදට තදට වැඩිවෙලා වැඩිවෙලා ගලව ගන්න බෑ.

**උපාසක:** ඔව්. බලගැන්වෙනවා.

**ආර්යයන් වහන්සේ:** ඕකයි බඹරෙ කියන්නේ. බඹරෙ කියන්නේ ගලව ගන්න බැරි වෙන්න බලගැන්විලා තියෙනවා. ඕකයි භවය කියන්නේ. භවය, **පෝනෝභවිකා** කිව්වේ. දිගටම එකතුවෙවී තියෙන බලයක් හැදෙනවා. භවෙත් තියෙනවා අභිසංකරණයක් එතකොට. ඒ කියන්නේ භවේ ඒ මොහොතෙම ඇතිවෙලා නැතිවෙන, මේ ඔක්කොම කතාව තියෙන්නේ ඒ මොහොතෙම ඇතිවෙලා නැතිවෙන එක. නමුත් මේක අර ගිනි වළල්ල පේනවා වගේ එකට එකතු වෙලා පේන එක තමයි මේ **පෝනෝභවිකා** කියන ස්වභාවය.

එතකොට නන්දි රාග සහගතා කියන්නෙත් ඒ වගේම ස්වභාවයක්. ඒවත් ඔක්කොම එකට එකතු වෙලා ආත්මීය ආරෝපණයකට කොටුවෙලා ඉන්නේ. එතන එතන මේක සිද්ධ වෙනවා දකින එක තමයි තත්‍ර තත්‍ර එතන එතන අපිට ඇල්මකුත් තියෙන්නේ. ඇලෙන එක තණ්හාවේ ස්වභාවයනෙ. "**නන්දි රාග සහගතා**", "**පෝනෝභවිකා**, **නන්දි රාග සහගතා තත්‍ර තත්‍රාභී නන්දනී**" කියන එක. එතකොට එතන එතනත් ඇලවෙන ස්වභාවය තියෙනවා. හැබැයි දිගටම ඇලවී ඇලවී යනකොටත් මේක ඇලෙනවා කියන එක. මේක පුදුම විපරිනාමයක් තියෙන්නේ, අභිසංකරණයක් තියෙනවා මේක ඇතුළෙ.

දැන් ඔබතුමා කියන්න උත්සාහ කරපු දේ අතන ඒක එතෙන්ට ගන්න එපා. මොකද ඒක ධර්මෙට ගැළපෙන් නැති වෙනවා. ඒ කියන්නේ ආයතන හයම මේ මොහොතේ අරමුණෝ නිශ්ප්‍රභ වෙනවද? ඇත්තටම මේ මොහොතේ අරමුණ දැකලා මිදෙන එක ඒ මිදීම සිද්ධ වෙන්නේ සේරගෙම එක ස්වභාවයකින් මිදීමත් එක්කයි. එකපාරම මේක විතරක් මිදිලා අනිත් ඒව තියෙන එකක් නෑ. ඇත්තටම වෙන්නේ අර කෙලෙස් ක්ෂීනාශ්‍රව කියන්නේ, කෙලෙස් සංසිඳෙනවා කියන්නේ අර වතුර

පනිට්ටුවේ හිලක් තිබ්බොත් වතුර මට්ටම එක දිගටම පල්ලෙහාට බහිනවනෙ, අන්න ඒ වගේ තමා ආයතන හයේම.

**උපාසක:** දැන් ඕක ආර්යයන් වහන්ස, දැන් මට ඕක ආවේ කොහොමද දන්නවද? දැන් මං ඔතන මං හෙව්වා. ඒ කියන්නේ මගේ හිතේ මං දැන් ඔය අහගත්ත ධර්මය අනුව **දිට්ඨ සුත මුත** කියන එක ධර්මයම යළි මෙනෙහි කරලා ඒක ප්‍රශ්නයක් කරගෙන එතන හිතන්න ගත්තා. නැත්නම් අර හිත හැදෙන එකට මම දන්නවා. නමුත් මං ඒක යළි ඒ තැනට අහුවීමක් වෙන්නේ.

**ආර්යයන් වහන්සේ:** මේක මෙහෙම වෙන්න බැරිද කියලා පොඩි මනසිකාරයක් කරලා බැලුවා නේද?

**උපාසක:** ඔව්.

**ආර්යයන් වහන්සේ:** ඒක හොඳයි, ඒක හොඳයි ඒක අර සිහියෙන් කරන එක තමයි ගොඩක් හොඳ, දන්නවා උනාට කමක් නෑ. ඒක එහෙම කියමු කියලා ආයෙත් බැලුවා මේක වෙන්න බැරිද කියලා.

**උපාසක:** අන්න ඒකයි, ධර්මයම අල්ලා ගැනීම තුළ පොඩි අල්ලා ගැනීමක් එක්ක එතන ප්‍රශ්නයක් කර ගත්තා.

**ආර්යයන් වහන්සේ:** සිහියෙන් කරනවා නම් ඒක ගැටලුවකුත් නෑ. මේක දන්නව මේක හොඳටම වෙනමම පොඩ්ඩක් බලන්න ඕන කියලා.

**උපාසක:** ඔව්. ඔව්. ඒකයි. මං එතනදීම ඒක දකින කොටම එතෙන්ට වටිනාකමක් ඔටෝම, යම්න්ම දන්නව ඒක. දැනෙනවා ඒක.

**ආර්යයන් වහන්සේ:** ඒ කියන්නේ දැන් ඔය රස දැනෙන කොට ඒ රස දැනෙන එක රස දිවට දැනෙනවා එච්චරයි. නමුත් ඕකම කලිං ගැළපිච්ච එකක් ඇත්තටම ඒ මොහොතෙම ඒ ක්ෂණයෙම ස්පාක් වෙනවා. ඒ ක්ෂණයෙ මේක, මේක නේද කියන එක ටක් ගාලා එනවා. ඒ එන එක තමයි අපි ගාව තියෙන අර ඒ සිස්ටම් එකේ අර චිත්ත නියාමය තුළ පෙන්නන්නේ. චිත්ත නියාම, ඍතු නියාම, බීජ නියාම, කම්ම නියාම කියන්නේ. ඒ චිත්ත නියාමය පෙන්නන්නේ මේක මේ ක්ෂණයෙමෙ මේ ස්පාක් එක, අර අපි කිව්වේ තිස්තුන් දාහක් ස්පාක් වෙනවා කියලා

තාත්තට, ඒ කියන්නේ දත්ත බේස් එකම ස්පාක් වෙලා තියෙන්නේ එකක් නෙවේ.

ඒ බේස් එකේම එතකොට මේ මමය කියන එක ඔන්න ඔතන ඔය එනකොටම එක දෙයක් කරගෙන හිටියොත් මමය ඉන්නවා.

**උපාසකඃ** ඕ, මමය ඉන්නවා.

**ආර්යයන් වහන්සේඃ** ඕක හැබැයි එතන දෙයක් වෙන්නේ වටිනාකමක් දැනෙනවා නම්. ඒ කියන්නේ දෙයක් වගේ දැනෙන ගතියක්. ඕක පෙන්නන්න තමයි අපි අර කියන්නේ ටීවී එකෙත් පොත පේනවා, කණ්ණාඩියෙත් පොත පේනවා, චිත්‍රෙත් පොතක් තියෙනවා, ඇත්තටත් පොතක් තියෙනවා හැබැයි මේ ඔක්කොම ඇහැට ආවේ වර්ණ හැඩතලය විතරයි. ආලෝක හැඩතලය විතරයි. එහෙනම් ටීවී එකේ පොතක් තිබුණොත් නෑ. එතකොට චිත්‍ර පොතක් තිබුණොත් නෑ. පොතක් කියලා දෙයක් තිබුණෙ නෑ. හැබැයි පොතක් නෑ කියන්න බෑ පොතේ රූපේ තියෙනවා. රූප සංඥාව තියෙනවා, නමුත් පොතක් කියලා දෙයක් නෑ. වටිනාකමක් දැනෙන් නෑ. ටීවී එකේ පොතක් දැක්කම වටිනාකමක් දැනෙන්න බෑ. ඇත්තටම කණ්ණාඩියේ දෙයක් තිබ්බම වටිනාකමක් අපට දැනෙන්නේ නැතිවෙන්න ඕන. එතකොට චිත්‍රේ තිබුණමත් අපට වටිනාකමක් දැනෙන් නෑ. හැබැයි ඇත්තට තිබ්බොත් වටිනාකමක් දැනෙන්නේ කොහොමද? ඒක එන්න විදිහකුත් නෑ. ඇහැට ආවේ වර්ණ හැඩතලයක් නම් ඒත් වර්ණ හැඩතලයක් විතරයි. ඇහැට කවදාවත් දෙයක් වටිනාකමක් ඇවිල්ලා නෑ. වටිනාකමක් මෙහෙන් හැදෙන එකක්. ඇහැට ආවේ නෑ. එතකොට මේක හරියට දැක්කොත් එයාට පේනවා ඇහැට මේ අපිට මේ ඇත්තට දකින එකත් වර්ණයක් විතරයිනෙ.

**උපාසකඃ** එහෙමයි.

**ආර්යයන් වහන්සේඃ** ඇත්තට දකින එකෙත් දෙයක් නෑනෙ. මේක දකිනකොට අර කාලයක් තිස්සේ දෙයක් වගේ ගත්ත එක දිය වෙනවා. ඕකයි කෙලෙස් සංසිඳෙනවා කිව්වේ. දැන් දෙයක් කරගෙනමනේ එන්නේ කොහොමත්. ඒ දෙයක්, එන්නේම දෙයක් නේ. දෙයක් එන්නේ. දැන් මේක ශබ්දයක් නේ පොත කියන්නේ. දැන් මොන්ටිසෝරි යනකොට අර

දරුවට දැම්මේ ශබ්දයක්. ශබ්දයක් දාලා වර්ණයක් දුන්නේ. මේ දෙක එක දවසට ආවේ නෑ කොහෙවත්. හැබැයි ඕක නැවත නැවත නැවත ඕක වෙනව ස්පාක් වෙවී. ස්පාක් වෙවී, ස්පාක් වෙවී, ස්පාක් වෙවී අර ස්පාක් එකේ වේගේ වැඩි වෙනකොට අර බල්බ් එක ඇතුළෙ අර දඟරෙ ස්පාක් වෙලා ස්පාක් වෙලා ආලෝකයක් එනවා වගේ, ආ තියෙනවා කියලා ආත්මය එනවා. අභිසංකරණයකට එනවා. සංඥා අභිසංකරණය මහණෙනි ජීවත් වෙනවා කියන්නේ ඕක තමයි.

**උපාසකः** ඔව් ඔව්. ඒක තමයි.

**ආර්යයන් වහන්සේः** ඒ කියන්නේ ඝන සංඥාවක් එනවා. අර සක්කාය ගොඩට එකතු වෙලා ගොඩක් බවට පත් වෙනවා. ඒක දෘෂ්ටියක්. තියෙනවා වගේ දැනෙන, ගොඩට එකතු වෙලා තියෙනවා වගේ දැනීමක් එනවා. දැන් අපි සිංදුවක් අහනකොටත් ඕක තියෙනවා. අහනකොට අහනකොට එකම සිංදුව ඒක නිකම්ම මෙන්න ඊට පස්සේ නිකම් එනවා. සිංදුව නිකම් මිමිණෙනවා. එතකොට තේරෙනවා මේක ආවේ කොහෙන්ද මේක අභිසංකරණයෙන් එන්නේ. හිතල කියනවා නෙවෙයි. දැන් සමහර පිරිමි ළමයි සිංදු අහල අහල අහලා සිංදුව නිකම්ම කියවෙනවා. හැබැයි ඒ ළමයගෙන් ඇහුවොත් ඔයා මොකද ඔය සිංදුව කියන්නේ කියලා, ඒක දැන් නවත්ත ගන්න බෑනෙ එනවනෙ ඇතුළෙන් කියයි. එතකොට හේතුව අර අභිසංකරණය. අර ඒකම තමයි අර ගෑනු ළමයෙක්ගෙ රූපයක් එහෙම පිරිමි ළමයෙක් දැක්කම teenage වයසෙදි තරුණ වයසෙදි අර ඒක දැකලා දැකලා ඒක නැතුව බැරි වෙනවා. ඊට පස්සේ අනේ පණේ ඔයා නැතුව ඉන්න බෑ කියලා සියදිවි නසා ගන්නවා අන්තිමටම. අර අභිසංකරණයට ඇවිල්ලා. දැන් කවදාවත් දැකලත් නෑ. පොඩි කාලෙවත් දැකලත් නැති. අම්මට වැඩිය සමහර වෙලාවට ඒ ළමය ලොකුවෙලා දඟලනවා. හැමදාම දැකපු අම්මට වැඩිය අර පස්සේ ආපු ආකර්ෂණ බලය වැඩිකමට ඇලට් වෙලා ඊට පස්සේ නැතුව බැරි වෙනවා. දැන් කවදාවත් වෙනින් නෝනා කෙනෙක් හිටියෙත් නෑ. දරුවෝ හිටියෙත් නෑ. පස්සේ බලන්නකො අපට ඒ අය නැතුව බැරි වෙන්නෙ කොහොමද? අද සමාජය බැලුවම පේනවා නේ. ඊට පස්සේ දැන් මේ අය ගැට ගැහෙන්නේ, ඊට පස්සේ ඒ අය නැතුව ඉන්න බෑනෙ. ඊට පස්සේ ඒ අය නැතුව ඉන්න බෑ කිව්වම මෙයත් එහෙම, මෙයට මේ දේවල් හිතේනේ තියෙන්නේ. දැන්

මෙයාගේ හුස්ම කොයිවෙලාවේ හරි යනවනෙ. දැන් යනකොට කොහෙද හිතේ තියෙන ඒව තියෙන්නේ. තියෙනවද කොහේවත් නෑනේ. ඒකනෙ මේකෙ මායාව.

**උපාසකඃ** දැන් ආර්යයන් වහන්ස මං දැන් ඒ ධර්මය මෙනෙහි වුණා නේ. දැන් ඕක දෙපාර තුන්පාර කියද්දි එනවා. අර එතන තියෙන සිහිය තුළ තමයි ඒ කතාව තියෙන්නේ. ඒ කියන්නේ ඒ දේ උනේ මගේ සිහිය හින්ද එතැන දැනගැනීමත් එක්ක තමයි සිද්ධිය වුණේ. අර ඒක නැවතත් වෙනවා. ආර්යයන් වහන්ස මේ ධර්මය තුළම යළි යළිත් ඕක දැන් කාලෙකට ඕක තියෙනවා මෙනෙහි කරල මේ ධර්මය පැහැදිලිව එතකොට දකිනවා. අර ඒ මෙනෙහි කිරීම එනකොට, දැන් එතන සිහියකුත් තියෙනවා.

**ආර්යයන් වහන්සේඃ** මේක ඇත්තටම මෙහෙම දෙයක් තියෙන්නේ. ඇත්තටම ඒකයි මෙච්චර ප්‍රතිපදාව, **කෘතය ඥානය** කියන එක බුදුහාමුදුරුවෝ දේශනා කරන්නේ, ප්‍රතිපදාව, ආර්ය අෂ්ඨාංගික මාර්ගය දේශනා කරන්න හේතුව. ඒක **සම්මා ආජීව, සම්මා වායාම, සම්මා කම්මන්ත** මෙතන ඇත්තටම **සම්මා සතිය සම්මා සමාධිය** උපදිනවා. ඒකට හේතුව මෙතන දීර්ඝ කාලයක් අපි **අනුසෝතය** තුළ බාහිර ඇත් කරගත්ත **අභිසංකරණයකට** කොටුවෙලා ඉන්නේ. ඒක තුළ අපි, ඒක නිකං **සවිඥානික** මනසකින් ආත්ම කතාවක් නැතුව නිකං අර ෆිසිකලි එකක් දිහා බැලුවත් අපට පේනවා අර ගිනි බෝලයක් කරකවන කොට වළල්ලක් බලගැන්වෙනවා. වේගෙ කරකවනව වැඩි තරමටම වළල්ල හොඳට පේනව වගේ. මේකේ ඒ කියන්නේ මේකේ ඇත්තටම බඹරයක් කැරකෙන සිස්ටම් එක මේ උපමාව හොඳටම මේකේ පේනවා. ඒ කියන්නේ ආත්මීය ස්වභාවය පැත්තකින් තියලා **සවිඥානික** මනස, **අවිඥානික** මනසින් දැක්කොත් මේකේ ශබ්දය කියන්නේ **අවිඥානික** කතාවක්, වර්ණය කියන්නේ **අවිඥානික** කතාවක්, එතකොට **සවිඥානික** නෑ. ආත්ම කතාවක් නෑ. දැන් ශබ්දය තමයි මේ ඇවිල්ලා තියෙන්නේ. වර්ණය ඇවිල්ලා තියෙන්නේ. මේ දෙක එකට ස්පාක් එකක් ඇවිල්ලා තියෙනවා අර අහසෙ විදුලි කොටනවා වගේ සිස්ටම් එකක් මෙතන තියෙනවා.

මේක වේගය තුළයි මේක එකට එනකොට ඒක එකට දෙයක් වගේ ඇවිල්ලා ඒ ආපු දේ තමයි තියෙන්නේ, පොත තමයි තියෙන්නේ. ශබ්දෙත් නෙවෙයි වර්ණෙත් නෙවෙයි පොත තියෙන්නේ. පොත බිත්තිය ඒවා තමයි අපි යන්නේ අරගෙන. සංඥා අරන් යන්නේ. **"මනුසංච පටිච්ච ධම්මේසු උප්පජ්ජ මනෝ විඥානං"** කිව්වේ. ඒ කිව්වේ මේක දැන් දේවල් තමයි අරන් යන්නේ.

**උපාසක:** ආර්යයන් වහන්ස මට සමාවන්න, දැන් ආර්යයන් වහන්ස ඒ මනසිකාරය යනකොට මට දැනෙනවා මනසිකාරයම තමයි මම. මම කියලා කෙනෙක් ඉන්නවා නෙවෙයි, ඒ චිත්තය එතනමයි. මම මේ කයේ මමෙක් ඉන්නව මම කියලා මම ඒ මනසිකාරයම පමණයි එතන. එහෙම දැනෙනවා.

**ආර්යයන් වහන්සේ:** ඇත්තටම කය කියන එකත් සිතුවිල්ලක් විතරයි.

**උපාසක:** කය කියන එකත් සිතුවිල්ලක් විතරයි.

**ආර්යයන් වහන්සේ:** කණ්ණාඩියෙන් දැක්කත් කය කියලා හිතනව විතරයි. සිතුවිල්ලක් විතරයි. ඔව් මේක ආයෙ කොහේවත් තියෙනව කියන කතන්දර මුකුත් නැතුව ගත්තම හරිම ලේසියි. ඒ කියන්නේ මේක තියෙනව කිව්වොත් ඉතිං තියෙන්නේ එළියෙමනෙ, එතකොට එළියෙ මෙතන හැදෙනවා. නමුත් ඊට පස්සේ මෙම රූපෙ මමය කියලා ගැටගහගෙන තමයි වෙන් කරලා ඔය අරගෙන තියෙන්නේ. නමුත් මේක සිස්ටමැටිකලිම ඒක වෙනවා. ඒ කියන්නේ මේක හැබැයි දැන් **අනුසෝතය** තුළනෙ මේ දේවල් වගේ දැනෙන ගතිය තියෙන්නේ. දැනෙන ගතිය දෙයක් වගේ. හැබැයි මේක **අවිඥානිකව** ගත්තොත් **සවිඥානික** මනසින් නැතුව මේක සිස්ටර්මැටිකලි හැදෙන එකක් තමයි පේන්නේ.

**උපාසක:** ඔව්. ඔව්. එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** සිස්ටර්මැටිකලි, දැන් අපි චුම්භක ආරෝපණයට ආත්මයක් කියන් නෑනෙ. විද්‍යුත් ආරෝපණයට ආත්මයක් කියන් නෑනෙ. හැබැයි ධන සෘණ වයර් දෙක ස්පාක් කළොත් ෂෝට් එකක් වෙනවනෙ. එතකොට එතන විද්‍යුත්, මෙතන පේනවනෙ ශක්තියක් උපදිනව කියලා. ධනයි සෘණයි වයර් දෙක ස්පාක් කරාම ෂෝට් එකක් වෙනවනෙ.

ඒක ආත්මයක් කියන් නෑනෙ. හැබැයි එතන බලයක් හැදෙනවනෙ. ආලෝකයක් පිටවෙනවනෙ. ඒ වගේ දැන් චුම්භක ආරෝපණයම අපි ආත්මයක් කියන් නෑනෙ. හැබැයි ගලක් උඩ දැම්මොත් බිම වැටෙනවනෙ. ඒ කියන්නේ බන්ධන බලයක් තියෙනවනෙ. අතනත් බන්ධන බලයක් තියෙනවනෙ. මෙතනත් මෙන්න මේ වගේම සිස්ටම් එකක් විතරයි. ශබ්ද වර්ණ ඔක්කොගේම ස්පාක් වෙලා යන තවත් එක පොත වගේ ශබ්දය වර්ණය එකතු වුණු එක. මේක අලුත් අත්දැකීමක් වෙනවා. අර චුම්භක අත්දැකීම වෙනයි, විද්‍යුත් අත්දැකීම වෙනයි. චිත්ත අත්දැකීම වෙනයි.

හිත කියන්නේ මේ පොත, මේසේ, ඇඳ මෙන්න මේ ලෝක කතාවක්, ලෝක සංඥා කිව්වේ ඒකයි. ලෝක සංඥා තිබ්බොත් ලෝක සංඥා සකස් වෙනවා කියන්න හේතුව සිරස වගේ මේකත් අර ෆ්‍රීකුවන්ස් එකක් වගේ. මේ ලෝක සංඥා කියන එක. පොත, මේසේ ඇඳ කියන ලෝක සංඥා, ශබ්ද වර්ණත් එක්ක එකතු වෙලා නාම රූපත් එක්ක එකතු කරලා. එතකොට ඒක බැස ගන්න එක තමයි ඒ සංඥා තිබුණොත් උපදිනවා. ඒකයි **ගති නිමිති කම්ම නිමිති** කියලා ඔය චුති සිත කියලා කතා කරලා කියන්නේ. **මානීය මක්කටෝ අතිමානීය කුක්කුරෝ,** මානය නිසා බල්ලෙක් වෙනවා. ඔය කතා කියන්නේ ඔන්න ඔය ලෝක සංඥා. ඒ කියන්නේ සංඥාවක් තියෙන්න ඕන. සංඥාව තමයි මෙතනදි අර ඝන සංඥා සුකුම වෙනවා කියන්නේ බාහිර ඇත්තක් නොවන බව දකින කොට මෙහෙම දෙයක් නැති බව මෙනෙහි වෙන්න වෙන්න අභිසංකරණයට එනවා සත්‍ය අභිසංකරණයක් වෙනවා. අරක ඇවිල්ලා එන්නේ මායාව අවිද්‍යාව. විඥාන මායාව තමයි ඇත්ත වෙලා තියෙන්නේ බොරුව. නමුත් දැන් සත්‍ය එනවා. සත්‍ය තමයි අර අනිත්‍ය ස්වභාවය. ඒ කියන්නේ මේක **අනිච්චං භන්තේ** කියන එක. දෙයක් නැති ස්වභාවයක් අභිසංකරණය වෙනවා. ඒ කියන්නේ හැම මොහොතෙම අපි ඒක අතහරින එකක් වෙනවා. ඒ කියන්නේ උපාදානය වෙන් නෑ. හැම මොහොතෙම මෙතන මෙතන තත්‍ර තත්‍ර අන්න විපස්සනි කියන්නේ මිදෙනවා. එතන එතන චේතෝ විමුක්තියට පත්වෙනවා. එතන එතන විමුක්තියට පත්වෙනවා කියන්නේ එතන එතන නිවෙනවා. නිවීමයි. එතකොට ඒකමයි නිවන. හැබැයි නිව්ලා නිව්ලා නිව්ලා නිව්ලම ගියා කියන එක තමයි ඕකෙ තේරුම. ඒ කියන්නේ මෙතනම මෙතනම තියෙනව වගේ දැනෙන බන්ධන බලය එතැන හැමතැනම නිශ්ක්‍රීය වෙනවා. හැම මොහොතෙම හැම

සිතම නිෂ්ක්‍රීය වෙනවා. තියෙනවා කියන එක එන්නේ නෑ. අභිසංකරණය වෙන්නේ නෑ.

දැන් බැටිරිය චාජ් වෙන් නැති වුණොත් මොකද වෙන්නේ වාහනේ බැටිරිය අන්න එහෙනම් බැහැලා යනවා. අන්න උපාදානය වෙන්නෑ.

**උපාසකඃ** ඔව් ආර්යයන් වහන්ස, මට ඒක පැහැදිලි කරන්න තේරෙන්නෙ නෑ. මට කියන්න පුළුවන් එතන උපාදානයක් නෑ ඇවිල්ලා ඔහේ අර යන එකක් තමයි දැනෙන්නේ.

**ආර්යයන් වහන්සේඃ** ඒකයි උපාදානය වෙන්නෑ කියන්නේ. ඇත්තටම ඒක තමයි ආරිය විනය කියන්නේ. ආර්ය විනය කියන්නේ මෙතන මේකෙ මිදීම. මිදීමයි ආර්ය විනය. එතකොට **අරියානම් දස්සාවි** කියන්නේ මේක දකිනවා කියන එක. ආර්ය කියන්නේ මේ නාම රූප දෙකෙන් මිදෙන පච්චේපරිග්‍රහ ඥානයෙන් පස්සේ ආර්ය භූමිය.

එතකොට බාහිරෙත් දෙයක් නෑ සිතෙත් දෙයක් නෑ කියලා දැක්කොත් සිත පිහිටන්න තැනක් නැති වෙනවා. අන්න එතන විඥාන අනිදස්සන වෙනවා. එතනයි ආර්ය භූමිය. ආර්ය භූමියේ සත්වයෙක් පුද්ගලයෙක් නෑ. සත්ව පුද්ගල කතාවකුත් නෑ. දෘෂ්ටියකුත් නෑ. මෙතන සම්පූර්ණයෙන්ම තියෙන්නේ ශබ්ද වර්ණ මේක දකිනවා. හිත හැදෙන හැටි. දකින තැන උපාදානයක් වෙන්නේ නෑ. ඒ නාමෙත් දෙයක් නෑ. රූපෙත් දෙයක් නෑ. දෙපැත්තෙන්ම මිදිලා. එතකොට කොහෙවත් දෙයක් හම්බවෙන්නේ නෑ. ඒකයි ඒක පෙන්නුවේ. එතනයි ආර්ය භූමිය. නාම රූප උපරුජ්ජනය වෙන තැන.

"විඤ්ඤාණං අනිදස්සනං, අනන්තං සබ්බතෝ
පභං, එත්ත අපෝ ච පඨවි තේජෝ වායෝ න ගාධතී"

කියල ඊට පස්සේ කියන්නේ "එත්ථ නාමඤ්ච රූපංඤ්ච අසේසං උපරුජ්ජති"

නාම රූප දෙක බැස ගන්නෙ නෑ. ඒ විඥානෙ බැස ගන්නෑ. ඔය නාම රූපමනෙ විඥානෙ කියන්නේ. ඒකයි අර මහා නිධාන සූත්‍රයේ පෙන්නුවේ විඥානෙ නැතුව නාම රූපත් නෑ. නාම රූප නැතුව විඥානෙත් නෑ. ඔය මහා නිධාන සූත්‍රේ ඕක තමයි ගන්න තියෙන්නේ වෙන එකක් නෙවෙයි.

එතකොට නාම රූප කියන්නේ ශබ්ද වර්ණ ශබ්ද වර්ණ වලින් දෙයක් වගේ දැනෙන එකමයි විඥානය කියන්නේ.

ඕක දැන් තාම ඔය තියෙන දැනුම ධර්ම දැනුම පල්ලෙහාට ගිහිල්ලා ගිහිල්ලා කොතනකින් හරි නම් කරන ලද දේ නාමයයි කියලා ශබ්දය කියලා දැක්ක ගමන් නිවන් මඟට එනවා. ශබ්දයයි වර්ණයයි කියල දැනෙනකම් එන්නෑ. ඒකයි **දිට්ඨ සුත මුත** කිව්වේ. එතනින් තමයි ඒ දෙක එකතු වුණොත් කොහොමත් ඔක්කොම දේවල් වෙලා ඉවරයි.

**උපාසක:** දේවල් වෙලා ඉවරයි.

**ආර්යයන් වහන්සේ:** දේවල් වෙලා ඉවරයි. ඒ දෙක වෙන් වුණ ගමන් ඉවරයි. එතකොට ඕනෙ තව පැත්තකින් තියෙනවා ඔය දිට්ඨ සුත මුත අපි තාම නොකියපු පැත්තක් තියෙනවා. ඒක ඔය විග්‍රහය තුළ කියන්න බැරි නිසයි කියන් නැත්තේ, **දිට්ඨි, සුත, මුත, විඥාන** කියන එකේ තව විග්‍රහයක් තියෙනවා අපි ගාව. අභ්‍යන්තරයෙන් තියෙනවා.

# 3

# මනෝ විද්‍යාව අභිබවා යන අභිඥා ඥානය 92

**උපාසක:** අපි සාමාන්‍යයෙන් අර රැකියාවක් කරන ගමන්නේ ප්‍රැක්ටිස් කරගෙන යන්නේ ආර්යයන් වහන්සේගේ දේශනා. එතකොට සමහර තැන්වලදී ගැටලු ඇතිවන තැන් ගැටලු කියල කියන්නේ සමහරවිට මිස් මැච් වන තැන් එනවා, ඇත්තටම අපි හිතමු කවුරුහරි ඇවිල්ලා හෞතිස්ම පැත්ත හරි නැතිනම් පොසිටිව් තින්කින් පැත්ත හරි. ඔය පැත්ත දැන් ගොඩක් වෙලාවට ආයතනවල ක්‍රියාත්මක කරන දේවල් නේ. අලුත් කන්සෙප්ට් නේ. එතකොට කියනවා අර ඉනොවේෂන් පැත්ත මෙහෙමයි හරියන්නේ, එතකොට මොළයේ වම් පැත්තෙන් සිතුවිලි හැදෙනවා, මේ පැත්ත වර්ධනය වුණොත්, ඔන්න ඔහොම කියලා ටිකක් තියෙනවානෙ. සහ සමහර තැන්වලදී ඕවා කියල දෙන කොට සමහර වෙලාවට දැන් ඒවා අපිට ඉගෙන ගත්තට පස්සේ එතනින් එහා පැත්තට තව අර ට්‍රේන් ද ට්‍රේනර් පෝග්‍රෑම් කරන කොට ඒක ගිහිල්ලා තව තැන්වල අපට කියන්න වෙනවා. ඉතිං ඒකෙ ඇත්ත නැත්ත අපට තේරෙනවා. කොහොමද මේක වෙන්නේ කියන එක. ඉතිං ඔන්න ඔය ගැටලුව කොහොමද ස්වාමීන් වහන්ස ලිහා ගන්නෙ.

**ආර්යයන් වහන්සේ:** ඕක කියන්නේ හරියට දැනුමක් නැතුවයි. නූතන විද්‍යාව ඔය කියන ධනාත්මක චින්තනය අපි අබ ඇටේකට ගන්නවා. මෙන්න මෙහෙම. පොඩ්ඩක් බලන්න. මේ ඔය කියන එක්කෙනාගෙන්ම අහන්න මේ මොළේ වැඩ කරන්නේ සියයට එකයි. නැත්නම් දහයයි. ඉතුරු සියයට අනූව කොහෙද තියෙන්නේ කියල අහන්න. ඉතුරු සියයට අනූව තියෙන්නේ ප්‍රඥාව තුළයි. එයා ඒ කතා කරන්නේ සියයට දහයෙන් එකක් දෙකක් කොහොමද හැන්ඩ්ල් කරන්නේ කියන එක. අපි කතා

කරන්නේ සියයට අනූවක් හැන්ඩ්ල් කරන හැටි. මේ ඔක්කොම අබ්බවා ගෙන ගිය තැනකට එනවා. ඔය නූතන ඔය කතා කරන ධනාත්මක චින්තනය ඔය හදාගෙන තියෙන කන්සෙප්ට් එක ඔය සංකාර ගුලිය අපි නිකං කෙළ පිඬක් වගේ තුඃ ගාලා දානවා. ඒ කියන්නේ ඒ තරම්වත් ගැළපෙන්නේ නෑ.

**උපාසකඃ** ඔව්. ඒක පැහැදිලියි ස්වාමීන් වහන්ස. ඒක අනිවාර්යයෙන් අපි දන්නව. ඒ ලෙක්චර් එකක් අහගෙන ඉන්න කොටත් දැන් අපිට පොඩ්ඩක් අවුල් වගේ.

**ආර්යයන් වහන්සේඃ** එයාගෙන් අහන්න කොහොමද මේ විඥානය ඔස්සේ යන ස්නායු පද්ධතිය ඔස්සේ යන කරන්ට් එක එන්නේ කොහෙන්ද කියලා.

එයා කෑල්ලයි අල්ලන් තියෙන්නේ. එයාගෙ කෑල්ලෙ ඉතුරු ටික එකක්වත් එයා දන්නෙ නෑ.

දැන් ඇඟට ආවේගයක් එනකොට සාමාන්‍යයෙන් වොට් සීයක පවර් එකක් එනවා. වොට් සීයක පවර් එකක් කොහොමද අතට එන්නේ කියල අහන්න.

ඕරා එක කොහොමද අහන්න මේන්ටේන් කරන්නෙ. හියුමන් බොඩි එකේ එක කෑල්ලයිනෙ එයා කතා කරන්නේ. සියයට එකයිනෙ. අපි කතා කරන්නේ ඒක ගැන නෙවෙයිනෙ. අපි කතා කරන්නෙ සියයට අනූවක් සැඟවිලා තියෙන ශක්තිය එළියට ගන්න හැටිනෙ. ඔය ඔක්කොම නිකන් අර තේරුමක් නැති නිකං පිඹලා අරින්න පුළුවන් දූවිල්ලක් වගේ. ඒ කියන්නේ මෙතන ඔය කියන එකක් වෙන එකක් නෙවෙයි වෙන්නේ. මෙතන ආත්මයක් නෑ. ඔය ඔක්කොම කියන්නේ ආත්මයක් තියාගෙන.

**උපාසකඃ** අන්න හරි, ඔක්කොම කියන්නේ ආත්මය සහ මෙතන දෙයක් තියෙනවයි කියන තැන ඉඳලනෙ කතා කරන්නේ.

**ආර්යයන් වහන්සේඃ** කොහෙද එහෙම දෙයක් තියෙන්නේ. එයා දන්නේ නැත්තේ ඒකයි. එයා සියයට අනූවක් දන්නේ නෑ. එයා දන්නේ සියයට දෙකයි. සියයට දෙක එයා අනූවක් වහන්න හදනවා. කවදාවත් බෑ.

මස්තිෂ්කය ඇවිල්ලා රොබෝ. රොබෝ සිස්ටම් එකේ මේ මස්තිෂ්කය ඇවිල්ලා දකුණු පැත්ත වම් පැත්ත බැලන්ස් වෙන හැටි මේ ඇවිල්ලා කර්කජ කය රොබෝ සිස්ටම් එක විතරයි.

ඒක ඇවිල්ලා නිකම් මේ අත උස්සන හැටි, මේ පැත්තේ කන ඇහෙන හැටි, මේ පැත්තේ ඇහැ වැඩ කරන හැටි ඔය නිකම් මේ කර්කජ කය සිස්ටම් එක ඇතුළෙ තියෙන එකක් විතරයි. ඒක හියුමන් බොඩි එකට විතරයි ෆිසිකල් එක ඇතුළෙ තියෙන එකක් විතරයි. ඒක හියුමන් බොඩි එකට විතරයි ෆිසිකල් බොඩි එක විතරයි. අපි කතා කරන්නේ ආධ්‍යාත්මික පැත්ත. ෆිසිකල් බොඩි එක නෙවෙයි. එයා කතා කරන්නේ ෆිසිකල් බොඩි එක ආධ්‍යාත්මික පැත්තත් කලවම් කර ගෙන.

***උපාසක:*** අරකෙනුත් ටිකක් කලවම් කරගෙන.

**ආර්යයන් වහන්සේ:** නෑ. එයාට බෑ. එයා බොරුවක් වහන්න හදනව. දන්නව කියල කියන්න හදනවා. දන්නෑ එයා. එයා දන්නෑ ආධ්‍යාත්මික පැත්ත මොකක්ද වෙන්නේ කියලා. එයා දැනගත්ත බොරුව විඥාන මායාවෙන් ගේන එක, එයා හිතනව ඒක ඇත්ත කියල අරගෙන ඒ බොරුවෙන් මේක පැහැදිලි කරන්න යනවා. සත්‍ය පැහැදිලි කරන්න යනවා. කවදාවත් කරන්න බෑ.

ෆිසිකල් බොඩි එකට ටැබ්ලට් එකක් දුන්නම සුෂුම්නාව අස්සේ ෂුගර් එක වැඩි කරාම උඹ ඉන්නව මත්වෙලා වගේ. ඔය ෆිසිකල් බොඩි එක ඕක. ඕක අපිට වැඩක් නෑ. අපිට වැඩක් තියෙන්නෙ මොකක්ද ආත්මය කියන ආරෝපණයත් එක්ක අපිට මේ තියෙනව වේව් එකක්. ෆ්‍රීකුවන්ස් එකක්, සිරස වගේ දෙරණ වගේ අල්ලන වේව් එකක් එනවා. තරංග සිස්ටම් එකක් වැඩ කරනවා. අන්න ඒ සිස්ටම් එක නිෂ්ක්‍රීය උණේ නැත්නම් නැවත උපදිනවා.

මෙතන තියෙනවා වෙනින් කතාවක්, මෙතන ඇවිල්ලා අපිට ශබ්දයයි වර්ණයයි එකට එකතු වෙලා ශබ්ද තරංගයි වර්ණ තරංගයි චිත්ත තරංගයක් හැදෙනවා කියන එක මේ ඇඟ ඇතුළෙ ෆිසිකල් බොඩි එකේ කතාවක් නෙවෙයි. ඒකට තැනක් නෑ. ආලෝකයක් නැතුව මේක වෙන්නේ නෑනෙ. ජේනවා කියන එකක්. ස්පාක් එකක් කියන්නේ ඇඟ

ඇතුළෙ කතාවක් නෙවෙයි. මේ වර්ණ සිත කොහේවත් ඇඟ ඇතුළෙ නෑ. මෙයා ෆිසිකල් බොඩි එකේ එයා කියන විග්‍රහයට ගැළපෙන්නේ නෑ. ඒකෙන් එයා ඉවරයි. එයා පැත්තකට කළා.

දැන් අපේ කතාව තියෙන්නේ මෙතන කොහොමද එතකොට මෙන්න මේ හැදෙන ආරෝපණය. චිත්තාරෝපණය කියන එක. එතකොට මෙතන අපි දෘෂ්ටිය කොහොමද හැදෙන්නේ කියන එක. මමය කියන දෘෂ්ටිය හැදෙන්නේ කොහොමද කියන එක. මම කියන දෘෂ්ටිය හැදිලා තියෙන්නේ ශබ්ද වර්ණ එකතු වෙලා. වේගයෙන් ශබ්ද තරංග ස්පාක් වෙන වේගයට අර තප්පරයට කෝටි වාරයක් ස්පාක් වෙනවනෙ වර්ණේ. ඒ ස්පාක් වෙන එකටනෙ මේ අපිට මේ බලගැන්විලා තියෙනවා වගේ පේන එකක් නේ. මේක ඇඟ ඇතුළෙ එකක් නෙවෙයි නේ. ෆිසිකල් බොඩි එකේ කතාවක් නෙවෙයි. මේක එතකොට මෙතන ආලෝක හැඩතලය ඇවිල්ලා ස්පාක් වෙනකොට මෙතනින් ෆිසිකල් බොඩි එකෙන් වෙන්නේ මොකක්ද මෙතන ඕන කරන අර ඔපය එන්න ඕන කරන කණ්ණාඩියෙ ඔපය එන්න ඕන ටික විතරයි එන්නේ. ඔපය හදලා දෙනවා. ෆිසිකල් බොඩි එකෙන්. හදලා දුන්නම මොකද වෙන්නේ අර ඒකට තියනවා කම්ම, චිත්ත, ඍතු, ආහාර අර ප්‍රසාදය එන්න ඕන කරන රූප කලාප පනස් හතර හැදෙන හැටි. කම්මජ දශක දශක විදිහට අරගෙන මේක හරියට රසදිය වගේ. කණ්ණාඩියේ ගාන රසදිය තියෙන්නේ, ඒකෙන් ගෑවොත්නේ කණ්ණාඩියේ ඔපයක් එන්නේ. එහෙම උනොත්නේ අපිට කණ්ණාඩියෙන් හොඳට පේන්නේ. ප්‍රතිබිම්බයක් වැටෙන්නේ. අන්න ඒ වගේ ෆිසිකල් බොඩි එකෙන් වෙන්නේ රසදිය ගානවා වගේ සිද්ධිය විතරමයි. වෙන දෙයක් බලාපොරොත්තු වෙන්න එපා. ඊට පස්සේ පේනවා කියන එක රසදියට අයිති නෑ. කණ්ණාඩියට අයිති නෑ. පේනවා කියන එක වෙනම ඇවිල්ලා මැජිකල් එකක්. මිරකල් එකක්. ඒ මිරකල් එක ඇඟ ඇතුළට අයිති එකක් නෙවේ.

ඒ මිරකල් එකේ තමයි සිරස, දෙරණ වගේ අපි මේ කතා කරන එක. චිත්‍රපටිය වගේ ඒක. ඒක මේකට අයිති නෑ. මේක තමයි මෙතන ෆ්‍රීකුවන්ස් එක. ඒ කියන්නේ විඥාන මායාව කියලා අපි ගන්න මිරකල් එක. කොහෙවත් තියෙන එකක් නෙවේ. කණ්ණාඩියට වැටෙන ප්‍රතිබිම්බය කණ්ණාඩිය ඇතුළෙ එකක් නෙවේ. ප්‍රතිබිම්බය කොහෙටවත් අයිති නෑ.

**"නහිදං අත්තකථං බිම්භං නහිදං පරකථං අගං."** මේ ප්‍රතිබිම්භය තමන් හැදුවෙත් නෑ, වෙන අයෙක් හැදුවෙත් නෑ. **"හේතුං පටිච්ච සම්භූතා හේතු භංගා නිරුජ්ජති."** මේක ඇඟ ඇතුළෙ කතාවක් නෙවෙයි. මේ සිත ඇඟ ඇතුළෙ කොහෙවත් නෑ කිව්වේ ඒකයි. සිත තියෙන තැනක් නෑ. අන්තරීක්ෂය කියන්නේ අන්තරයක් ඇතුළෙ කියන එකයි. ඒ කියන්නේ ආලෝකයයි ඔපයක් දෙක අතර මැද්දේ නිර්මාණය වෙනවා. සම්භූත වෙනවා. සම්භූත වෙනවා කියන්නේ භූත කියන්නේ කොහෙවත් තියෙන එකක් නෙවෙයි. සම්භූත වෙනවා. **"හේතුං පටිච්ච සම්භූතා හේතු භංගා නිරුජ්ජති"** කියන කොට.

දැන් මේක ශබ්දයක්, ශබ්දයක් විදිහටත් කර්ණ සංඛ පටලය කම්පනය වන වේගය තප්පරයට කෝටි වාරයක්, චිත්තක්ෂණ කෝටියක් එක සිතක් කියන කොට වෙලා ඉවරයි. එතකොට ශබ්දය ශබ්දයක් විදිහටත්, අර මොන්ටිසෝරි දරුවට වගේ යෙලෝ, රෙඩ් කියන කොට අර ශබ්ද දානවනෙ වර්ණ දීලා නාමරූප කතාව අපි පෙන්නුවනෙ සරල කරලා පොඩ්ඩක්. එතකොට ඇහැක් ඒ විදිහටම ප්‍රසාද වෙනවා නෙ. වර්ණ විදිහට. ඒ ප්‍රසාදෙ ඇඟ ඇතළෙ එකක් නෙවෙයිනෙ. දැන් එයාගෙ කතාව ඉවරයි. අපිට ඒක වැඩක් නෑ. අපි අපේ කතාව කියමුකො.

දැන් මේ වර්ණ හැඩතලයත් ශබ්දයත් එක මොහොතෙ තප්පරයට කෝටි වාරයක් වෙනවා කියන්නේ එකට එන එකයි ස්පර්ශය කියන්නේ. ඒක කොහෙවත් ඇඟ ඇතුළෙ කතාවක් නෑ. දැන් ඔතනින් එහාට ඒ කතා අපට වැඩක් නෑ. අපිට මේ ඕන ස්නායු පද්ධතිය ඔස්සේ දුවන ස්නායුවල ආරෝපණ බලය කොහෙන්ද එන්නේ කියන එක. ඒකෙන් තමයි අපට මේ පවර් එක එන්නේ, කිලෝ සීයක පවර් එකකින් කාටහරි ගැහුවොත් මැරෙන්න. ඒක එනර්ජි එකක්. ඒක එන්නෙ කොහෙන්ද? ගොඩක් අය ඕක හින්දු අය කියනවා විශ්ව ශක්තියෙන් එන්නෙ කියලා. ඒකෙ වරදක් නෙවෙයි හැබැයි. ඒකෙ තියෙනවා ඒ ලින්ක් එක. මොකද මේකෙ තියෙන තැනක් නෑ. අංශු කම්පනයමයි මේ හැදෙන්නේ. අංශු කම්පනය කොහෙවත් තියෙන එකක් නොවෙයි. අර අපි කිව්වේ අංශු කම්පනය අකෝපා චේතෝ විමුක්තිය ම එන්නේ අංශු කම්පනය අකම්පිත වෙනවා. කම්පනය නැති වෙනවා. කම්පනය වෙනවා කියන්නේ ශබ්දය ශබ්දයක් වර්ණය වර්ණයක් කියන්නේ ශබ්දය කියන්නෙත් තරංග, හර්ට්ස් 20,

20000 කියන්නෙත් තරංග. එතකොට වර්ණය කියන්නෙත් තරංග රතුපාට කියන්නේ තරංග ආයාමය වැඩියි. ඒ කියන්නේ අංශු කම්පනය අර තීව්‍රතාව අනුව වෙනස් වෙනවා. ඒ අංශු කම්පනය ඇඟ ඇතුළෙ තියෙන එකක් නෙවේ. ආලෝකය ඇඟ ඇතුළෙ එකක් නෙමේ. ආලෝකය තමයි කම්පනය. ඒක තමයි එතකොට අංශු එක විදිහකට කම්පනය වන එකයි ආලෝක හැඩතල. එළියේ තියෙන එකක් නෙවෙයි. වර්ණ මෙතන හැදෙන්නේ. ප්‍රිස්මයක් ඇල්ලුවාම ඉර එළියට වර්ණ හතක් මැවෙනවා. වීදුරු ඝනකයක් හිරු එළියට ඇල්ලුවාම අපිට වර්ණ හතක් මැවෙනවා. දේදුන්නක් වගේ. හැබැයි ඒ වීදුරු ප්‍රිස්මයේ මැවෙන වර්ණ හත මේ එළියේ තියෙන එකක් නෙවේ. මේක නාභියේ නාභිගත වෙන්නේ. යෂ්ටි සෙල කේතු සෙල කිව්වේ ඒකයි. මෙතන මේ සිස්ටම් එකෙන් එනවා. නාභිගත වෙනවා. මේ ඇස කිව්වේ මේ ජේන බවට කිව්වේ ඔන්න ඔය නිසයි. එතන ප්‍රතිබිම්භයටයි මේ කියන්නේ. නාභිගත වීමක් ප්‍රතිබිම්භය කියන්නේ. තේරුණා නේද? ප්‍රතිබිම්භය කොහෙවත් වීදුරුව ඇතුළෙ තැනක් පනවන්න බෑ. එහෙම ප්‍රතිබිම්භය දෙයක් කරගන්නත් බෑ. එතකොට අපි ඇසුරු කරන්නේ මොකක්ද රත්තරං. රත්තරං කියන්නේ වටිනාකමක්. කොහෙන්ද ආවේ. ශබ්දයක්, ශබ්දෙ කොහෙන්ද ආවේ. කර්ණසංඛ පටලය හෙලවෙන ශබ්ද තරංග කියන්නෙත් අංශු කම්පනයක් විතරයි. වර්ණ තරංග කියන්නෙත් අංශු කම්පනයක් විතරයි. මේ ශබ්දය වර්ණය දෙක එකට එන එක තමයි දෙයක් වගේ අපිට එන්නේ, තව මෙතන වර්ණයි ශබ්දයි චිත්ත ස්වභාවයකින් අර නෙගටිව් පොසිටිව් අර ඉලෙක්ට්‍රෝන ප්‍රෝටෝන වගේ, චුම්භකය ධන සෘණ වගේ, මෙතන දෙයක් වගේ දැනෙන ගතියක් එනවා. කම්පන වේගය වැඩිකමට, අර ගිනි බෝලයක් කරකැවෙන කොට ගිනි වළල්ලක් ජේනවා වගේ, මෙතන ආරෝපණ බලයක් ඇති වෙනවා. මේ ආරෝපණ බලය අර චුම්භක ආරෝපණය විද්‍යුත් ආරෝපණය වගේ චිත්ත ආරෝපණය.

මේක ශබ්ද, වර්ණ, ඝන්ධ, රස, පහසත් එක්ක ස්පාක් වෙන වේගයටයි සිද්ධ වෙන්නේ. සෙන්සස් පහේම සිද්ධ වෙනවා. ඒක එකට ආවම හොයා ගන්න බැරි වෙනවා. ඒකයි ඉත්ත කියල තියෙනවා කියන එක. ඒකයි සක් කියන්නේ **"සක්කාය"** ගොඩම එකතු වෙලා තියෙන එකක් හැදෙනවා. පොත කියල තියෙන එකක් වගේ දැනෙන ගතියක් එනවා.

හැබැයි ඇහැට එන්නේ වර්ණයක්, පින්තූරෙ වගේ. කනට ශබ්දයක්, හැබැයි මේ ඔක්කොම දෙයක් වගේ දැනෙන ගතිය තමයි ආරෝපණය. මේක තමයි ස්නායු පද්ධතිය ඔස්සේ දුවන්නේ. මේකට තැනක් නෑ. මේක කොහෙද කියන එක තැනක් නෑ. මේක ඒක හින්ද තමයි හෘදය වස්තුවේ වෙන්න ඇති මේක උඩ එකෙන් වටේට පොම්ප වෙනවා ඒ වගේ ඒව උපකල්පන විතරයි. සංකාර විතරයි. එහෙම එකක් නෑ. තැනක් පනවන්න බෑ. එහෙනම් හිත තියෙන්නේ මොළේ නෙවෙයි හිත තියෙන්නේ හෘදය වස්තුවේ, ඔය අභිධර්මයේ පැහැදිලි කරන විදිහට, එහෙම දේකුත් නෑ. ඔක්කොම බොරු වෙනවා. බුදුන් වහන්සේ එහෙම දෙයක් දේශනා කරලත් නෑ. ඒක පෙන්නන්න එහෙම නිකන් උපකල්පන විතරයි. ඒක වෙන්නෙ නෑ. ඒකයි **"නහිදං අත්ත කතං බිම්භං නහිදං පරකතං අගං"** කිව්වේ. ඒකයි **"හේතුං පටිච්ච සම්භූතා හේතු භංගා නිරුජ්ජති"** කිව්වේ. මේවට තැනක් නෑ. එහෙනම් බුදුන් වහන්සේ කියල ඉවරයි.

බුදුන් වහන්සේ, **අස්ථි ඉමස්මිං කායේ කේසා ලෝමා, නඛා, දන්තා, තචෝ, මංසං, නහාරු, අට්ඨි, අට්ඨිමිඤ්ජා, වක්කං, හදයං, යකනං** කියල ඔය මස් කැටි ලේ කැටි ඔය තියෙන දියර අරව මේවා වෙන් කරනවා. කොහෙවත් මොළේ නෑ කියල බුදුන් වහන්සේ කියනව ආත්මය කොහේවත් නෑ කියල.

මේව ගැන හරියට අවබෝධයක් නැති නිසා ගොඩක් අයට තේරෙන්නෙ නෑ. මේ බුද්ධ වචනය ගොඩක් අයට අනුගත වෙන්න තේරෙන්නෙ නෑ. එතකොට ඒ කියන ඒවත් ඔක්කොම වරදිනව. ඔය විද්‍යාව අල්ලගෙන ඉන්න ඔක්කොම නිකං ඇත්තටම නිකං රොඩු කිව්වෙ ඒකයි. දූවිලි විතරයි. එයාට හැරෙන්නවත් බෑ. විඥාන මායාවෙ තියෙන එක එළියෙන් හොය හොය යන අයට කොහොමත් විඥාන මායාවෙ ඇත්ත දකින්නත් බෑ. ඇත්ත සමහරක් ගොල්ලන්ට හම්බවෙන්නෙ නෑ. එහෙම අය නිවන් දකිනවද විද්‍යාඥයෝ. ඒගොල්ලො නිවන් දකින්නෑ. බුදු සමයෙවත් වෙලා නෑ. එහෙනම් වෛද්‍යවරු කොච්චර හිටිය ද එහෙනම් නිවන් දකින්න එපැයි. එහෙම නිවන් දකින්න බෑ. මේක ඇවිල්ලා වෛද්‍ය විද්‍යාවට අයිති එකක් නෙවෙයි. මේක වෙනම වෙනම මහා නුවණකට අසුවෙන්නේ. ඒකයි මේක "**අභිඤ්ඤා පච්චවෙක්කිතබ්බං**." මේක ඇවිල්ලා අභිඥා ඥානයට හසුවෙන එකක්. ඒ කියන්නේ මේක අභිඥා කියන්නේ

මේ දැනෙන ස්වභාවය ඥානය කියන්නේ සිහියට අසුවෙන්නේ. සිහිය කියන්නේ ඔය විඥාන මායාවට නෙවෙයි. මේ සිහිය ඇවිල්ලා අර පුංචි දරුවගෙ ස්වභාවය. ඒ කියන්නේ මේ සිහිය නිකං ඇවිල්ලා සිතුවිල්ලක් නෙවේ. විඥාන මායාවක් නෙවේ. දැන් ලුණු කනකොට දැනෙනවා. ඒ දැනෙන එක විඥාන මායාව නෙවේ. ඒක පනවන්න බෑ කොහෙටවත්. ඒක මේක ඇතුළෙම ඒ කියන්නෙ මෙතනම මැවෙන මෙතනම ස්වභාවයෙන්ම මෙතනට දැනෙන ස්වභාවයක් නිර්මාණය වන එකක්. ඒකට නාම රූප නෑ. ඒ දැනෙන ස්වභාවයට නාම රූප නෑ. ඒ ඇවිල්ලා සිහිය ගැනයි කතා කරන්නෙ. මේ සිහිය මොකක්ද කියන එක. සිහියට නාම රූප පනවන්න බෑ. අර පුංචි දරුවට දැනෙන ස්වභාවයක් තියෙනවා. ඒකට, පුංචි දරුවට සිතුවිලි ඒකට පනවන්න බෑ. ඔය කතා කරන්නේ සිතුවිලි ඊට පස්සේ වෙන නිකම් අර අතුරු ඵල ගැන ඔය කතා කරන්නේ. අතුරු ඵල ගැන. ඒ අනුව තමයි ඊට පස්සේ දැන් මේ සේරම සිස්ටම් එක වැඩ කරන්නේ.

එතනින් එන උත්තේජය තමයි ඔතෙන්ට අර ගන්නේ ඊට පස්සේ, ඔතන ක්‍රියාත්මක වෙන්නේ මොකක්ද මේ එන ආරෝපණය මෙතනින් තමයි ද්වේෂය ඇති වෙන්නේ. වෛරය, රාගය, ද්වේෂය ඇලෙන ගැටෙන ස්වභාවය, දෙයක් කියලා ගත්තොත් විතරයි ඒක වෙන්නේ. ඒක ඔය මොළය ඇතුළෙ කතාවක් නෙවෙයි. මොළය ඇතුළෙ කතාවක් නෙවෙයි. එතනම ස්පාක් එක එතනම ආරෝපණය එතනම බලය එතනම බලය තුළ **"අජ්ජෝසායති තිට්ඨති"** එතනම **"යා රූපේ නන්දි"** නන්දි කියන්නේ බන්ධණ බලය, එතනම උපාදානය ජාති ජරා මරණ සේරම තියෙන්නේ. **"තදූපාදානං භවෝ"** දෙයක් කියල දැනෙන එක භවය අන්න ජාතිය ඒකමයි ජාතිය ජරා මරණ. මේ දෙයක් වගේ දැනෙන එකමයි මේකෙ තියෙන්නේ. වෙන දෙයක් නෑ.

දෙයක් කියලා එතන හම්බ වෙන්නේ නැත්නම්, අන්න දෙයක් කියල ගත්තොත් මෙලොව, ලෝක සංඥා දෙයක් කියලා ගත්තෙ නැත්නම් එලොව. මෙලොවයි එලොවයි දෙකෙන්ම මිදිලා සමව වාසය කරනවා සාමාන්‍ය විදිහටම මේ අවබෝධයක් ඇති වුණාම කිසිම කම්පනයක් එන්නේ නෑ. ආරෝපණය එන්නේ නෑ. ඕක ඔතෙන්ට ගාවන්න බෑ. එයා කතා කරන්නේ ෆිසිකල් බොඩි එකක් ගැන විතරයි. එයා ඒකෙන්

කියන්න හදනව මේක. එයාට කවදාවත් කරන්න බෑ. එහෙනම් එයා නිවන් දකිනවනෙ. ඒක වෙන්නෙ නෑ. ඔය ධනාත්මක චින්තනය ඒව මේව කියන ඒව චින්තන විතරයි. චින්තන මායාවක කොටුවෙච්ච නිකං හීන ඇතුළෙ හීන දකිනවා විතරයි. දවල් හීන බලනවා එච්චරයි. දවල් හීන බලලා ඒක ඇතුළෙ නිකං බොරුවට අමුතු විජ්ජාදාන්න යනවා. හැබැයි මේක ඔය විජ්ජාව නෙවෙයි. මේකෙ ඊට වැඩිය දෙයක් සිද්ධ වෙනවා. ඒක තමයි මේකෙ අර ආරෝපණය කුඩුවෙලා යනවා. ආරෝපණය කුඩුවෙලා යනකොට පොඩි **නිබ්බිදාවක්** එනවා. විරාගී ස්වභාවයක් එනවා. හැබැයි ඊට පස්සේ ඒක සමතික්‍රමණය වෙනවා. සමතික්‍රමනය වෙලා **සංකාර උපේක්ෂා ඥානයට** එනවා. එතකොට කිසිම දේකට කිසිම කම්පනයක් නැති මහා ශක්තියක් උපදිනවා. ඒ සදාතනික සුවය හා සමානයි. **ඒතං සාන්තං ඒතං ප්‍රණීතං.** එයමයි සාන්ත එයමය ප්‍රණීත කියල බුදුන් වහන්සේ පෙන්නුවේ ඒකයි. ඒ මහා සුවය ඒකයි. ඒ මහා සුවය ඒ පරම සත්‍යයි කියලා බුදුන් වහන්සේත් පෙන්නුවේ ඒකයි. එතනදි මොකද වෙන්නේ ඊට පස්සේ අඬන්න ඕන නම් අඬන්න, හිනාවෙන්න ඕන නම් හිනාවෙන්න, මැරෙන්න ඕන නම් බෙල්ල මෙතනින් ගහලා දාන්න. ඔයතරම් එනවා. පුදුම නිෂ්ක්‍රිය ස්වභාවයක් එනවා පුදුම ශක්තියක් එක්ක. ඒක මස්තිෂ්කය හරහා එන එකක් නෙවෙයි. සම්පූර්ණ බොඩි එක කන්ට්‍රෝල් කරන්න පුළුවන්, බොඩි එකේ කෑලි කපල ඕන නම් දෙන්නත් පුළුවන්. ඒ තරම් පවර් එකක් එනවා. ඒක ඇවිල්ලා පවර් එකක් නැති කමම පවර් එකක් වෙනවා. පවර් එකක් ඒකෙ නෑ ඇත්තටම. ඒකෙ තියෙන්නෙ නිව්ට්‍රල් වීමක්. ඒකයි නිවන කියලා පෙන්නන්නේ. එතන අංශු කම්පන ස්වභාවය නෑ. කිසිම දේකට කම්පනය වන ස්වභාවය නිශ්ක්‍රිය වෙලා තියෙන්නේ. ඒ නිවන් සිත. ඒ සංකාර උපේක්ෂා කියන එක.

ඕක ෆිසිකල් බොඩි එක ඇතුළෙ එකක් නෙවෙයි. ෆිසිකල් බොඩි එක කෑලි කෑලි කපල කාට හරි දුන්නත් ඒක හොල්ලන්න බෑ. ඒ ස්වභාවය ඇවිල්ලා මුළු විශ්වයේම තියෙන ස්වභාවයක්. ඒ බුද්ධ ස්වභාවය කිව්වේ ඒකයි. ඒ ස්වභාවය අංශු කම්පනය නොවන ස්වභාවය තුළ තිබෙන ඒම්ප්ටිනස් එක.

අංශු කම්පන ස්වභාවයනෙ බිග් බෑන්ක් කිව්වේ. බිග් බෑන්ක් කිව්වේ පරමාණුවක පිපිරීමක් නෙ. එක අංශුවක පිපිරීමක්නෙ, ඒක

තුළ වේගයක් නෙ, වේගය තුළ කැරකැවීම තුළ ස්ඵටිකයක් ඝනයක් පෘථිවියක් කියලත් පෙන්නුවානෙ. පෘථිවිය වේගය තුළ කැරකැවීමට ලක් වෙලා තාමත් පෘථිවිය කැරකෙනවනෙ. පැයට කිලෝ මීටර එකසිය අසූ හතක වේගයෙන්. ඒකනෙ උත්තර ධ්‍රැවය, දක්ෂිණ ධ්‍රැවය විදිහට ධ්‍රැව වෙන්නේ. ඒකනෙ සිසිල් වීම වෙන්නේ. පෘථිවි පෘෂ්ඨය අයිස් කැටේ වගේ කැරකෙන කොට කැරකෙන කොට හුළං හමනවා වගේ සිසිලක් දැනෙනවානෙ. ෆෑන් එක දැම්මම සීතලක් දැනෙනවනෙ. ඒ නිසානෙ ෆෑන් එක දාන්නේ. ඒ වගේ තමයි වේගය තුළ මේක කැරකෙන කොට එන සිසිල් වීම තමයි පෘථිවි පෘෂ්ඨය ඝන වෙලා තියෙන්නේ. ඒකයි ඇතුළෙ ලාවා තියෙන්නේ. ඒ පෘථිවි පෘෂ්ඨයේ ඝන වෙන්න හේතුව අයිස් කැටේ අර සිසිල් බීම තුළ ඝන වෙනව වගේමයි. හැබැයි ඒක තුළ උත්තර ධ්‍රැවය දක්ෂිණ ධ්‍රැවය ධ්‍රැවගත වෙනවා. චුම්භක ආරෝපණ බලය එනවා. ඒක තුළ ඕසෝන් ස්ථරය වගේ බලයක් හැදිලා අභ්‍යවකාශයෙන් වෙන් වෙනවා. ඒක තුළ තමයි පදාර්ථ මේ අංශු විදියට තමයි මේව සේරම මිශ්‍ර වෙලා අර හයිඩ්‍රජන් හීලියම් මේව ඔක්කොම අර කාබන් එක්ක වෙනවස් වෙලා තමයි මේ පදාර්ථ මේ විපරිනාමය තුළයි සිද්ධ වෙන්නේ.

අංශු කම්පනය වන ස්වභාවය ඇතුළෙ නැවත රීමික්ස් වීමක් තුළයි මේක වෙන්නේ. ඒ වචනෙ කිව්වොත් හරි නූතන වචන අපි භාවිත කළේ. එතකොට මේ සිස්ටම් එක ඇතුළෙ තමයි $H_2O$ වතුර ජලය කාබන් අංශු මේ සෑම දෙයක්ම නිර්මාණය වෙලා තියෙන්නේ. සූර්යයාගේ රස්නය වැඩි වුණොත් මේ ඔක්කොම අළු වෙලා ආයෙ අනිත් පැත්තට ගැහුවා. ඉවරයි. අංශු කම්පන ස්වභාවය වෙනස් වෙනවා. පවතින් නෑ. ආයෙ කොතනින් හෝ නිශ්ක්‍රීය වෙලාමයි පවතින්නේ. නිශ්ක්‍රීය වෙලා කියන්නේ අංශු කම්පන ස්වභාවය අකම්පිත ස්වභාවය මේක සිත ඇතුළෙන් දකින එකම තමයි එළියෙන් වෙන්නේ. සිත ඇතුළෙන් වෙන්නෙත් ඒකමයි. මේක අංශු කම්පන ස්වභාවයම තමයි අපිට ආරෝපණ බන්ධන බලයක් දෙන්නේ. තියෙනවා තියෙනවා. දරුවො ඉන්නවා. ගෙවල් තියෙනවා. ඉර තියෙනවා. හඳ තියෙනවා. අර ආපු ශබ්ද වර්ණ විතරයි මෙතන තියෙන්නේ. හේතුව ශබ්ද වර්ණ ඵලය ආත්මය, හේතුව ආයතන ආයතන නිරෝධය නිවන අන්න ශබ්ද වර්ණ ආයතන. ඇසේ උපතයි මහණෙනි උපත. **"ස්කන්ධානම් පාතිභවෝ ආයතනං පටිලාභෝ අයං උච්චති ජාති"**

ආයතනයේ උපතයි ජාතිය. ඕකමයි අන්න ලෝකය, සළායතන ලෝකය. චිත්තේන නියති ලෝකේ. සිත තුළ මැවෙන ලෝකය.

අපි සිතුවිලි වලින් නේ දුක් විඳින්නේ සැප විඳින්නේ. දැන් සිතේනෙ අපි ඉන්නේ. එළියෙ කතාවක් නෑනෙ. ඇස් දෙක පියාගෙන බැලුවොත් එළියෙ කළුවරයි ද ඇස් ගලවලා බැලුවොත් එළියෙ කළුවරයිද? මොකක්ද එළියෙ තත්වෙ. අපට අත්දැකීමක් නෑ. අපි දන්නේ ඇහේ විඥාන මායාවෙ කතාව විතරයි. ඕකෙන් දුන්න ආලෝකය රතුපාට නැත්නම් ඕකත් නෑ. කොළපාට නැත්නම් ඕකත් නෑ. මොකක්හරි තියෙන එක විතරයි.

කන් බෙරේ හිල් වෙලා නම් ශබ්ද නෑ. අපි දන්නෙ කන් බෙරේ කම්පනය වෙන එක විතරයි. ශබ්ද කියන්නෙ මේක ෆැන්ටසි එකක්. මේක මේ මොළය ඇතුළෙ කතාවක් නෙවෙයි. මෙන්න මෙතනයි කිව්වේ නූතන විද්‍යාව කියන්නේ රොඩ්ඩක් වගේ කියලා. ඇත්තටම කියන්න ගියොත් තව කියන්න ගියොත් ඕගොල්ලන්ට ඇඳුම් නැතිව යන්න වෙන්නේ. නාසා ආයතනයටත් වහලා යන්න වෙනවා කියන කොට මනෝ විද්‍යාඥයෝ කියන්නේ පිස්සෝ ටිකක් නේ. මුන් දන්න කෙහෙල්මලක් නෑ. ඕක බුදු දහමෙන් හොයා ගන්න ඕන එහෙනම්. නූතන විද්‍යාව ඔක්කොම ඕකයි කිව්වේ උන්මත්තකයො. මුන්ට මේ ලෝකේ දෙයක් නෑ. දන්නෙ නෑ මුකුත්. සත්‍ය අවබෝධයක් නෑ. ඇඟ ඇතුළෙ මෙහෙම දෙයක් නෑ කියලවත් දන්නෙ නෑ.

මේක අල්ලන්න පුළුවන්. මේක අපි ඉස්සරහට දානවා වීඩියෝස් එහෙම දානවා ටිකක් වෙනස් කරලා. ස්නායු පද්ධතිය ඔස්සේ එන අපේ හිතන සිතුවිල්ලක් තියෙනවනෙ. මේ සිතුවිල්ලත් සිරස දෙරණ වගේ තමයි. ඕක අල්ලන්න පුළුවන්. වේව් එකකට. ඇල්ලුවොත් තව තැනක සකස් කරන්නත් පුළුවන්. ඕකයි චිප් එකකට ගන්න පුළුවන් කිව්වේ. ඕකයි අනාගතේ හදන ටර්මිනේටර් වගේ රොබෝ වගේ එකක චිප් එහෙකට දැම්මොත් එහෙම මේ ඔක්කොම එක වගේ වෙනව කියල මොකක්හරි ආරම්මණයක් ආවොත් ඒ කියන්නේ ඉස්සරහට මොකක්ද එන්නේ ඒ විදිහට සීයක් හිටියොත්, දැන් මේ කොපීස් ගත හැකි නේ. චිප් එකකට ගත්තොත් චිප් විදිහට අර ෆෝන් එකට දානව වගේ සේරටම ගැහුවොත් වෙන්නේ අර සේරම ප්‍රතිචාර එකම විදිහට එනවා. ඇස,

කන, දිව, නාසය සෙන්සස්වල ප්‍රතිචාරනෙ තියෙන්නේ. ඔය ප්‍රතිචාරය අර ටර්මිනේටර් එකෙන් රොබෝ සේරම එක විදිහට දෙනවා. එතකොට මොකද වෙන්නේ. හරි එක්කෙනෙක් කොහේවත් නෑ. එකම සිස්ටම් එකකට වැඩ කරනවා. ඒකයි ඒකත්ත කායා ඒකත්ත සංඥා කිව්වේ. පුළුවන් නම් උතතර දෙන්න කියන්න.

ඒ කියන්නේ ආත්මයක් සත්වයෙක් පුද්ගලයෙක් මේ කතාව තුළ නෑ. සිස්ටම් එකක් විතරයි. ඒ සිස්ටම් එක සෙන්සස්වල සිස්ටම් එකක් තියෙන්නේ. ඒ සෙන්සස්වල සිස්ටම් එක දාන්න පුළුවන්. අනිත් ඔය රොබෝ වගේ හැදුවොත් ඒ මැෂින්වලට දාන්න පුළුවන්. ඇත්තටම වැඩි කාලයක් යන්නෙ නෑ. අපි දන්නව ස්ටිකර් එකක් අලවල ඒක දැන් හදල තියෙන්නේ. හදල තියෙන්නේ. ඒ කියන්නේ වෙනම ඔය ෆෝන් මුකුත් ඕන නැහැ. ඒකෙ තියෙනවා සර්කිට් එක. ඒකෙ තියෙන්නේ ස්නායුවලට ඒක සම්බන්ධ වෙනවා. සම්බන්ධ වුණාම අපි හිතන දේ එහෙමම අනිත් පැත්තට යනවා. කෝල් එක එච්චරයි. හිතන්න විතරයි තියෙන්නේ. වේව් සිස්ටම් එකක් තියෙන්නේ. තරංග සිස්ටම් එකක්. මේක එතකොට ඒකත්ත කායා ඒකත්ත සංඥා කියල කියන්නේ, එකම රොබෝ හැදුවා නම් එකම කය, එකම රූපෙ නම් එකම රූපේ. ඒකත්ත සංඥා කියන්නේ එකම විදිහට ප්‍රතිචාර දක්වනවා. මේ ආත්ම කතාවක් නෑ. ආත්මෙ බොරුවක්. හරි එක්කෙනෙක් කොහෙවත් හොයන්න හම්බ වෙන්නෙ නෑ. සිස්ටම් එකක් විතරයි තියෙන්නේ. දැන් ඔබතුමාගෙ ඇඟ ඇතුළෙත් ඔබතුමා නෑ. කිව්වේ ඒකයි. ඔබතුමාගේ ඇඟ ඇතුළෙ ඔබතුමා නෑ කිව්වේ ඒකයි. ඔබතුමාගේ ඇඟ ඇතුළෙ ඔබතුමා නෑ. ඇත්තටම ඔබතුමා කියලා කෙනෙක් නෑ. මෙතන සත්වයෙක් පුද්ගලයෙක් නැති බව අවබෝධ වීමයි. රහස තියෙන්නේ. ඔබතුමාට ඒක වෙලා නැති නිසා ඔබතුමාට ඒක තේරෙන්නේ නෑ. හරි නේ. ඕක තේරුණොත් රහත් වෙලා නේ. එහෙම වුණොත් අර කොපි ගහනව කියන එක එයාට සාමාන්‍ය දෙයක් වෙනවා.

**උපාසක:** සාමාන්‍ය දෙයක් වෙනවා ෆොටෝ කොපි ගහනව වගේනෙ.

**ආර්යයන් වහන්සේ:** ෆොටෝ ගහනව වගේ ඔබතුමාගෙ ඩුප්ලිකේට් ඒව ඕනතරම් තියෙයි. තව අවුරුදු දෙසීයක් යනකොට බලතහැකි. ඩුප්ලිකේට් තියෙයි හැමතැනම. ඩුප්ලිකේට් ද, ඔරිජිනල් ද හොයන්න බෑ. මොකද දෙකම එකයි. සිස්ටම් එකයි. ඕක බුදුන් වහන්සේ දේශනා

කරල තියෙනවා. මීට අවුරුදු දෙදාස් පන්සීයකටත් කලින්. ඒකත්ත කායා ඒකත්ත සංඥා කියලා ස්වභාවයක් ගැන. ඉතිං ඒ ස්වභාවය තියෙනවනෙ දැන් බලනකොට දැන් නූතනයේ ඒ ස්වභාවය හදන්නනේ හදන්නේ. දැන් කෝ විද්‍යාව? කොහෙද එතකොට. කෝ දැන් ආත්මෙ. කොහෙද ආත්මයක් තියෙන්නේ. **නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ.** බුදුන් වහන්සේගෙන් අහගන්න කියන්න ඔය කියන පණ්ඩිතයින්ට. අදටත් ඒ භාෂාව කියවෙනවා. නේද? ග්‍රීකුවන්ස් වෙච්ච අය නැතුවාම නෙවෙයි. ඒ බුද්ධ වචනය ඒ විදිහටම මෙතන මේ කර්කජ කය මැෂින් එකක් විදිහට භාවිත කරල ඒ වචන ඒ විදිහටම එළියට එනවා. ඒ ශබ්ද විදිහටම එළියට එනවා. පේනවා නේද ඒක.

**උපාසකඃ** ඔව්, ඔව්. ඇත්තටම ආර්යයන් වහන්ස පැහැදිලිවම ඒ වගේ දේශනා අහන්න බෑ. ඇත්තටම ඒක තමයි වෙලා තියෙන්නේ. ඇත්තටම අපිට යම්කිසි මට්ටමකට පැහැදිලි වෙලා තියෙනවනෙ. ඇත්තටම ඔබ වහන්සේගේ දේශනාවලින් තමයි. දැන් අරව ඇහෙන කොට හරි ප්‍රශ්නයක් වෙනවා.

**ආර්යයන් වහන්සඃ** මේක තමයි සැබෑම පොසිටිව් මයින්ඩ් එක. මොන පොසිටිව් මයින්ඩ්ද?

**උපාසකඃ** එතනින් එහාට කියන්න දෙයක් නෑනෙ. මොනව කිව්වත් එතනින් පල්ලෙහානෙ. දැන් එහෙම වුණාට පස්සේ ඒ දේවල් ඒගොල්ලන්ට පැහැදිලි කරන්න යන්නත් බෑ.

**ආර්යයන් වහන්සඃ** නෑ නෑ කියන්න පුළුවන්. ඒගොල්ලො දන්නවා. ගොඩක් අය දන්නව මෙතන ඔය කියන එක හරියන්නෙ නෑ. ඒකට හේතුව සමහර ඒවට උත්තර නෑ. ඒගොල්ලො ගාව.

**උපාසකඃ** එහෙම ඇහුවම, එහෙම දෙයක් කියලා, දැන් උදාහරණයක් විදිහට හිත ගැන කිව්වට පස්සේ, හරි ඕගොල්ලො කියන්න මේ සිත හැදෙන හැටි, මම කිව්වා සිත කියල දෙයක් නෑ කියලම කිව්වා. සද්දයක් නැතුව ඉඳලා වෙනම මගෙන් පුද්ගලිකව හම්බවෙලා ඇහුවා ඇයි ඔයා එහෙම කිව්වේ කියලා.

**ආර්යයන් වහන්සඃ** මේ දේශනය අහන්න කියන්න. හිත කියල දෙයක්

නෑ කියලා දේශනා තියෙනව කියන්න.

**උපාසක:** ඊට පස්සේ මම කිව්වා මෙන්න මේක ගිහිල්ලා බලන්න. මේකෙන් කරගන්න කියලා කිව්වා.

**ආර්යයන් වහන්ස:** සිත කියලා දෙයක් නෑ කියලා දේශනා මාලාවක් අපේ තියෙනවනෙ.

**උපාසක:** ඔව් තියෙනව තියෙනව. ඒක පැහැදිලියි. මම ඒක අහලා තියෙනවා.

**ආර්යයන් වහන්ස:** ඒක පොඩ්ඩක් අහල බලන්න පුළුවන් මොකක්ද ඒක කියන්නෙ කියලා.

**උපාසක:** අපිට වෙන ප්‍රායෝගික ජීවිතේ වෙන ගැටීම්.

**ආර්යයන් වහන්ස:** ප්‍රායෝගික ජීවිතේ අපිට ඇත්තටම ගැටීම් කියල දෙයක් නෑනේ. දැන් මේ ධර්මය අවබෝධ වුණාම මොකක්ද තියෙන ගැටීම.

**උපාසක:** නෑ නෑ. අපිට අර වෙන පාර්ශ්වයක් එක්ක හැන්ඩ්ල් කරන්න වෙනවනෙ ස්වාමීන් වහන්ස.

**ආර්යයන් වහන්ස:** දැන් ඔබතුමා හොඳට බලන්නකො. ඇහැට ආවෙ හැමදාම පොඩි දරුවට වර්ණනෙ. පුංචි දරුවට වෙන මුකුත් එන්නෙ නෑ නෙ. මොන්ටිසෝරියේ ඇයි එහෙනම් සද්දේ දාන්නේ, ඇයි මේ සද්දේ එහෙනම් ඇමරිකාවෙත් දාන්න එපැයි. එහෙනම් දැන් ඒක චීනෙ දාන්නත් එපැයි. ඇයි ඒ ශබ්ද ඒ වර්ණ. ඇයි මේ ශබ්ද මේ වර්ණ. ඇයි අර ශබ්ද අර වර්ණ. ඇයි ටාසන් වගේ කැලේ හිටියොත් ඒ ශබ්ද එන්නේ? කෝ දැන් ආත්මය කියන්නේ ශබ්ද වර්ණමයි. ආත්මය කියන්නේ දෘෂ්ටියයි. ඒ දෘෂ්ටිය ඇවිල්ලා අරමුණයි. ඒක ශබ්ද වර්ණවලින්මයි හැදෙන්නේ. ඒකයි බුදුන් වහන්සේ කෙළින්ම කිව්වේ **චක්ඛුං නිච්චං වා අනිච්චං වා අනිච්චං භන්තේ** කියලා. ඇස කියන්නේ ජේන බව. දැක්කේ පොත. පොත කියලා දෙයක් නෑ. ශබ්ද වර්ණ ඒකයි අනිච්චයි කියලා කිව්වේ. එහෙම දෙයක් නැතිකම. ඒක අවබෝධ කරන්න ඕන. ඇත්තටම අම්මා, තාත්තා, ගෙවල් දොරවල් සේරම ශබ්ද, වර්ණ. ශබ්ද වර්ණ ඔය ඔක්කොම

දාලා තියෙන්නේ ශබ්දයෙන්. වර්ණයක් ඇහැට ඇවිල්ලා තියෙන්නේ. වෙන මුකුත් මේ චිත්තෙක නෑ. එතකොට මොකක්ද වෙන්නේ, එහෙනම් දුකද මහණෙනි, දුකයි. ඇයි මොකක්ද දුක. ස්කන්ධ දුක්ඛා. දෙයක් හම්බවෙන්නෙ නැති එක. ස්කන්ධ දුක්ඛා කියන්නේ දුක නොවන දුක. දුක නොවන දුක කියන්නේ ඕකෙ දුකක් නෑ. ඒකට හේතුව දෙයක් නෑ. දෙයක් නෑ ලෝකේ. පුදුම කතාවක්.

ඊට පස්සේ බලන්නකො ආත්ම වශයෙන් ගත හැකිද? මහණෙනි එහෙනම් ඒක ආත්ම වශයෙන් ගත හැකිද නෝ හේතං භන්තේ. ඔය බෞද්ධයෙක් කියන්නේ ඔන්න ඕක දන්න කෙනාට. මේකෙ ආත්මයක් නෑ කියලා දන්න කෙනාටයි බෞද්ධයා කියන්නේ.

දෙයක් තියෙනවා නම් ආත්මයක් තියෙනවා. දැන් පොත කියන්නේ දෙයක්. දැන් පොඩි දරුවට කියනවනෙ, ශබ්දයනෙ දාන්නේ, මේක අඹ ගහ, ශබ්දයක් දානවා. දැන් ඉංග්‍රීසි ජාතිකයෙක් කිව්වොත් මේක මැංගෙ ට්‍රී නෙ කියන්නේ. එතකොට මෙතන අඹ ගහක් තියෙන්නෙ විදියක් නෑනෙ. එහෙනම් මැංගෝ ට්‍රී වෙන්න එපැයි. ලෝකෙ වැඩි හරියක් භාවිත කරන්නේ ඉංග්‍රීසි භාෂාවනෙ. එහෙනම් මැංගෝද මේක. අඹ ද මේක. දෙමළ එක්කෙනෙක් කිව්වොත් තව එකක් කියයි. ජපන් ජාතිකයෙක් හිටියොත් තව එකක් කියයි. ඔළුවෙ අත තියාගෙන ඉන්න වෙන්නේ. භාෂා ඔක්කොම බොරු නම් මේ සිත කියන එක ඇවිල්ලා ශබ්ද වර්ණයෙන් හැදුණ ඕක නිසා හට ගත්ත ආත්මීය ආරෝපණය දැනෙන එකයි හිත කියන්නේ. ඇඟ ඇතුළෙ එකක් නෙවෙයි. ශබ්ද වර්ණ කියන්නේ ශබ්ද කියන්නේ තරංග වර්ණ කියන්නේ තරංග. ඕනම විද්‍යාඥයෙක් මේකට දැන් කිව්වම තේරෙනවා. ශබ්ද තරංගයි වර්ණ තරංගයි එකතු වෙලා චිත්ත තරංගයක් හැදෙනවා කියන එක. ඒක සිරස වගේ ඕක අල්ලන්න පුළුවන්. ඕක ඇඟ ඇතුළෙ එකක් නෙවෙයි. ඕක තව තැනක චිප් එකක වගේ දාලා ගෙනියන්නත් පුළුවන්.

***උපාසක:*** එහෙමයි.

**ආර්යයන් වහන්ස:** මහ පුදුම කතාවක්. අරගොල්ලෝ තව අවුරුදු පනහක් යනකොට ඕගොල්ලො ආගිය අතක් හොයා ගන්න හම්බ

වෙන්නෙ නෑ. ඔය දැන් ඉන්න මනෝ වෛද්‍යවරු, ආගිය අතක් නැති වෙනවා. ඔක්කොම නිකං බොරුකාරයෝ වෙනවා. දන්න මඟුලකුත් නෑ, නොදන්න කෙංගෙඩියකුත් නෑ.

අර මස්තිෂ්කයේ තියෙන අර නිකං හෘදය වස්තුව ගැන පෙනහැල්ල ගැන දැන් ඉතින් ඉන්නවනෙ අක්ෂි වෛද්‍යවරු ඉන්නව, ඔය වගේ වෛද්‍යවරු අංශයෙන් අංශයට ඉන්නවනෙ. චර්ම රෝග විශේෂඥ වෛද්‍යවරු ඉන්නෙ. ඒ වගේ අක්ෂි වෛද්‍යවරු ඉන්නෙ, දන්ත වෛද්‍යවරුත් ඉන්නෙ නේද? ඒ වගේ තව අර මස්තිෂ්කය ගැන වෛද්‍යවරයෙක් විතරයි. ඉන් එහා කෙහෙල්මලක් නෑ එයා දන්නෙ.

දත් දොස්තර දන්නෙ දත් ගැන. චර්ම වෛද්‍යවරයා දන්නෙ සම ගැන, අක්ෂි වෛද්‍යවරයා දන්නෙ අක්ෂි ගැන. ඒ වගේ තමයි ඔය කියන මස්තිෂ්ක වෛද්‍යවරයා දන්නෙ මස්තිෂ්ක විද්‍යාව විතරයි. එයා ඒකෙන් ගළපන්න යනව සියල්ල. සියල්ල දත් සේ. එයා කරන්නේ බොරුවක්. එයාට ඒ දහම අවබෝධ වෙන්නෙ නෑ. එයාට අවබෝධ වෙන්නෙම එයා ඉන්න අර දෘෂ්ටියෙන් මිදෙන්න ඕන.

**උපාසක:** ඔව්. ඔව්. ඒක පැහැදිලියි.

**ආර්යයන් වහන්සේ:** එයා ඉන්න දෘෂ්ටියෙන් මිදුණ දවසට, මේකෙ තියෙන්නෙ ඊට වැඩිය වෙනස් සරල සිද්ධාන්තයක්. ඇත්තම කිව්වොත් අර ශබ්දයි වර්ණයි තමයි දිගටම යන්නේ. දැන් මේ පැත්තෙන් පිච්ච මල කිව්වොත් ඔය පැත්තට පිච්ච මලක රූපයක්නෙ මැවෙන්නෙ. එතකොට රූපයක් එන්නේ කොහොමද? මෙතනින් ශබ්දයක්නෙ ආවේ. එහෙනම් ශබ්දයි රූපයි අතර මොකක් හරි සම්බන්ධයක් තියෙන්නෙ එපැයි. එහෙනම් ශබ්ද කියලා දේකුත නෑ. රූප කියලා දේකුත් නෑ, මෙතන තියෙන්නේ අංශු කම්පන දෙකක් විතරයි. ඒ දෙක එකට එකතු වෙලා එක අංශු කම්පන ස්වභාවයකට එන එකයි ආත්මය කියන්නෙ. චිත්තය. ඕකයි දැනීම. ඕකට උපදිනවා කරන්ට් එකක් වගේ දැනෙන ගතියක් එනවා තියෙනවා වගේ. ඒකට උපදින කරන්ට් එක තමයි ස්නායු පද්ධතිය ඔස්සේ දුවන්නේ. ඕක හැදෙන හැටි කියන්න බෑ කිසිම විද්‍යාවකින්.

ඕකෙන බුදු කෙනෙක් ලෝකෙට හෙළි කරන්නේ. ඒක ටිකක් ගැඹුරුයි

නේ. ඔබතුමා බැංකු අංශයෙන් නේද කටයුතු කරනවා කිව්වේ.

**උපාසක:** බැංකු නෙවෙයි ස්වාමීන් වහන්ස පුද්ගලික අංශයෙ ඉන්නෙ.

**ආර්යයන් වහන්ස:** පුද්ගලික අංශයෙ, ආ කළමනාකරණය පැත්තෙ එතකොට නේද?

**උපාසක:** ඔව්. ඔව්. ඉතිං මේ ස්වාමීන් වහන්ස ඇත්තටම වටිනවා. ඊයෙ පෙරේදත් ඔක්කොම ඔබ වහන්සේගේ දේශනවා ටික අහනවා. ඇත්තටම සම්පූර්ණයෙන්ම ලොකු අවබෝධයක්.

**ආර්යයන් වහන්ස:** ප්‍රායෝගිකයි. ප්‍රායෝගික පැත්ත. ඇත්තටම පොත්වල තියෙන දේවල් ප්‍රායෝගිකව දැක්කහම තමයි හොඳටම දැනෙන්න ගන්නෙ.

**උපාසක:** ප්‍රායෝගික වෙච්චහම ඇත්තටම ඊයෙ පෙරේදා ඔබ වහන්සේ එක්ක නෝන මහත්තුරු වගයක් කතා කරපු දේශනා ටිකක් ඇහුවා. ඇත්තටම ප්‍රායෝගික දේශනාවක්. මීට පෙර මේ වගේ දේශනා අපි අහල තිබුණෙ නෑනෙ. ඔබ වහන්සේගේ දේශනා ඇරෙන්න හරියටම ඉලක්ක කරල හරි මාර්ගය කිසිදු අබ ඇටයක තරම්වත් විචිකිච්ඡාවක් හෝ සැකයක් නොහිතෙන මට්ටමකට මේ වගේ කරල තියෙන්නේ මේ දේශනා මාලාව විතරයි. අපිත් අර කිව්ව වගේ නොයෙක් දේශනා මාලාවල් ඇහුවා. ඇහුවට අපිට තේරුණේ නැහැනේ හරි මාර්ගයක් මෙන්න මේක තමයි පොයින්ට් එක කියන එක. මෙතෙන කිසි ගැටලුවක් නැතුව ඊය විද්ද වගේ මෙන්න පොයින්ට් එක මෙන්න මේකයි කියන එක කිසිම බාධාවක් නෑනෙ. ස්වාමීන් වහන්ස. ඕන කෙනෙකුට අහපු ගමන් පැහැදිලියි. ඇත්තටම සමාජයට කරන මේ බුද්ධොත්පාදම තමයි. ඒ වගේ දෙයක් තමයි දැනෙන්නේ.

**ආර්යයන් වහන්ස:** ඇත්තටම මේක මේ මනුස්සයාගේ ආත්ම ස්වභාවයට මේක දරා ගන්න බැරි, නැත්නම් මේ බුද්ධ ස්වභාවය තුළ ආත්මයක් නෑ, සත්වයෙක් පුද්ගලයෙක් නෑ. මේක මේ මනුස්සයෙකුට එකපාරටම තේරෙන්නෙ නෑ. හැමෝම ආත්ම සංකල්පය ඇතුළෙ ඉන්නෙ.

ආත්ම දිට්ඨියෙන් මිදෙන එක ලේසි නෑ. ඕකෙන් මිදෙනවා කියන්නේ

කෙළින්ම, මේ සංඥා සකස් වෙන්නේ නෑ උපදින්නවත්. මේ උපදිනවා කියන්නේ ෆ්‍රීකුවන්ස් එක වගේ අහුවෙන එකක්.

**උපාසකඃ** ඒක පැහැදිලියි. ඉපදීමක් ඇතිවෙන්නේ කොහොමද කියන එක දැන් පැහැදිලියි. කොහොමද ඒක වෙන්නේ කියන එක අර ටික විශ්ලේෂණය කරන කොට ඉපදීමක් නැතිවෙන හැටි අපට පැහැදිලියි.

**ආර්යයන් වහන්සඃ** අභිඥා දේශනාවල හෙළි කරන්නෙ ඒ ටික.

**උපාසකඃ** ඒ ටික තමයි. අර නැවත ඉපදීමක් වෙන්නෑ කියල තියෙනව. එතන මේ ටික නවතින කොට නැවත ඉපදීමක් වෙන්නෑ කියල පේනවනෙ.

**ආර්යයන් වහන්සඃ** ඇහෙනවද, ඇයි මෙතන සිතම මිදිලනෙ. මේ එන සිත ඇත්තක් වෙන්නේ නැති කොට එන එන සිත ඇත්තක් වෙන්නේ නෑ. දෙයක්වත් නෑ.

**උපාසකඃ** විඥානය පටිච්ච වෙන්න තැනක් නැතිවෙනවා අන්තිමට. ඒකනෙ වෙන්නේ.

**ආර්යයන් වහන්සඃ** ඔව්. විඥානය අනිදස්සනං. අනිදස්සන වෙනවා. අනන්තං සබ්බතෝ පභං කිව්වේ ඒක තමයි. හොඳයි ඔබතුමාගෙ ඒ ඉස්මතු කිරීමත් ගොඩක් වටිනවා. ඔය වගේ ඉන්නවනෙ හිරවෙච්ච තැන්වල අය නිදහස් වෙන්න හේතුවක්. හොඳයි, හොඳයි. තෙරුවන් සරණයි.

**උපාසකඃ** තෙරුවන් සරණයි. ස්වාමීන් වහන්ස.

# 4

# වෛද්‍ය විද්‍යාව අභිබවා යන අභිඥා ඥානය 93

**උපාසක:** ස්වාමීන් වහන්සේ මේ වෙලාවේ කතා කරන්න පුළුවන්ද?

**ආර්යයන් වහන්ස:** මේ ස්වාමීන් වහන්සේ නමක්ද?

**උපාසක:** නෑ ආර්යයන් වහන්ස. මම මීට කලින් කතා කරල නම් නෑ. මම ඔබ වහන්සේගේ ධර්ම දේශනා නම් අහනවා. දැන් ටික දවසක ඉඳලා. ඒක නිසා මම ඔබ වහන්සේට කතා කරන්න ආසාවකුත් තිබුණා. මම විවාහක එක් කෙනෙක්. ළමයි ඉන්න.

**ආර්යයන් වහන්ස:** ඔබතුමා කොයි පළාතෙද?

**උපාසක:** මම නුගේගොඩ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්ස:** වයස කීයද?

**උපාසක:** හතළිස් හතක් විතර වෙනවා.

**ආර්යයන් වහන්ස:** මොනවද කරල තියෙන්නේ.

**උපාසක:** මම වෛද්‍යවරයෙක්. කැන්සර් හොස්පිට්ල් එකේ.

**ආර්යයන් වහන්ස:** ඔබතුමාගේ අදහස මොකක්ද?

**උපාසක:** ඇත්තටම ස්වාමීන් වහන්ස මම දැන් ඊයෙ අපට දැනෙන දේ දකින දේ මැවෙන දේ බොරුව කියන එක, මම ඉස්සර ඉඳන්ම බණ

අහනවා. අපේ ස්වාමීන් වහන්සේලාගේ, නමුත් මට මේක ඇත්තටම මට ෆිල්ම් එකක් බල බල ඉන්න කොට තමයි මට තේරුණේ බොරුවක ඉන්නෙ කියලා අපි. ඊට පස්සේ මේ ධර්ම දේශනාවක කවුරුත් එහෙම කියනව මට ඇහුණෙ නෑ. නමුත් අර සාමාන්‍ය විදිහේ ධර්මය දේශනානෙ අහන්නේ අපි.

නමුත් ඔබ වහන්සේට කලින් ස්වාමීන් වහන්සේලා කීප දෙනෙක්ගෙන් මේ අදහස මම ධර්ම දේශනාවල අහල තියෙනවා. නමුත් අර ප්‍රතිපදාව විශේෂයෙන්ම ඔබ වහන්සේගෙන් තමයි මම අහන්නේ.

දැනුත් අහ අහ ඉන්නේ මේ දවස්වලත්. අර අපට තියෙන එකම ප්‍රශ්නේ අපේ ගිහි ජීවිතෙත් එක්ක වැඩ කරන කොට අපට ඒකට යොමු වෙන්න ඒකට කන්සන්ට්‍රේට් කරන්න සමහර වෙලාවට අපහසුතාවක් තියෙනවා වැඩ එක්ක. වැඩවලට යොමු වෙන්න එපැයි. ඒක නිසා අපහසුතාවක් තියෙනවා.

නමුත් මම හැම වෙලාවෙම පුළුවන් වෙලාවට ඒක පොඩ්ඩක් විවේකීව තමයි මේක මට පහසු කරන්න මං ඉතිං පුළුවන් හැම වෙලාවෙම මේකට යොමු වෙනවා.

**ආර්යයන් වහන්සඃ** වෛද්‍යතුමනි, ඒක පොඩි පටලැවිල්ලක් තියෙනවා. ඒ කියන්නේ බැලූ බැල්මට කෙනෙකුට හිතෙන්නෙ ඔහොම තමයි. ඒත් ඇත්ත කතාව ඕක නොවෙයි. ඇත්තටම මේකට මේ වෘත්තීය ඒව මේව එකක්වත් බලපාන්නේ නෑ.

ඇත්තටම ඒක දැනෙනන් ඕන. මේකෙ වෙනම කතාවක් තියෙන්නේ. ඒක අහුවෙලා නෑ ඔබතුමාට අපිට ඒක දැනෙනවා. ඒ කියන්නේ මේ හැමදේකින්ම කරන කිසිම දෙයක් මෙතනට අදාළ නැති ස්වභාවයකට තමයි මේ අවධි වෙන්නේ. සාමාන්‍යයෙන් වෙනදා විදිහටම කතා කරන වැඩ කරන එකක්වත් මෙතනදි අදාළ නෑ. වෙනස්ම ස්වභාවයක් තමයි මේ අවධිය කියන එක. මේ අවධිය කියන ස්වභාවයට එන එක තමයි ගොඩක් අයට තේරෙන්නේ නැත්තේ.

ඇත්තටම කිව්වොත් මැදින් අල්ලගෙන වගේ එහෙම නැත්නම් පොඩි කාලෙම ජොබ් එකක් කරන්න ගියා වගේ තමයි ඔය ඔබතුමා දැන් ඔය හිත දකින විදිහ.

**උපාසකः** වෙන්න පුළුවන්.

**ආර්යයන් වහන්සේः** ඒ කියන්නේ ඒකෙදි හිතෙන්නේ ඔහොම තමා. ඔබතුමා ඔය කියපු විදිහ. ඒ කියන්නේ එතකොට හිතෙන්නේ මේක දැන් හිත දකින්න ඕන මේකත් හිත දකින්න වන, හැබැයි ඒක පොඩි ළමයි සෙල්ලම් කරනව වගේ වැඩක් අපි කියන්නේ. එහෙම එකක් නෙවෙයි මෙතන තියෙන්නේ. මෙතන තියෙන්නේ, ඇත්තටම සද්ධර්ම ශ්‍රවණය තුළ මේක විසඳෙනවා සම්පූර්ණයෙන්ම. සම්පූර්ණයෙන්ම විසඳෙනවා. ඒ කියන්නේ ඔය දකින එකත් දකිනවා නෙවෙයි, මේ අන්තිමට යන සාකච්ඡාවල ඔබතුමා ඇහුවා නම් සමහරවිට ප්‍රශ්නය විසඳෙනවා. විසඳෙන්න ඕන. ඒකට හේතුව ඔබතුමා අහලා වැඩි කාලයක් නෑ වගේ.

**උපාසකः** ඔව්. ගොඩක් කාලයක් නෑ. ස්වාමීන් වහන්ස.

**ආර්යයන් වහන්සේः** අපේ දේශනා කීපයක් වගේ අහලා තියෙනවද? දහයක්?

**උපාසකः** ඔව්. ඒ වගේ ප්‍රමාණයක්.

**ආර්යයන් වහන්සේः** ඔව්. ඒ කියන්නේ මේකෙ ලොකු රහසක් තියෙනවා. මේක ඇතුළේ. ඒ කියන්නේ මෙතන දර්ශනයෙන් තමයි ඒක පැහැදිලි වෙන්නේ මොකක්ද මේ කියන්නේ කියලා. ඒ කියන්නේ, මේක දැන් කොහොමද වෛද්‍යතුමාට හොඳට ගළපලා දෙන්න ඕනකමක් තියෙනවා. මේ කතාව. ඒ කියන්නේ ඔබතුමා හිතන තැන නම් නෙවෙයි මේ කතාව තියෙන්නේ, ඒ කියන්නේ මේකෙ සිහියක් තමයි මෙතන අවධි වෙන්නේ, මේ සිහිය තමයි ඇත්තටම වැදගත් වෙන්නේ. හැබැයි මේ සිහිය සාමාන්‍ය සිහිය නෙවෙයි සම්මා සතිය කියන එක. සාමාන්‍ය සිහිය නෙවෙයි. මේක දර්ශනය තුළින් මතුවන සිහියක් එන්නේ. දර්ශනය

තුළින් ඇත්තටම, දැන් මොනව කිව්වත් ඇත්තටම වරදිනවා හැබැයි, ඒ කියන්නේ මේක හොඳට ගැළපුණාට පස්සෙයි මේක තේරෙන්නේ. ඇත්තටම අපි දර්ශනය තුළ ඔබතුමාට ඇහුණා නේද මේ ශබ්දයයි වර්ණයයි එකට එකතු වෙලා ශබ්ද තරංගයි වර්ණ තරංගයි එකට එකතු වෙලා චිත්ත තරංගයක් හැදෙනවා කියපු එක.

**උපාසකः** එහෙමයි. දර්ශනය මට හොඳට මතකයි.

**ආර්යයන් වහන්සේः** දර්ශනය තුළ ඔබතුමාට වැටහුණාද මෙතන ශබ්ද වර්ණ කියලා තියෙන්නේ.

**උපාසකः** එහෙමයි.

**ආර්යයන් වහන්සः** ශබ්ද වර්ණ හැබැයි මෙතන දෙයක් වගේ දැනෙන එක ඒක නේද මායාව.

**උපාසකः** එහෙමයි, ඒක මට හොඳට දැනුණා ස්වාමීන් වහන්ස.

**ආර්යයන් වහන්සः** එතකොට මේ ශබ්ද වර්ණ කියන එකනෙ **"චිත්තේන නියති ලෝකේ"** කියන්නේ. ශබ්ද වර්ණ උණුසුම සීතල තද ගතිය නේද? ශබ්ද වර්ණ ගන්ධ රස පහස ඕකනෙ.

**උපාසකः** එහෙමයි.

**ආර්යයන් වහන්සः** එතකොට ද්වාර වලින් ස්පාක් වෙනවා ඒ ශබ්ද, දැන් අම්මා කියන්නේ ශබ්දයක් නෙ, අම්මා කියන්නේ හැඩතලයට දාපු ශබ්දයක් විතරයිනේ.

**උපාසකः** එහෙමයි.

**ආර්යයන් වහන්සः** අම්මා කියලා දෙයක් එළියෙන් හම්බ වෙන්නේ නෑනෙ. ඒ අම්ම කියලා අපිට හැම තිස්සෙම හම්බවෙන්නේ අපේම චිත්ත ස්වභාවයක්නෙ. ඇසුරු කරන්නේ. එතකොට අපි ඇතුළෙන් දෙයක් වගේ විඳවන්න විදිහක් නෑනෙ. අපි ගමු පොත, පොත කියන්නේ ශබ්දයයි

වර්ණයයි නේ. පොත කියන එක අපේ ඇතුළින් විඳවන්න විදිහක් නෑ නේ. මේකෙ වටිනාකමක් දැනෙන්න විදිහක් නෑනේ. මේ සාමාන්‍යයෙන් වටපිට බලනවා ඒව මොකක්වත් අපිට එහෙම අගයක් දැනෙන්න විදිහක් නෑනෙ. ඒකට හේතුව මේක ශබ්ද වර්ණ විතරයිනෙ. බොහෝ විට එහෙම නෙමෙයි වෙලා තියෙන්නේ. දැන් අපිට කාලයක් තිස්සේ ඕක අභිසංකරණයට ලක්වෙලා. දෙයක් වෙලා තියෙනව අනුසෝතය තුළ. තියෙනව තියෙනව වගේ අරගෙන තියෙනව වෙලා තියෙනවා. දෙයක් වගේ. ඔය වටිනාකමක් තමයි බලනකොට එන්නේ දිගටම. මේ මගේ දරුවා, ආ ඒ මගේ දරුවා නෙවෙයි. දැන් මිනිස්සු මැරිලා ඉන්නවා ඒක ගාණක් නෑ. දැන් මගෙ දරුවා මැරුණම දරා ගන්න බෑ. ඒක මොකක්ද? ඒකත් සිතුවිල්ලක්නෙ. දැන් අර ඔක්කොම එකයිනෙ පින්තූරයක්නෙ ඇහැට ආවේ. කනට ආවේ ශබ්දයක්නේ. දැන් මගේ එක කොහෙන්ද ආවේ. අන්න අපේ අභ්‍යන්තරයේ තියෙනව නේද දෙයක් කරගත්ත ස්වභාවයක්. දෙයක් වගේ දැනෙන ගතියක්. මගේ දරුවා කියලා දෙයක් තියෙනවා නේද? මගේ අම්ම කියලා කෙනෙක් ඉන්නවා, මගේ ගෙදර, මගේ වාහනේ, මගේ මගේ මගේ, බන්ධනයකට කොටුවෙලා තියෙනවා නිතර දකින දේ නිතර කරන දේ මගේ කියලා හිතපු දේ හිතපු දේ පවා සිතුවිල්ල පවා එහෙම වෙනවා. දැන් මේ **සබ්බ සංඛාර** කියන්නේ දෙයක්නේ. මේ වගේ දෙයක් කරගන්න එකනෙ. දෙයක් නෙවේ නම් අපිට ගැටලුවක් නෑනෙ. වෛද්‍යතුමා වගේ රස්සාව කරන්න පුළුවන් නේ. ඇයි දෙයක් නෑනේ. ඉතිං ගාණක් නෑනෙ. ඉතිං මේ ගාණ කීයද ගාන බැලුවා දුන්නා. අපි හිතමු කැෂියර් එකේ කියලා. කීයද ගාන, ගාන බැලුවා දුන්නා. ඉතිං දැන් දෙයක් කොහෙවත් තියෙනවද නෑනෙ. මගෙ දේවල් ද මේ විකුණන්නේ නෑනේ.

***උපාසකඃ*** අවසරයි ස්වාමීන් වහන්ස. දැන් ස්වාමීන් වහන්සේ කියපු දේ මට හොඳට වැටහෙනවා.

**ආර්යයන් වහන්සඃ** දෙයක් නැත්නම් දුකක් නෑ. ඔය කරන හැම දෙයක්ම වර්ණයක් ශබ්දයක් විතරක් දැනෙන ස්වභාවයට දියුණු උනොත්

ඒක ඥානයට හසුවෙනවා, සිහියට හසුවෙනවා, කිසිම ගැටලුවකුත් නෑ. පුදුම සැහැල්ලුවක් දැනෙනවා. ඒක තමයි වෙන්නේ වෛද්‍යතුමනි අන්තිමට ඒක තමයි අරහත්වය. ඒක තමයි **අරහත්ත සමාධිය**. මුකුත් නැති දෙයක් නැති ස්වභාවයක් දැනෙනවා. **සබ්බ සංඛාර** කියන්නේ වචනෙත් දෙයක් වෙලා. **වචී සංඛාර**, ක්‍රියාවත් දෙයක් වෙලා **කාය සංඛාර**, මනෝමයෙන් සිතන දේත් දෙයක් වෙලා **මනෝ සංඛාර, සබ්බ සංඛාර සමථ** කියන්නේ වචනයත්, ක්‍රියාවත්, සිතුවිල්ලත් දෙයක් නැති තැනයි.

දෙයක් තියෙනවා නම් අන්න **පටිච්චසමුප්පාද ධර්මය** කියන්නේ **අවිද්‍යා පච්චයා සංඛාර**, ඒ කියන්නේ දෙයක් හැදෙන හැටි. අවිද්‍යාව කියන්නේ දෙයක් කරගත්ත එකයි.

**"ඉමස්මිං සති ඉදංහෝති, ඉමස්සඋප්පාදා ඉදං උප්පජ්ජති, ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති."** කියන්නේ මෙය ඇති කල්හි මෙය වේ කියන්නේ ශබ්ද වර්ණ ඇති කල්හි ආත්මය දෙයක් තියෙන එකක්, දෙයක් තියෙන එකමයි ආත්මය කියන්නේ. ඒක තියෙනවා නම් මාත් ඉන්නව. පොත තියෙනවා නම් මාත් ඉන්නවා. අම්මා ඉන්නවා නම් මාත් ඉන්නවා. දෙයක් තියෙන එකක්.

හැබැයි මේකෙ දැනුම නැතිවෙලත් නෙවෙයි. රහතන් වහන්සේ දන්නවා මේ මොනවද කියලා. රස දැනෙනවා. ගන්ධය දැනෙනවා. කතා කරන ශබ්ද ඇහෙනවා. වර්ණ පේනවා. බිහිරි වෙලා නෑ. අන්ධ වෙලා නෑ. හැබැයි දෙයක් දැනෙන් නෑ. ඔන්න ඕකයි වෙනස.

ඒ තැනට යනවා කියන්නේ රහත් වෙලා කියන එක. එතනට එකපාර යන්න බෑ. ඒ නිසා තමයි ඉස්සෙල්ලාම අපි බාහිර දෙයක් නැති බව සිතම බව දකිනවා. සෝතාපන්නයි. ඒ කියන්නේ අනුසෝතය බාහිර ඇත්ත වීම පටිසෝතය බාහිර දෙයක් නැති බව දැනීම. ඒ සෝතාපන්න මාර්ගය, ඵලයට පත්වීම සිහියට අසුවෙනවා. ඒ කියන්නේ මුලින් මනසිකාරය තුළ දෙයක් නැති බව හිතන එක මාර්ගය, ඊට පස්සේ හිතනවා නෙවෙයි

නිරායාසයෙන්ම දැනෙන එක, අන්න ඉන්ද්‍රිය ධර්ම බලධර්ම වන තැන අන්න එතැනයි සෝතාපන්න ඵලයට පත්වෙන තැන. හිතන තැනම තියෙන්නේ හැම තිස්සෙම මනසි කරෝති කියන තැන. සවිතක්ක අවිචාර සමාධිය අවිතක්ක අවිචාර සමාධියට එනකොටයි ඵලයට එන්නේ.

සමාධි හතරටම ඒ කියන්නේ ලෝකෝත්තර ඒ කියන්නේ විදර්ශනා සමාධි හතරෙම ඒක වෙනවා. සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අරහත් කියන එක. ඒ කියන්නේ ඕකෙ දැන් සිත කියන පැත්තට ගමු. දැන් බාහිර දෙයක් නෑනෙ. සිතුවිල්ලනෙ. හැබැයි දැන් සිතෙත් දෙයක් නෑනෙ. සිතෙත් දෙයක් නැතිවෙන කොට අන්න අනාගාමී. දැන් බාහිර දෙයක් නැති වුණාට සිතේ හින්දා හිතිං විඳවනවනෙ ගොඩාක් අය. දැන් බාහිර නෑ කියන එක හරි. ඒක දැන් අවබෝධයි කියමු. කෙනෙකුට ඊට පස්සේ හිතේ තියෙනවානෙ. දැන් හිතින් දුක් විඳිනවනෙ. අන්න හිතෙත් දෙයක් නැතිවෙලා යන තැන. ඇත්තටම කවදාවත් අපිට මේ කියන දේවල්වල දේවල් නැති බව. සිත ඇතුළෙ කොහෙද ශබ්ද වර්ණවල දෙයක් හම්බ වෙනවද? ඒක කවදාවත් වෙන්නේ නෑ. බාහිර රූපෙන් මිදුණා සිතේ නාමෙන් මිදුණා. **නාම රූප පරිච්ඡේද ඥානය අන්න අජ්ජත්ත බහිද්දා** කියන අන්ත දෙකෙන්ම මිදුණා අන්න **අනාගාමී**. ඒ කියන්නේ ලෝක සංඥාවක් කොහෙවත් බැස ගන්නේ නෑ. සිතේවත් එළියේවත් **ගති නිමිති කම්ම නිමිති** සියල්ලම මේ **චුති සිත** අවසන් සිත මේ සිත නම් එතනත් දෙයක් නෑ. සිහියටයි අවධි වෙලා ඉන්නේ. ඥානයටයි අවධි වෙලා ඉන්නේ. **"අකුප්පා චේතෝ විමුක්තිය"** කිසිම දේකට කම්පනය වෙන්නේ නෑ. **අකුප්පා චේතෝ විමුක්තිය**ට එනවා. අනිමිත්තයි. පොත කියන නිමිත්ත දරුවා කියන නිමිත්ත, ඒ කියන්නේ මේ මොහොතේ දකිනවා. දරුව කියලත් දන්නවා, පොත කියලත් දන්නවා. හැබැයි ඒකෙ දෙයක් නැති තැනයි **අනිමිත්ත** කියලා කියන්නේ. අන්න **අනිමිත්තයි, ශූන්‍යතයි, අප්‍රණීතයි. චේතෝ විමුක්තියයි චිත්ත විමුක්තිය. සබ්බ පා පස්ස අකරණං** සියලු සිතුවිලි අකුසල්. හැබැයි **කුසලස්ස උපසම්පදා** කිසිම තැනක කුසලය කියන්නේ දෙයක් නැති බව. ඥානය සිහියට අසුවෙනවා. සම්ප්‍රයුක්තයි. කුසල සිතයි. ඒ කියන්නේ විඥාන මායාව

කවදාවත් කුසල සිතක් වෙන්නේ නෑ. කුසලය කියලා කියන්නේ සිහියයි. සම්මා සතියයි. දෙයක් නැති බවට තියෙන සිහියයි.

ඒ **සම්මා දිට්ඨිය** තුළින් එන **සම්මා සතියයි. සම්මා සමාධිය,** අන්න ඒ තුළින් එන **අනිමිත්ත සමාධියයි.** අන්න **සම්මා ඥාන** ඒ කියන්නේ මේක ඥානයට හසුවෙනවා. **සම්මා විමුක්ති, අන්න විමුක්ති මාර්ගය. අරිය අට්ඨාංගික මග්ගෝ.** අන්න නිවන් දැක්කා.

හැබැයි මේ අරමුණෝමයි නිවන් දකින්නේ. දැන් මේ මොහොතෙම ඔබතුමා නිවන් දකිනවා. මේ එන අරමුණ මේ මොහොතෙම දෙයක් කර ගත්තේ නෑ කියන්නේ එතනම ඒ සිත දැක්කා මිදුණා කියන්නේ එතනම නිවන් දැකලා ඉවරයි. ඒ සිත නිවන් දැකපු සිත. එතනම ඒක තියෙනවා. මේ අරමුණෝම ඒ කතාව තියෙනවා. ඒකයි කිව්වේ **පටිච්චසමුපාදයත්** මේ අරමුණෝමයි කියලා කිව්වේ.

දැන් අපි ගත්තොත් අවිද්‍යාව. අවිද්‍යාව කියන්නේ දෙයක් නැති බවනෙ. සංඛාර කොහෙන්ද ආවේ. අන්න පුංචි දරුවා, පුංචි දරුවා ඉපදෙන කොට මුකුත් දන්නේ නෑ. පුංචි දරුවට ශබ්දයක් දානවා. පුතේ මේ අම්මා. එනවා ආලෝක හැඩතලය ඉස්සරහට. ශබ්දයයි වර්ණයයි එකතු වුණා. එතන ඉඳන් අම්මා. අම්මා, අම්මා දෙයක් වෙනවා. අම්මා කියන දේ හැදුණා. ඊට පස්සේ මොන්ටිසෝරි යනකොට පුතේ මේ කහපාට, යෙලෝ, රෙඩ්, බ්ලූ, ශබ්දෙ දදා දෙනවා. ශබ්ද තරංග යි වර්ණ තරංගයි කියන්නේ අංශු කම්පන දෙකක් විතරයි. ඔය දෙක එකතු වෙලා දෙයක් වගේ දැනෙන ආකාරයට අංශු කම්පන වෙනවා. එතකොට දෙයක් තියෙනවා. එතකොට අම්මා කියලා කෙනෙක් ඉන්නවා. එතකොට දරුවා කියලා කෙනෙක් ඉන්නවා. මරණය කියලා දෙයක් තියෙනවා. හැබැයි එහෙම දේකුත් නෑ. මේ හැම මොහොතෙම ස්පාක් එකක් වෙනවා විතරයි ඇහෙනවද?

**උපාසක:** එහෙමයි ස්වාමීන් වහන්ස අවසරයි. අර දෙයක් තියෙන එක ඒක මට හොඳට පැහැදිලියි. අපිට දැන් තියෙන ප්‍රශ්නේ දෙයක්

තියෙනවා කියලා මැවෙන එකනෙ ස්වාමීන් වහන්ස. ළමයෙක් ඉන්නවා. මට වයිෆ් කෙනෙක් ඉන්නවා.

**ආර්යයන් වහන්සඃ** අභිසංකරණය නැවත නැවත නැවත දැකලා. දැන් මුලින් ළමයි හිටියද? නෑ. මුලින් වයිෆ් හිටියද නෑ. වයිෆ් නැතුව හොඳින් හිටිය නේ. දරුවෝ නැතුව හොඳින් හිටිය නේ ද? දැන් මොකක් ද වුණේ අර පින්තූරෙ ආය ආය දකිනකොට ඒ පින්තූරෙ බලගැන්විලා ඒ පින්තූරෙ නැතුව බැරිවෙලා.ඒක උපාදානය වෙලා ඒක දෙයක් කරගෙන දැන් ඉන්නේ. අන්න දෙයක් කර ගත්තා. නාමයක් හදා ගත්තා. භවයක් හදා ගත්තා නම් දෙයක් හදා ගත්තා. දෙයක් හදා ගත්තොත් දුක තියෙනවා. භවයක් තිබුණොත් ජාතියක් තියෙනවා. ජරා මරණ සෝක පරිදේව සේරම තියෙනවා. අන්න පටිච්ච සමුප්පාද ධර්මයම එතන තියෙනවා.

දැන් මේක බුදුන් වහන්සේ පැහැදිලි කරනවා. සංඥා අභිසංකරණයක්ය මහණෙනි ජීවත් වෙනවා කියන්නේ සංඥා අභිසංකරණ නිරෝධයයි. මහණෙනි නිවන් දකිනවා කියන්නේ. දැන් සංඥාව කියන්නේ මොකක්ද අම්ම කියන සංඥාවඳ නෝන කියන සංඥාව, දරුවා කියන සංඥාව, දැන් සංඥාව මොකද වෙන්නේ නැවත නැවත නැවත එකම රූපය දැකලා දැකලා එයා කරන ඒව එයා හැසිරන ඒව එයාගේ විදිහ ඒක බලගැන්වෙනවා. සිංදුවක් නැවත නැවත අහන කොට ඒ සිංදුව නිකම්ම මිමිණෙන්නේ. අන්න ඒ වගේ තමයි දෙයක් කර ගන්නවා කියන්නේ. ඒක වේගය මතයි තියෙන්නේ. අනුසෝතය, පටිසෝතය, අනුසෝතය කියන්නේ බාහිර ඇත්ත කර ගන්නෙත් අපි වේගය මතයි. පටිසෝතය කියන්නේ අනිත් පැත්තටත් මේකෙ දෙයක් නැති බව එනකොටත් වේගය මතයි. අපි කිව්වා දැන් පෘථිවිය හැදිලා තියෙන්නේ බිග් බෑන්ග් කියන්නේ එක පරමාණුවක වේගයක් තුළනෙ ඒක පිපිරීම. ඒක වේගයක් තුළ සිදුවීමක් කීවනෙ. ඒ තුළනෙ මේ කරකැවීම ස්ඵටිකයක්, ඝනයක්, පෘථිවියක් හැදෙන්නේ. ඒ වේගය මතයි උත්තර ධ්‍රැවය දක්ෂිණ ධ්‍රැවය චුම්භක ආරෝපණ. ඒ වේගය මතයි අර සිසිල් වීම. පෘථිවි පෘෂ්ඨය

අයිස් කැටය වගේ ඝන වීම. ඒක තුළයි එතකොට අර සේරම පදාර්ථ හැදෙන එක.

එතකොට මේකේ කොහේවත් දෙයක් නෑ අංශු. ස්වභාවය එකමයි. එකම අංශු ස්වභාවය කම්පනය වීමයි. පෘථිවිය හැදීම. ඒ අංශු ස්වභාවය කම්පනය වීමයි. ශක්තිය ජෙනරේට් වීම. ගුරුත්වාකර්ෂණ බලය. කැරකැවීමේ වේගය මත එන බලය. ඒකයි ගලක් උඩ දැම්මම බිම වැටෙන්නේ. ඒ විදිහටමයි වික්ටෝරියා ඩෑම් එකේ අර චුම්භකය කරකවලා ගෙදරට විදුලිය එන්නේ. ඒත් අංශු කම්පනයක්මයි වෙන්නේ. එතන විදුලිය ඇති වෙනවා කියන්නෙත් චිත්තාරෝපණය කියන්නෙත් අපි ගත්තොත් එහෙම චුම්භක ආරෝපණය විද්‍යුත් ආරෝපණය ඒ වගේම තමයි චිත්තාරෝපණය කියන්නේ කම්පන වේගයක් විතරයි. අංශු කම්පන වේගයක් විතරයි. ඒක ගත්තොත් එහෙම ශබ්ද කියන්නේ එක අංශු කම්පන ස්වභාවයක්. එතකොට වර්ණ කියන්නේ තව අංශු කම්පන ස්වභාවයක්. අපි බලන්න පුංචි දරුවට ඇයි ශබ්දයක් දැම්මහම මොකද වෙන්නේ. ඇයි වර්ණ වෙන් වෙන්නේ. ඇයි එතන ඉඳන් සිතක් පහළ වෙන්නේ. එතන ඉඳන් ඒ දරුවා දන්නෙ නෑනෙ කහපාට රතුපාට කියලා එතකන් දන්නෙ නෑනෙ. ඊට පස්සේ මොකක්ද මේ වුණේ. සිත කියන්නේ මොකක්ද? සිත කියන්නේ මේ එන ප්‍රසාදවල කම්පන වේග ටික එකට එකතු වුණු තව කම්පනයක් විතරයි. ඒකයි කම්පනයක මේක ධ්වනියක් කියලා කිව්වේ. සිත කියන්නේ මේක ආත්ම කතාවක් නෑ කොහේවත්. මේක සවිඥානික මනසකට මේක අසුවෙන් නෑ. බුදුන් වහන්සේ දේශනා කරන්නේ **චක්කුං නිච්චංවා අනිච්චංවා, අනිච්චයි** ස්වාමීනි. ඒ කියන්නේ, ඇස කියන්නේ ජේන බව. දැක්කේ පොතක් මේසයක්. පොතක් කියන්නේ ශබ්දයක්. ශබ්දයක් කොහේවත් බාහිර හම්බ වෙන්නෙ නෑ. ඒක සිතෙත් නෑ. අන්න ඒකයි අනිච්චයි කිව්වේ. කොහෙවත් නැති දෙයක්. එහෙනම් ඒක අනිච්චයි. අනිච්ච කිව්වේ අවබෝධ කරන එකක්. අන්න එහෙනම් ඒක දුක ද? එහෙම දෙයක් කොහෙවත් නැත්නම්, අන්න ඒකයි දුක කිව්වේ. දුක කිව්වේ දෙයක් කොහෙවත් නෑ එහෙම. ඊට පස්සේ, එහෙනම් ආත්මයක් තියෙනවද? නෝ ඒතං භන්තේ. ඉඳ භික්කවේ භික්කු. මේ

සාසනේ භික්ෂුව කියන්නේ ඕක දකින කෙනාම විතරයි. ආත්ම ධර්මයක් නෙවෙයි. අනාත්ම ධර්මයක්. ඒ කියන්නේ භවයක් කියන්නේ දෙයක් තියෙන එක. භව නිරෝධය දකින කෙනා බෞද්ධයෙක් කියන්නේ. එහෙනම් බාහිර ඇත්ත කරගෙන ඉන්න කිසිම කෙනෙක් බෞද්ධයෙක් නෙවෙයි. ආත්මයක් කියාගෙන ඉන්නව නම් ඒ දෙයක් තිබුණොත් තමයි.

**"ඒතං මම, එසෝ හමස්මි, එසො මේ අත්තා"** ආත්මයක් තියෙන්නේ දෙයක් තිබුණොත්. ආත්මයක් තියාගෙන කියන දහම බුදු දහම නෙවෙයි. පෙර නොඇසූ විරූ දහම කියන්නේ අන්න ඒ නිසයි. මේක කිසිම ආගමක නෑ. කිසිම කොහෙවත් නෑ. හැම ආගමකම තියෙන්නේ බාහිර දෙයක් තියෙනවා. ඇත නැත අන්ත තියෙනවා නම් දෙයක් තියෙන්න ඕන. හැබැයි දෙයක් නැති දහමක් කොහෙද තියෙන්නේ. බුදුන් වහන්සේ ප්‍රතික්ෂේප කළා කර්ම භූමිය සම්පූර්ණයෙන්ම නිගණ්ඨ නාථ පුත්‍රගේ දෙයක් මත පදනම් වෙලා තියෙන.

බුදුන් වහන්සේ ඒක කර්මයෙන් සියල්ල වේ කියන එක සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරලා බුදුන් වහන්සේ හේතුඵල දහම ඉදිරිපත් කළා. **"හේතුං පටිච්ච සම්භූතා හේතු භංගා නිරුජ්ඣති"** කියන්නේ කිසිම දෙයක් නෑ. හේතු තියෙන කොට මැවෙනවා. නැත්නම් නෑ.

ඉදප්පච්චතාවය කිව්වේ මහා ගැඹුරු න්‍යායක්. ඒක මුළු විශ්වයේම න්‍යාය. දෙයක් තියෙන කොට මැවෙනවා. දෙයක් නැතිවෙන කොට අන්න හේතු තියන කොට එනවා. හේතු නැති වෙනකොට නැතිවෙන ධර්මතාව. මුළු ස්වභාව දහමේම න්‍යාය ඒකයි.

**"යො උභො අන්තෙ විදිත්වාන - මජ්ජෙ මන්තා න ලිප්පති - තං බ්‍රෑහි මහාපුරිෂො සේද සිබ්බනි මජ්ජගා"**

**යො උභො අන්තෙ විදිත්වාන** - අන්ත දෙකක් තිබුණොත් මහණෙනි ඒ අන්ත දෙක මැද්දේ ශක්තිය උපදිනවා. ධන ඍණ කියලා නොගැළපෙන අන්ත දෙක මැද්දේ ශක්තිය උපදිනවා කියන එක බුදුන් වහන්සේගේ බුද්ධ න්‍යායයි. ඒ බුද්ධ න්‍යාය අරගෙන තමයි අද ඔය කොන්ටම් න්‍යාය

හදලා තියෙන්නේ. ඒ කොන්ටම් න්‍යාය මේ දැන් ඉන්න විද්‍යාඥයන්ගේ එකක් නෙවෙයි. මීට අවුරුදු දෙදාස් පන්සියයකට කලින් මජ්ඣේ සූත්‍රය තුළ තියෙනවා බුදුන් වහන්සේ දේශනා කරලා.

**"යො උභො අන්තෙ විදිත්වාන - මජ්ඣේ මන්තා න ලිප්පති**
**තං බ්‍රැහි මහාපුරිෂො සේද සිබ්බනි මජ්ජගා"**

තව අවුරුදු විසි දාහක් ගියත් ඕකමයි ලෝකෙ තියෙන එකම න්‍යාය.

**"නිස්සත්වෝ නිජ්ජීවෝ ශූනෙයා්"** සත්වයෙක් පුද්ගලයෙක් නෑ. ඒක නිසා තමයි අපි කිව්වේ මේක ටෙලිපති කරන්න පුළුවන්. මේ කියන අපේ චිත්ත ස්වභාවය තරංග සිස්ටම් එකක්. මේක ගන්න පුළුවන් චිප් එකකට. මේක ගැහුවොත් එහෙම ටර්මිනේටර් වගේ රොබෝ හදලා ඔක්කොම සමානයි. **ඒකත්ත කායා ඒකත්ත සංඥා.** ඒකට හේතුව ආත්මයක් නෑ. මෙතනත් ආත්මයක් නෑ. ඔබතුමාගේ ඇතුළෙත් ආත්මයක් නෑ. සිස්ටම් එකක් තියෙනවා. සිස්ටම් එක ඔබතුමාට අවබෝධ කළොත් ඔබතුමාට ආයේ භවයක කතාවක් උත්පත්තියක් මොකක්වත් හිටින්නේ නෑ. හැබැයි දෘෂ්ටියේ හිටියොත් ඔබතුමා ආයේ උපදිනවා. ඒ කියන්නේ බලගැන්වෙනවා. අර ඩයිනමෝව ඇක්ටිව් වෙනවා. ඒ කියන්නේ නිතරම තියනවා තියනවා කියන එක තමයි චිත්තාරෝපණය.

ඒ කියන්නේ ගුරුත්වාකර්ෂණ බලය වගේ, චුම්භක ආරෝපණ බලය වගේ, තරංග සිස්ටම් එකක් වගේ, මේකත් සිරස අල්ලනව වගේ, දෙරණ අල්ලනව වගේ, මෙතන කර්කජ කය හරියට ටීවී එක වගේ. ටීවී එකේ සර්කිට් එක වගේ හරියට ආයතන ටික. හැබැයි ඒකෙ දකින ෆිල්ම් එක වගේ අපේ සිතුවිලි. අන්න ටීවී එක කැඩුණා. කර්බජ කය පොළොවට පස් වුණා. දිරලා.

හැබැයි සර්කිට් එක දැන් වැඩ කරන් නෑ. ටීවී එක කැඩුණාට පස්සේ. දැන් මොකද වෙන්නේ. අර සිරස වගේ දැන් අපි අල්ලපු චිත්‍රපටිය, ෆ්‍රීකුවන්සි (Frequency) එක. ඒක නැවතිලා නෑ. මොකද වෙන්නේ. තවත් කර්කජ කයක්, තවත් ටීවී එකක සර්කිට් එකක් තියෙනවා. අන්න අහුවෙනවා. ෆිල්ම් එක පේනවා.

**උපාසකඃ** එහෙමයි. එහෙමයි.

**ආර්යයන් වහන්සඃ** මේක අපි අභිඥා දේශනාවල හොඳට පැහැදිලි කරනවා. වර්ණ ටිකක් අරගෙන බල්බ් ටිකක් අරගෙන ඔබතුමා තාම ඒ දේශනා අහලා නෑ.

ඔබතුමාට අධ්‍යනය කරන්න පුළුවන්, මේ උපදින හැටි මැරෙන හැටි, සත්වයාගේ කතාව, කොහොමද පෙර ඒව කියවන්නේ කොහොමද මේවා වෙන්නේ. හැම දෙයක්ම දිව්‍ය ලෝකවල තියෙන ඔක්කොම ඇත්ත කතාව.

බුදුන් වහන්සේ දේශනා කරනවා සංඛාර උප්පත්ති සූත්‍රය තුළ සියලුම මේ තිස් එක් ලෝක ධාතුවම සිත තුළින් දකින හැටි. මේ සිතේ අවස්ථා කොහොමද තිස් එක් ලෝක ධාතුවට කොහොමද වෙන් කරලා දකින්නේ. බ්‍රහ්ම ලෝකේ මේ මොහොතේ කොහොමද දකින්නේ. කොහොමද දිව්‍ය ලෝක මේ මොහොතේ දකින්නේ සිත තුළින්. මේ මොහොතේ දකින්න පුළුවන්. කොහෙවත් යන්න ඕන නෑ. දැන් දිව්‍ය ලෝකේ ඉන්න පුළුවන්. දැන් මේ සිතින් ඉන්න පුළුවන්. සිතින් ඒ සංඥා සකස් වෙච්ච ගමන් එතන දිව්‍ය ලෝකේ. කතාවක් නෑ. ඒක දකින්න පුළුවන් අපේ දේශනාවලින්. නවසත්තාවාස සූත්‍රයේ බුදුන් වහන්සේ දේශනා කරලා තියෙනවා. එතනින් බලන්න පුළුවන්.

ඒකත්ත සංඥා ඒකත්තකායා,

ඒකත්ත සංඥා නානත්තකායා,

නානත්ත සංඥා ඒකත්තකායා,

නානත්ත සංඥා නානත්තකායා.

මේ සංඥාවක් මහණෙනි තියෙන්නේ. වේදනාවක් නැත්නම් සංඥාවකුත් නෑ. ආලෝක හැඩ තලයක් නම් ඒ හැඩතලයේ විඳීම ඒ වේදනාව. ගැහැනු ළමයෙක්ගේ ඇතුළෙ තියෙන කැමැත්ත මුහුණේ

තියෙන හිනාවෙන් පේන්නේ. වේදනාව තමයි කැමැත්ත. මූණේ තියෙන හිනාව තමයි සංඥාව. ඕනෑම වේදනාවක් නිරූපණය වෙන්නේ සංඥාවකින්. ඒ සංඥාවමයි විඥානය කියන්නේ. වේදනා සංඥා සංඛාර විඳීම් හැඳින්වීම් දැනගැනීම්.

මේක ඇවිල්ලා ස්වභාව දහමක්. ඇත්තටම සෙන්සර් එකේ ස්වභාවය. ආලෝකය දැනෙන්නේ විඳීම් හැඳිනීම් දැනගැනීම්. ඒ කියන්නේ වේදනාවටයි සංඥාව. ඒකමයි සංඛාර කියන්නේ. ඔක්කොම දාලා කේක් එක වගේ කලවම් කරන එක. මේක එතකොට දෙයක් වගේ දැනෙන එක. ශබ්දයි වර්ණයි සේරම තප්පරේට කෝටි වාරයක් ස්පාක් වෙලා අපිට මේ වර්ණය පේනවා වගේ. තප්පරේට කෝටි වාරයක් අර කර්ණ සංඛ පටලය හෙල්ලිලා ශබ්දය වගේ. මේක මෙතන ඇතුළෙම සෙන්සර්වල ස්පාක් වීම එකටම එනකොට තප්පරේට කෝටි වාරයක් ඉන්ද්‍රිය ගෝචර නෑ. අවස්ථා දෙක වුණාට එකයි දැනෙන්නේ. එකට දැනන කොට මොකද වෙන්නේ. ඒකට කියනවා මනෝ විඥානය. මනෝ විඥානය කියල එකක් කොහේවත් නෑ. මේක කියන්නේ මෙතන අර ස්පර්ශය කියන්නේ මේවා එකට එන එක. තදංග ඵස්ස පච්චයා. ඒකට එන්නේ පොත කියලා දෙයක් වගේ. දෙයක් වගේ එකක් කොහෙන්ද ආවේ. ශබ්දයයි වර්ණයයි ආවේ. ශබ්දයයි වර්ණයයි දෙයක් වගේ වෙන්නේ එකට එන එක. එකට එනකොට එනකොට ස්පාක් එකක්. අන්න ඒ ස්පාක් එක තමයි විඥාන මායාව. ඒ ස්පාක් එක තමයි **"රූපන්තිබෝ ආයුසෝ රූපං"** කියලා බුදුන් වහන්සේ ඛජ්ජනීය වග්ගයේ පෙන්නුවේ. මේක රුප්පනය නිසා මහණෙනි රූපය ඇති වෙන්නේ. රූපය දෙයක් බවට පත්වෙන්නේ මහණෙනි අභිසංකරණය නිසා.

කාටුන් එක හදනකොට ඒක පින්තූරෙ වේගයෙන් යවන කොට ෆිල්ම් එකක් වගේ පේනවා. අපි චිත්‍රපටිය වගේ බලනවා. අන්න ඒ විදිහටම තමයි අපිත් මේ ඉන්නේ. වේගයක් නැත්නම් අපේ කතාව ඉවරයි. ඇත්තටම බුදුන් වහන්සේ මේක උපමා කරන්නේ ගිනි වළල්ලකට. ගිනි බෝලයක් මහණෙනි කරකවන කොට ගිනි වළල්ලක් පේනවා. අන්න

ඒ ගිනි වළල්ල වගේ තමයි මහණෙනි. අපේ ආත්ම කතාව. මේකේ ආත්මයක් නෑ මහණෙනි. මේකේ තියෙන්නේ ශබ්ද වර්ණ විතරයි.

දිට්ඨෙ දිට්ඨ මත්තං - දුටු දෙයක් නෑ

සුතේ සුත මත්තං - ඇසුණු දේකුත් නෑ

හැබැයි මේව එකතු වුණොත් දෙයක් තියෙනවා.

මුතේ මුත මත්තං

විඤ්ඤාතේ විඤ්ඤාත මත්තං

සද්දය සද්දයක් විතරයි. වර්ණය වර්ණයක් විතරයි. නාමය ශබ්දය වුණේ කොහොමද? නම් කරන්නේ නාමය. නම් කරන ලද දේ නාමයයි. එහෙනම් **වේදනා සංඥා චේතනා ඵස්ස මනසිකාර අයං උච්චති නාමං වදේති** කිව්වේ නාමය කියන්නේ ශබ්දයයි. කොහොමද රූපය කියන එක අන්න නාමය කියන එක ශබ්දය වෙනකොට මේ වර්ණ ශබ්ද එකට එකතු වෙන එක හොඳටම තේරෙනව නාම රූප එකතු වෙන හැටි. මේක තවත් දිගට පැහැදිලි කරොත් **"චත්තාරෝච මහා භූතා චතුන්නංච මහා භූතානං උපාදාය රූපං"** කොහොමද කියන්නේ කියලා. මේක දීර්ඝ පැහැදිලි කිරීම් න්‍යායාත්මකව පොත්වලින් බුදුන් වහන්සේ පෙන්නලා තියෙන ඒවගෙන් කියත හැකි. හැබැයි මේක ප්‍රායෝගිකව හරිම සරලයි. පොඩි ළමයෙකුටත් තේරෙනවා.

පුතේ මේකෙ එළියේ කතාවක් නෑ. අපේ මේ දාලා තියෙන වචන ටික ඔක්කොම බොරු පුතේ කියලා කියන්න විතරයි තියෙන්නේ. ඔය වචන ඔක්කොම බොරු වෙනවා. සුද්දෙක් කියන්නේ මේකට බිත්තිය නෙවෙයි වෝල් කියලා. චීන ජාතිකයෙක් කියන්නේ චාං. බිත්තිය කියලා දෙයක් ලෝකේ නෑ කොහෙවත්. ඒක දෙයක් වුණේ කොහොමද? බිත්තිය කියලා දෙයක් කවදාවත් අපට හම්බ වෙලා තියෙනවද? අපට හම්බ වෙලා නෑ. පුදුම මායාවකනෙ හිරවෙලා ඉන්නේ. අපට කවදාවත් එළියේ අත් දකින්න බෑ. දැන් අපේ ඇස් අන්ධ නම් එළියේ කළුවරද? අපේ ඇස්

පියා ගත්තම එළියේ කළුවරද? එතකොට ඇත්තටම එළියේ අත්දැකීම මොකක්ද අපට තියෙන. අපි මේ විඥාන මායාව, දැන් අපි දන්නව යෂ්ඨි සෛල කේතු සෛල වල මේ අක්ෂි කාචය තුළ නාභිගත වීම තුළ අපි මේ දකින වර්ණ එළියේ කොහෙවත් නෑ. අර ආලෝකයකට ප්‍රිස්මයක් ඇල්ලුවාම වර්ණ හතක් මැවෙනවා වගේ අක්ෂි කාචය තුළ මෙතනම වර්ණ මැවෙන එකක්. සමහර අයට රතුපාට පේන්නේ නෑ. සමහර අයට කොළපාට පේන්නේ නෑ. අර යෂ්ඨි සෛල කේතු සෛල වල වෙනස. එතකොට මොකක්ද වෙන්නේ තරංග ආයාමය වැඩි එක රතු, තරංග ආයාමය අඩු එක තැඹිලි ඔය විදිහටනෙ එන්නේ. මෙතන එළියේ කතාවක් අපිට නෑනේ. අපිට එළියේ අත්දැකීමක් නෑනේ. අපිට කොහොමත් ශබ්දයක් එළියේ නෑනෙ. කර්ණ සංඛ පටලෙ හෙල්ලෙන් නැත්නම් ශබ්දයක් නෑනේ. එතකොට අපිට තේරෙනවා නේද මේ කතාව තුළ ෆැන්ටසි එකක් ඇතුළෙ සත්‍ය ලෝකේ. සැබෑ හීනෙක අපි හිරවෙලා ඉන්නේ. ෆැන්ටසි එකක් හීනයක්. මේක කවදාවත් අපිට විඥාන මායාවෙන් මිසක් වෙනින් විදිහක් නෑ මේක දකින්න. අපිට **චක්ඛු විඥානය, සෝත විඥානය, ඝාන විඥානය** මේ ටික නැතුව අපිට අත්දැකීමක් ලබන්න බෑ. උණුසුම සීතල තද ගතිය පවා අපේ විඥාන දැනීම්වල සෙන්සස් වල ස්පාක් එකෙන් එන්නේ. එහෙනම් අපිට එළිය අත්දකින්න බෑ. කවදාවත් අපිට දුරේක්ෂයක් දාලා එළියේ තියෙන එකක් පේන්නේ නෑ. අපේ හිතේ තියන අර වර්ණ හැඩතල ටික තමයි අපට එළියෙන් පේන්නේ. කවදාවත් අපි විශ්වය දැකලා නෑ. කවදාවත් අපට විශ්වය දකින්නත් බෑ. ඒකට හේතුව කෙනා කෙනාගේ විඥාන මායාවට මැවෙන එකක් කොහෙන්ද එළියේ හම්බ වෙන්නේ. කවදාවත් හම්බ වෙන්නේ නෑ. ඔක්කොම තියෙන්නේ බොරු ගොඩක් විතරයි. තමන්ම කවදහරි දැන ගනී අපේ නාසා ආයතනය කවදාහරි දැනගනී. මොන්ටිසෝරි බබාලා වගේ මේ බුද්ධ න්‍යාය දිහා බැලුවොත්.

රෝහිතත්ත ඔය ලෝකේ බාහිරින් හොයන්න ගියා. ඔය දූරේක්ෂ හදාගෙන බලන විදිහට තමා. ඊට පස්සේ බුදුන් වහන්සේ කියනවා රෝහිතත්ත කවදාවත් ලෝකේ බාහිරින් හොයන්න බෑ. සිත තුළින්

දකින්න. මේක අපේ විඥාන මායාවටයි අසුවෙන්නේ කියලා. මේ ඇතුළෙ තියෙන මේව එක කොහෙන්ද එළියෙන් බලන්නේ. කවදාවත් කරන්න බෑ. එළියේ අත්දැකීම් අපට කවදාවත් නෑ. ඇත්තටම කිව්වොත් කිසි කෙනෙක් දන්නෙ නෑ එළියේ කළුවරද කියලා ඇස් පේන්නේ නැත්නම්.

**උපාසක:** එහෙමයි. ඒක හරි. මම ඒ ටික නම් හොඳට මට පැහැදිලියි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** දරා ගන්න නම් ටිකක් අමාරුයි නේද කියන කොට.

**උපාසක:** ඔය දේශනා අහපු ටිකට මට හොඳ අවබෝධයක් තියෙනවා ඔය ස්වාමීන් වහන්සේ කියපු දේ සම්බන්ධයෙන්. මම එකම දේ දැන් අපි අර එළියෙන් නැති දේ මැවෙන එක මම ඒකට හිත යොමු කරනවා මම ඒක එහෙම මැවෙන එක ගැන අවබෝධයක් එතකොට මට ඒක නැති වෙනවා.

**ආර්යයන් වහන්සේ:** නෑ, නෑ, නෑ. එහෙම එකක් නෙවේ මේ දහම. වෙනදා විදිහටම පේනවා. වෙනදා විදිහටම ඇහෙනවා. වෙනදා විදිහටම දන්නවා. සාමාන්‍ය විදිහම තමයි දැන් ඔන්න ආයිමත් මේ කියන ධර්මය අවබෝධ වුණා කියමු ඔබතුමාට. හැබැයි ඔබතුමාගෙ මුකුත් වෙනස් වෙලා නෑනෙ. අන්ධ වෙලා නෑ බිහිරි වෙලා නෑ දැනුම නැතිවෙලා නෑ. ඔක්කොම සාමාන්‍ය විදිහයි. වෙනසකට තියෙන්නේ **"සංකිත්තේන නිබ්බිදාය"** කණ්ණාඩියේ දෙයක් නැති බවට අවබෝධයක් අපට තියෙනවානෙ. අන්න ඒ වගේ අපට අවබෝධයක් එනවා මේ සේරගෙම සත්‍ය කතාව. අවබෝධ වුණාම මොකද වෙන්නේ එකකටවත් කම්පනය වෙන්නේ නෑ. දෙයක් නැති බව තේරෙනවා. ඒක තේරෙන එක තමයි ඔන්න ඔබතුමා දැන් රැකියාව කරනවා. ඔය සේරම කරනවා. දැන් ඔබතුමා අර අවධිය වගේ එකක් ඔබතුමාට මතුවෙනවා. හරියට වෙනින් කෙනෙක් බලන් ඉන්නව වගේ මේක මහ විහිළුවක් වෙනවා. එතකොට ඔබතුමාට පුදුම සැහැල්ලුවකුත් දැනෙනවා. ඔබතුමා වැඩ

කරනවා ඒ හැම තැනකම ඔබතුමා නෑ. ඔබතුමා වැඩ කරනවා හැබැයි කතා කරනවා සේරම කරනවා සාමාන්‍ය විදිහට කරනවා. ඔබතුමා මුකුත් හිතන්න කරන්න මුකුත් නෑ මේකේ. මේකෙ ඔය කියන ඒව මුකුත් කරන්නෙ නෑ. මේ ධර්මයේ තියෙන්නේ සද්ධර්ම ශ්‍රවණය තුළයි මේක තියෙන්නේ. ඒකයි කිව්වේ අන්න කොණ්ඩඤ්ඤදට වැටහුණා කියලා. ඔබතුමාට මේ දහම අවබෝධ වුණාට පස්සේ ඔබතුමාට කරන්න කියලා කිසි දෙයක් නෑ. ඔබතුමා සාමාන්‍ය විදිහට වැඩ කරනවා එච්චරයි. ඔබතුමාගෙ සිහියට අසුවෙනවා ඔබතුමා කිසිම දේකට බැහැලා නැහැ කියලා. බැස්සද නැද්ද කියලා. බැස්ස නම් ඔබතුමාගෙ සිහියට අසුවෙනවා. ඒ බැසපු මොහොතේ මොකක් හරි කම්පා උණා නම් ඒ සිහියට අසුවෙච්ච මොහොතෙම එතන දෙයක් නෑ කියලා ධර්මය මෙනෙහි වෙනවා. මෙනෙහි වෙච්ච ගමන්ම ඒක එතනින් නිෂ්ප්‍රභා වෙලා යනවා. එච්චරයි වෙන්නේ.

**උපාසකඃ** ඔව්. මට දැන් ඒක අවබෝධයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේඃ** තව ටිකක් ප්‍රැක්ටිකල් වෙන්න වෙනවා. කිව්ව ගමන් විශ්වාස කරන්න බෑ. විශ්වාසය ඇදහිලිවලට යන්න එපා. අපි ඔබතුමාගෙන් ඉල්ලන්නේ මේක අත්හදා බලන්න. ඉස්සරල දේශනා අහල පත්තියං කරගන්න මොකද්ද මේ කියන්නේ කියලා. හොඳට ස්ටඩි කරල හොඳට ඒක ගන්න ඕන හොඳට අවබෝධෙ ඇති කර ගන්න ඕන. ඊට පස්සේ ඒක පස්සේ තමා ඔබතුමා දැනගන්නේ. ඊට පස්සේ ඒ දැනගත්ත සත්‍යය පේන්න ගන්න එකක් වෙනවා හැමතැනම. ඕක තමයි සිත දකිනවා කියන්නේ. අමුතුවෙන් බලන එකක් නෙවේ. ඇත්තටම පේන්න ගන්නවා. දැන් ඔබතුමා දැනගත්තට පස්සේ කණ්ණාඩියේ දෙයක් නෑ කියලා, වෙනදා වගේ ලොකු කණ්ණාඩි දාලා තිබුණම පේනවනෙ. ඇත්තටම තියෙනවා වගේ පේනවනෙ. ඇත්තටම ඔබතුමා ඒ වුණාට බැලුවොත් එහෙම දෙයක් නෑ කියල අවබෝධයෙන් එනවනෙ කණ්ණාඩියක් මේක කියලා.

**උපාසකඃ** ඔබතුමාට මොකක්හරි ප්‍රශ්නයක් එනවනෙ. අන්න එතකොට මතක් වෙනවා. ඒක අනිවාර්යයෙන් සිද්ධ වෙනවා. එන එන

හැම අරමුණම, කොහොමත් හැම අරමුණම මිදිලනෙ තියෙන්නේ මිදුණු අරමුණු ආයෙ බලන්න දෙයක් නෑනෙ. අර **අජ්ජෝසායති තිට්ඨති** කිව්වේ බැස ගත්තනෙ මොකක්හරි එකක් අන්න **"යාරුපේ නන්දි තදුපාදානං භවෝ"** අන්න එතනයි මේකෙ මිදීම තියෙන්නේ. අරමුණ බැස ගත්තොත් විතරයි අපි මෙනෙහි කරන්නේ. නැත්නම් ඉතිං පිස්සු වගේනේ ඔහොම එන එන එක බලන්න ගියොත් කාටවත් කරන්න බෑනෙ.

ඒකට අවබෝධය ඇතිකර ගත්ත නම් හරි.

***උපාසක:*** නෑ අවබෝධය. ඒක මට හොඳටම පැහැදිලියි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** දැන් ඔබතුමාගේ ප්‍රශ්නෙ විසඳුණා. ඔබතුමා දැන් දන්නවා අරමුණුවලින් මිදිලනෙ දැන් වටපිට බලනවා ඇවිදිනවා දැන් මොනවත් දැකලා නෑනෙ මිදිලනෙ. මිදුණු එක ආයෙ මිදෙන්න දෙයක් නෑනෙ. දැන් ඔන්න මොකක්හරි එකක් හොඳට වදිනවා ඔළුවට, වැදුණම ඔන්න ඒක නිසා මොකක්හරි කම්පාවක් හරි එනවා. අන්න එතකොට ධර්මය මෙනෙහි වෙනවා. එච්චරයි වෙන්නේ.

***උපාසක:*** දැන් මට පැහැදිලියි.

**ආර්යයන් වහන්සේ:** නැත්නම් ප්‍රායෝගික නෑනේ.

***උපාසක:*** ඒක තමයි මට ඒක අපහසුයි. අර විදිහට බලන කොට මට ඒක අපහසුයි. ඒක ප්‍රැක්ටිකලිත් හරි අමාරු එකක්.

**ආර්යයන් වහන්සේ:** දැන් හරි. දැන් ඔබතුමා තේරුම් ගත්තා. ප්‍රැක්ටිකලි ඇත්තටම මේක අර බැස ගන්න අරමුණ දැකලා ඒක තමයි විසඳෙන්නේ. දැන් ඔබතුමාට ප්‍රශ්නයක් එනකොට ඕක කියන්න ඕන නෑ. ධර්මය දැනගත්තට පස්සේ ඔබතුමාට ස්වයංබු එනවා අභ්‍යන්තරයෙන් මෙතන දෙයක් නෑ. මේක තේරුමක් නෑ මේ මගෙ හිතේනෙ තියෙන්නේ. මම දන්න හින්දනෙ දන්නැත්තන් ප්‍රශ්නයක් නෑනෙ. දෙමළෙන් බැන්නත් ප්‍රශ්නයක් නෑනෙ. ඔය වගේ මතක් වෙනවා මේ දහම.

**උපාසකඃ** එහෙම වෙනවා. එහෙම වෙනවා. දැන් නිතර

**ආර්යයන් වහන්සේඃ** ඔබතුමා ඇත්තටම අපට කෝල් කරන්නේ නෑ. ඔබතුමාට හේතු තියෙනවනෙ මේ සත්‍ය අවබෝධ වෙන්න. ඒකනෙ කෝල් එක ගන්නේ.

උපාසකඃ එහෙමයි මං කීප සැරයක්ම මේ දවස් ටිකේම උත්සාහ කළා.

**ආර්යයන් වහන්සේඃ** හරියටම නිකන් ජැක්පොට් එකක් අදිනවා වගේ දැන් කෝල් එනවා එනවා. අපි පැය විසි හතරම වගේ ගොඩක් අයට කතා කරනවා. ගොඩක් අයට මෙහෙම කියන්න කෙනෙක් නෑනෙ.

**උපාසකඃ** එහෙමයි අපෝ ඒක හරි. ලොකු දෙයක් ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේඃ** අපිට ඇත්තටම මේ ළඟදි කතා කළා සියදිවි නසා ගන්න යන පිරිමි ළමයෙක්. හැබැයි ඒ ළමයි සියදිවි නසා ගන්නවා. ඒ අපේ දේශනය ඇහුණෙ නැත්නම්. ඒ ළමයා අන්තිමට කිව්වා ආර්යයන් වහන්ස පැවිදි වෙන්න ඕන කියලා. ඔබ වහන්සේ ඉන්න තැන කියන්න එතුමා එච්චරටම කලකිරිලා. මානසිකව වැටිලා. ඇත්තටම එතුමාට පුදුම සතුටක් ඇති වුණා. අපි ඇහුවා ඊට පස්සේ දැන් මොකද තීරණේ කියලා. නෑ ආර්යයන් වහන්ස ආයෙ සියදිවි නසා ගන්න තරමට යන්නේ නෑ කියලා. හොඳටම තේරුණා කියලා. ඉතිං කොච්චර වෙලා ගියත් හොඳයි කියලා අපට ඒ වෙලාවේ හිතුණා. අර රේල් පීල්ලට බෙල්ල තියපු ගැහැනු ළමයා මතක් වුණා. ඒ කතාව මතක් වුණා එතුමාගේ කතාව අහන කොට. දැන් අපිට තේරුණා මේ දරුවත් සියදිවි නසා ගන්නවා. මේ දහමේ පිහිට විතරයි මේ දරුවට තියෙන්නේ කියලා. අද කොයිතරම් ඉන්නවද ඒ විදිහට ජීවිත විනාශ කර ගත්ත අය අපට මේ මාධ්‍යවල දකින්න ලැබෙනවා. දරුවන්ට වෙන දේවල්. ඇත්තටම මේ බෞද්ධයෝ ධර්මයක් නැති අය වෙලා. පිරිහීමක් විශාල පිරිහීමක්.

පොල්තෙල් ටිකක් ගන්නවා, මල් ටිකක් ගන්නවා, හඳුන්කූරු ටිකක් ගන්නවා. ඊට පස්සේ ගිහිල්ලා අරක වටේ කැරකෙනවා. වට හතක් අර ටික තියලා අර සෝත්‍ර ටිකක් කියලා අර පල්ලිය වගේ, කෝවිල වගේ. ඊට පස්සේ ගෙදර එනවා. දැන් මේක බුද්ධාගම. මොකක්ද වෙලා තියෙන්නේ. තාම ඉන්නෙ කොහෙද ගෝත්‍රිකයො වගේ. මේ නිවන කිසිම ආගමක නෑ. මේ ප්‍රත්‍යක්ෂ දෙයක්, මේ අත්දකින දෙයක්, මේ මොහොතෙ සාංදිට්ඨික ධර්මයක් කියන එකක් කොහෙවත් නෑ. දිව්‍ය ලෝකෙ පෙන්නුවයි කියනවා. ඇත්තටම මෙච්චර වටින මාණික්‍යයක් තියාගෙන ඇත්තටම අපේ හාමුදුරුවරු හරි අසරණයි. මොකද මේ සත්‍ය ප්‍රත්‍යක්ෂ නොවීමයි. පොතේ තියෙන වාක්‍ය ටික කියවන්න නෙවෙයිනේ අපි ආවේ. අපිට ඕන මේ දුකින් මිදෙන්න නේද? අපි මේ කන්නේ බොන්නේ ජීවත් වෙන්නේ ඔක්කොම ළමයි හදලා වයසට ගිහින් මැරිලා යන්නද? බුදුන් වහන්සේම දේශනා කරනවා කල්පයක් හිටියත් වැඩක් නෑ මහණෙනි එක මොහොතක් මේ සත්‍ය නොදැන. බුද්ධ වචනය. ඔබතුමාට තව ටිකක් අවදි වෙනකොට දැනෙයි මේ බුද්ධ ස්වභාවය කුමක්ද කියන එක. බුදුන් වහන්සේ ඒක පැහැදිලි කරනවා සත්වයෙක් පුද්ගලයෙක් එතන නැති බව. ඒ ස්වභාවයට අවදි වෙනවා. ඔබතුමා ඉතාම භාග්‍යවන්තයි ඒ අතින් නේද?

***උපාසක:*** ඒක නම් ස්වාමීන් වහන්ස මට වචන වලින් කියන්න බෑ.

**ආර්යයන් වහන්සේ:** ඇත්තටම අපට ලෝකේ වටින්ම විශාල පිබිදීමක් තියෙනවා. අපෙන් අහනවා ඇයි මේ ලංකාවේ අයට මොකද වෙලා තියෙන්නේ. අපේ රටවල්වල මේවයි හොයන්නේ කියලා. මේ තමයි සත්‍ය කියලා අපට වැටහෙනවා කියලා. නමුත් ලංකාවේ තවම මුල් පූජා කර කර නේද ඉන්නේ කියලා.

***උපාසක:*** ඒක හරි. ඔබ වහන්සේ වගේ ඒක අවබෝධ වෙච්ච ස්වාමීන් වහන්සේලා ඉන්නේ ඉතාම අල්ප ප්‍රමාණයයි.

**ආර්යයන් වහන්සේ:** ඒක තමයි ලොකුම හේතුව. සත්‍ය භාර ගන්න කෙනෙක් නැතිකම.

**උපාසක:** දැන් මම මගේ ගෙවල් ළඟ පන්සලට යනවා ස්වාමීන් වහන්සේලාත් එක්ක හොඳට ආශ්‍රය කරනවා. නමුත් මං දන්නවා ඒ ස්වාමීන් වහන්සේ ගොඩක් හොඳයි. නමුත් මේ අවබෝධය නෑ.

**ආර්යයන් වහන්සේ:** මාධ්‍ය ආයතනවලටවත් මේ සත්‍ය තාම ඇහිලා නෑනෙ. තාම තේරිලා නෑ.

**උපාසක:** ඒක මට හිතා ගන්න බෑ ස්වාමීන් වහන්ස, මොන හේතුවක් හින්දද දන්නෙ නෑ අවබෝධ වෙන්නේ නැත්තේ, ඒක හරි පුදුම එකක් ඒ අවබෝධ කෑල්ල ඒ තැන. දැන් මට වුණාත් ඒ තැන එකපාරටම අහුවුණේ. මාත් සාමාන්‍ය විදිහට තමයි හිටියේ ස්වාමීන් වහන්ස සාමාන්‍ය බණ අහ අහා. මට ඔය පොඩි කෑල්ල එකපාරටම ඔළුවට ගියේ ඒක ගිය ගමන් ආයෙ ඒ ඔක්කොම වෙනස් වුණා. එකපාරටම අනිත් පැත්ත ගැහුවා වගේ එකක් වුණේ.

**ආර්යයන් වහන්සේ:** ආශ්චර්යයක් බලන කොට.

**උපාසක:** ඒක තමයි. මං හිතන්නේ අපේ දැන් තියෙන ඒවත් එක්ක වැහෙනවා ඒ ටික. අපේ ඔළුවට යන්නේ වෙන ටිකක් නේ. අපේ ස්වාමීන් වහන්සේලාටත් මං හිතන්නේ ඕක තමයි වෙලා තියෙන්නේ.

**ආර්යයන් වහන්සේ:** පොත්වල තියෙන ඒවා කියවන කොට ඒවා දෘෂ්ටි විදිහට හිරවෙනවා ඒ වගේ ඒවගෙ හිර වුණාම අර සත්‍ය නිදහසේ පේන්නේ නෑ. එතනින් තමයි මං හිතන්නේ ගොඩක් අය මේ දෘෂ්ටිවල ගැට ගැහිලා තියෙන්නේ. අපිට ඒක පේන්නේ නෑ.

**උපාසක:** දැන් මම දන්න ස්වාමීන් වහන්සේලා ගොඩාක් ත්‍රිපිටකය හොඳට දන්නවා. නමුත් මේ කෑල්ල දන්නෙ නෑ. මං සමහරවිට කතා කරනවා, මගෙ යහළුවොත් ඉන්නවා හොඳට වෛද්‍යවරු ඉන්නවා හොඳට ධර්මය දන්නවා. මම ඇත්තටම ධර්මය එච්චර දන්නේ නෑ ඇත්තටම, මං හිතන්නේ ධර්මය දන්නේ නැති නිසයි මට මේක ඉක්මනට අවබෝධ වුණේ.

**ආර්යයන් වහන්සේ:** දැන් හැබැයි ඔබතුමා නවත්වන්න බෑ කාටවත්. ඔබතුමා ධර්මය කියන කොට මේකයි මේකයි කියලා.

**උපාසක:** ඔව් මේ පොඩි කෑල්ලයි තියෙන්නේ. අරව මොනවත් ඕනෙ නෑ. කිසිම දෙයක් අවශ්‍ය නෑ.

**ආර්යයන් වහන්සේ:** දෙයක් නැති බව තියෙන්නේ. දැනගන්නවද නැද්ද කියන තැන තියෙන්නේ. දෙයක් ඇති තැන මෙලොව දෙයක් නැති තැන මෙලොව නෑ එලොව. ලෝක සංඥා තියෙනවද නැද්ද කියන එක එතනයි තියෙන්නේ.

**උපාසක:** මං ඇත්තටම ඔය යාළුවොත් එක්ක කතා කරන කොට ඔය කෑල්ල කියනවා. ඒක කිව්වම ඒගොල්ලො හිතන්නේ මං මේක වෙන විදිහකට වැරදිලා කියලා හිතන්නේ. ඔව් මට වැරදිලා කියලා හිතන්නේ. මං කිව්ව මේ ඔයාට තේරෙන්නෙ නැද්ද මේ එළියේ දකින එක නෙවෙයි මැවෙන්නේ. වෙන එකක් මැවෙන හින්දයි මේ ප්‍රශ්නේ කියලා. කිව්වට තේරෙන්නේ නෑ. ඒක තියෙන විදිහටම අරගෙන තමයි ගන්නේ. ඒ කියන්නේ මලක් තියෙනවා කියලා ගන්නවා අරගෙන ඒක පරවෙන එක තමයි අනිත්‍ය කියලා ගන්නේ. එතන මලක් නෑ මලක් නැති එක දකින්න. කෙළින්ම ආයෙ පරවෙන්න ඕන නෑ. මල නැති එක දැක්කම කෙළින්ම එතනින්ම ඉවරයි.

**ආර්යයන් වහන්සේ:** හරි ඔබතුමා කියලා තියෙනවා හරි. අපි ඕක තමයි ස්කන්ධ දුක්ඛා කියන්නේ. ස්කන්ධය කියන්නේ ස්කන්ධ දුක්ඛා කියන්නේ දෙයක් නැති බව. මල කියල දෙයක් නෑ.

**උපාසක:** මලක් නැතුව කොහෙද මලේ අනිත්‍යයක් දකින්නේ?

**ආර්යයන් වහන්සේ:** ගොඩකට පැටලෙන තැන තමයි. මේ මලක් පේන්නේ, පේනව තමයි මල කියලත් දන්නව, ඒ වුණාට ඒකෙ දෙයක් නෑ කියන එක තේරෙන්නෙ නෑ.

**උපාසක:** අන්න ඒකයි වැඩේ. එතන තේරෙන්නේ නෑ. ඒගොල්ලන් මල තියෙනවයි කියලා අරගෙන මල පරවෙන එක තමයි අනිත්‍ය කියලා ගන්නේ. මං කිව්වා මල පරවෙන එක නෙවෙයි මල නෑ. මල නැතුව කොහෙද පරවෙන්නේ?

**ආර්යයන් වහන්සේ:** ඒ නිසා තමයි මහා ආන්දෝලනයක් වෙනවා. දැන් අපි ඇත්තටම ප්‍රසිද්ධියේ මේ දේවල් හෙළි කරන්න අපට සිද්ධ වෙන්නේ ඔය නිසා තමයි අපට කරන්න දෙයක් නෑ. අපට සත්‍ය හෙළි කරන්න වෙනවා. මොකද එක් කෙනෙක් හරි ගන්නෙ මේ සත්‍ය හෙළි කරොත් නෙ.

මේක ලේසි නෑ අභියෝගයක් අර ගඟ ගලනව වගේ සේරම යන්නේ ගඟ ගලන අතට. අපිට සිද්ධ වෙනවා උඩුගම් බලා පීනන්න.

**උපාසක:** අපි ළඟ ඉන්න අය හරි කොහොමහරි ඒකට, දැන් මම වයිෆ්ට කියලා දැන් එයාටත් ඒක තේරෙනවා ටිකක්, නමුත් එයත් අර මල තියෙන විදිහට තමයි, හැමෝම හිතන්නේ. මමත් ඇත්තටම ඉස්සර එහෙම තමයි ස්වාමීන් වහන්ස මල තියෙන විදිහට තමයි මාත් හිටියේ. නමුත් තේරිච්ච ගමන් මොන මලද?

**ආර්යයන් වහන්සේ:** වෛද්‍යතුමනි, මොන හොස්පිට්ල් එකේද?

**උපාසක:** මම ඉන්නේ කැන්සර් හොස්පිට්ල් එකේ.

**ආර්යයන් වහන්සේ:** රෝගීන් ඉන්න විදිහටත් තේරෙනවා නේද ගොඩක්.

**උපාසක:** ඔව් ඒකත් යම්කිසි බලපෑමක් තියෙනවා. නමුත් ඊට වඩා මං හිතනවා කෙළින්ම අර අවබෝධයෙන්.

**ආර්යයන් වහන්සේ:** ඒක හරි. ඔබතුමාගේ තිබ්ලා තියෙනවා මහා ප්‍රඥාවක් ඇතුළාන්තයෙන්, ඒක දකින්න. නැත්නම් ඕක දකින එක ලේසි නෑ. ඕක කියලවත් දෙන්න බැරි දෙයක් කොහොමද ඒක දකින්නේ කියලා.

**උපාසකː** දෙන්න බෑ. අන්න ඒකයි. මේක කියන්න බෑනෙ. ස්වාමීන් වහන්ස. මේක විස්තර කරලා කාටවත් ඒකයි වැඩේ. ඒක ඇතුළෙන්ම එයාට එන්න ඕන ඒ පුද්ගලයට. මේක අර ලුණු රස වගේ තමයි. කටේ කොච්චර ලුණු කෑවත් ලුණු රස කියන්න බෑ වගේ.

**ආර්යයන් වහන්සේː** ඔබතුමාට මේ දේශනා හම්බ වුණේ කොහොමද?

**උපාසකː** ඇත්තටම මට මේක එව්වේ මගේ නංගි. නංගි ඉන්නේ ඕස්ට්‍රේලියාවේ.

**ආර්යයන් වහන්සේː** බලන්න ඕස්ට්‍රේලියාවෙන් ලංකාවට එවල තියෙන්නේ.

**උපාසකː** ඔව්. ඒ වුණාට මම මේ අදහස තියෙන දේශනා කරන වෙන ස්වාමීන් වහන්සේලා දෙන්නෙක් වගේ තමයි ඇත්තටම මට ඒක දැනුණේ.

**ආර්යයන් වහන්සේː** අපිත් අහලා තියෙන්නේ දෙන්නෙක් වගේ තමයි.

**උපාසකː** එක් කෙනෙක් මම ඕන නම් කියන්නම් නම.

**ආර්යයන් වහන්සේː** දන්නව, දන්නව, උන් වහන්සේලා තාම අර ප්‍රතිපදාව තාම අර ප්‍රත්‍යක්ෂ පැත්තෙන් තාම නෑ. නමුත් අර යම් මට්ටමකට පැහැදිලි කරනව. ඒක අපි බැලුවා.

බොහොම හොඳයි. ඒ කියන්නේ අනිත් අයත් එහෙම කරනවා නම් කොච්චර වටිනවාද කියලා. වැඩිය ඕන නෑ විද්‍යුත් මාධ්‍යයක, දැන් එය රිලැක්ස් නාලිකාවෙ එහෙම දැන් යනවා ප්‍රඥාලෝක හාමුදුරුවන්ට පොඩ්ඩක් තේරිලා තියෙනව මේ සත්‍යයයි කියලා, ප්‍රඥාලෝක හාමුදුරුවෝ ගොඩක් උත්සාහ ගන්නව දාන්න ප්‍රඥා නාලිකාවේ.

**උපාසකː** ප්‍රඥා නාලිකාවෙන් තමයි මම මේ මුලින්ම මේ මාර්ග හරි බණ ඇහුණොත් ඇත්තම කිව්වොත්.

**ආර්යයන් වහන්සේ:** උන්වහන්සේ උත්සාහ කරනව. උන්වහන්සේ දන්නවා අපේ මේ හෙළි කිරීම ලේසි නෑ කියලා. පුදුමාකාර ආන්දෝලනයක් ඇති කරනව කියලා.

**උපාසක:** දැන් ඒ වගේ නාලිකා තමයි මේක තේරෙන්නේ නැති අයට අනිවාර්යයෙන්ම දෙන්න ඕන. නමුත් දුන්නොත් ඔබ වහන්සේ කියනව වගේ මිනිස්සු එකපාරටම අනිත් පැත්තනෙ හිතාගෙන ඉන්නේ.

**ආර්යයන් වහන්සේ:** දරා ගන්න බැරි වෙනවා.

**උපාසක:** ස්වාමීන් වහන්සේලාගෙනුත් ඒක එන්න පුළුවන්.

**ආර්යයන් වහන්සේ:** ස්වාමීන් වහන්සේලාගෙන් තමයි මේක එන්නේ. ඔව් උන්වහන්සේලා තමයි දෘෂ්ටියේ ඉන්නේ ගොඩක්. උන්වහන්සේලා හිතාගෙන ඉන්නේ උන් වහන්සේලා සම්මා දිට්ඨියේ ඉන්නව කියලා. උන් වහන්සේලා මිථ්‍යා දෘෂ්ටියේ කියලත් උන්වහන්සේලා දන්නේ නෑ. දන්නැතිකම දන්නෑ කියන එක තමයි ඕකෙ තියෙන්නේ.

ඒක හරි අමාරුයි කෙනෙකුට තේරුම් කරන්න. නොදන්නකම, කොහොමද නොදන්න බව තේරුම් කරන්නේ. අමාරුම විග්‍රහයක් ඒක. නොදන්නකම නොදන්න බව තේරුම් කරන්නේ කොහොමද? දන්න බව හිතාගෙන ඉන්න එකම නොදන්නකම කියලා. හොඳමයි වෛද්‍යතුමනි එහෙනම්.

**උපාසක:** එහෙමයි ස්වාමීන් වහන්ස. බොහොම පින්සිද්ධ වෙනවා ඔබ වහන්සේට බොහොම ස්තුතිවන්ත වෙනවා. ඔබ වහන්සේට මොනවහරි අවශ්‍යතාවක් තියෙනවා නම් මට එහෙම උදව් කරන්නත් පුළුවන්.

**ආර්යයන් වහන්සේ:** දැනට අපේ අර කටයුතු වගයක් කෙරෙනවා. ඔබතුමාට අපි වෙනමම කතා කරන්නම්. මොකද අපි එහෙම මුකුත් අරගෙන නෑ රුපියලක්වත්. මේ වෙනුවෙන්ම සමාජගත වෙන්න යම් කටයුතු වගයක් කරනවා. පසුව එකතු වෙලා ඒකට සහයෝගය ඒ අයට දුන්න නම් හරි.

**ආර්යයන් වහන්සේ:** අනිවාර්යයෙන්ම මම සහයෝගය දෙනවා.

**උපාසක:** ඔබ වහන්සේට බොහොම පින් සිද්ධ වෙනවා. තෙරුවන් සරණයි ස්වාමීන් වහන්ස.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මුද්‍රණය කරන එම ධර්ම ග්‍රන්ථ සඳහා ඔබටත් දායක විය හැක.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය

ගිණුම් අංක : 106161005988

බැංකුව : සම්පත් බැංකුව

ශාඛාව : බත්තරමුල්ල

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මගින් මෙතෙක් මුද්‍රණය කර ඇති ග්‍රන්ථ පහත සඳහන් වේ.

1. සතිය කියන්නේ අපේ ගෙදර
2. මට මම නැතිවන හැටි
3. මොහොතට අවධිය (පළමු කොටස)
4. බුද්ධ දර්ශනය
5. නිවැරදි නිවන් මඟ හමුවිය
6. මොහොතට අවධිය (දෙවන කොටස)